# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 අප්‍රේල් 20 වන බදාදා
දෙවන කාණ්ඩය විසිවන කලාපය
මිල රු. 50 යි

ධරණී
ශ්‍රී ලංකාවේ
අංක එකේ
කාන්තා
පුවත්පත



නෝනලාගෙ
දොළදුක් ගැන
මහත්වරුන්ට
අනතුරු ඇඟවීමක්

කලාවට උපන්ගෙයි
හපන්කම් තිබිලත්
කලා ලෝකේ
නමක් හදාගන්න
බැරි ඇයි?

දරුවෝ ප්‍රශ්න අහද්දී
රෝස කැලෙන්
එළියට ඇවිත්
උත්තර දෙන්නෙ
කොහොමද?

හිරුණිකා,
ඥානා අක්කා බලන්න
ගියේ ඇයි කියලා
මම දන්නේ නෑ

- මන්ත්‍රිනී ඩයනා ගමගේ

ප්‍රභාකරන් මල දවසේ
කිරිබත් කෑ
කොටි සාමාජිකයින් ගැන
කපිතාන් ජයනි
කියන කතාව

පශුවෛද්‍යතුමෙකුට
සලකන්න
අලියෙක් එතුමව
ගෙදර එක්ක ගිහිල්ලා

මාධ්‍යවේදිනී, නීතීඥ
තිළිණි පෙරේරා

■ ඡායාරූපය -
සමන් අබේසිරිවර්ධන



# බටහිර පන්නෙට හැඩවුණු මනාලියක්

තමන්ගේ මංගල දිනයේ වෙනස්ම ආකාරයකට, ලස්සනට, සුන්දරව හැඩවෙන්න ඕනෑම යුවතියක් කැමතියි. ඒ නිසාම මේ කාලයේ බොහෝ මනාලියන් මංගල දිනයද බටහිර පන්නයට සැරසෙන්න වැඩි කැමැත්තක් දක්වනවා. අද 'ධරණී මනාලිය' තුළින් අපි ඔබට සමීප කරන්නේ එලෙස බටහිර පන්නයට හැඩවුණු සුන්දර මනාලියක්.

මේ මනාලියගේ ඇඳුම් නිර්මාණය, හැඩගැන්වීම සියල්ල කරලා තියෙන්නේ 221/1/1 හයිලෙවල් පාර, නුගේගොඩහි පිහිටි 'Thushara Thilina Bridals' හි තුෂාර විසින්.

**"මම මෙතැනදී මනාලියගේ පැහැය, උස වගේම ඇයගේ සිරුරේ හැඩය ගැන හිතලා තමා මේ ආකාරයේ බටහිර පන්නයේ ගවුමක් නිර්මාණය කළේ. ඇය සැබවින්ම පැහැපත් යුවතියක් නිසා සුදු වර්ණයෙන් යුතු ලේස් මැටිරියල් එකක් යොදාගත්තේ. ඒ එක්කම කර වට ලස්සන කරගැනීම සඳහා හෑන්ඩ් වර්ක් එකක් යොදාගත්තා.**

**මේකප් එක ගැන කතා කරනවානම් ස්වභාවික ලස්සන වඩාත් ඉස්මතු වන ආකාරයට නැචුරල් මේකප් එකක් තමයි භාවිතා කළේ. ගවුම සුදු පැහැය නිසා අයි මේකප් එකට අයිවරි ටච් එකක් යොදාගත්තා. ඒ එක්කම පින්ක් කලර් එකක් තමා ලිප්වලට භාවිතා කළේ.**

**මෙතැනදී මම වේල් එකක් භාවිතා කරලා නැහැ. වෙනසක් කරන්නත් එක්ක භාවිතා කරේ ක්‍රවුන් එකක්. මේ ක්‍රවුන් එකත් නිර්මාණය කළේ මමමයි. ක්‍රවුන් එකක් භාවිතා කළ නිසා ලොකුවට ආභරණ භාවිතා කරලා නැහැ. කරාබු දෙකක් පමණයි ඇයට යොදාගත්තේ.**

**කොණ්ඩා මෝස්තරය නම් ඉතාම සරලයි. එය මනාලියගේ මුහුණේ හැඩය එක්ක වෙනස් කරගන්නට පුළුවන්. මේ මනාලියගේ තියෙන ස්වභාවික ලස්සන ඉස්මතු වෙන්න තමා මම මෙතනදී ඇයට කොණ්ඩා මෝස්තරය යොදාගත්තේ.**

**මල් කළඹ ගැන කියනවා නම් කොළ පැහැය වැඩි කරලා සුදු රෝස භාවිතා කරලා ස්වභාවිකව දිස්වෙන විදියට කෘත්‍රිමව සකස් කරගත්ත මල් කලඹක් තමයි යොදාගෙන තියෙන්නේ.**

**ඒවගේම Studio 4U හි සංජීවත් මතක් කරන්න ඕනේ. ඔහු තමා මේ ලස්සන ඡායාරූපගත කළේ.**

**මම මේ මනාලියව හැඩගැන්වීම කළේ ෆොටෝ ශූට් එකකට. මේ සඳහා ඉතාමත් හොඳ ප්‍රතිචාර ලැබුණා. බොහෝදෙනෙක් කැමති වුණා ඒ අයගේ මංගල දිනයේත් මේ ආකාරයෙන් හැඩ වෙන්න. මෙය වඩාත් ගැලපෙන්නේ හැඩති සිරුරක් තියෙන උස යුවතියකට."**










මනාලිය හැඩගැන්වීම -
රූපලාවන්‍ය ශිල්පී
**තුෂාර තිලිණ**
Thushara Thilina Bridals

ඡායාරූප -
**STUDIO 4U**

සම්බන්ධීකරණය -
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**
0763113839





# අරගලේ වගේද මේ ආදරේ

අරගල බිමක රත්වුණු ලේ වාගේම, කකියන ආදරයද තිබීම එක් අතකට අරුමයකි. නමුත් මේ හදිසියේ පිබිදුනු අරගලබිම තුළ ඒ අරුමය අඩුවක් නැතුව තිබෙනයුරු අපි දුටුවෙමු. දිනාගැනීමට ඇති අරමුණු අතරේ ජාති, ආගම්, ලොකු කුඩා භේද නැතිව ඒ ආදරය මනරම් දියදහරක් සේ ගලායන අපූරුවද අපි දුටුවෙමු.

මුබස්සිරා අස්වර් හෙවත් මුබා කොළඹ විශ්වවිද්‍යාල සිසුවියකි. මුබා ඇතුළු සරසවි සිසු සිසුවියන් ආණ්ඩුවට විරෝධය පෑමට එක්වුණේ ගිනිගහන මධ්‍යහනකයි. අරගලබිම සටන් පාඨවලින් උණුසම් වෙද්දී, සැඩ හිරුද ඊටම එක්ව ඒ බිම උණුසුම් කරන්නට පටන්ගෙන තිබුණි. තම විශ්වවිද්‍යාලයේම ඉගෙනගන්නා සුබෝධ පොඩි හාමුදුරුවෝද මේ අරගලකරුවන් අතර සිටියහ. මුබා තම අතවූ ෆයිල් කවරයකින් සුබෝධ හිමියන් අව්වෙන් ආවරණය කරගැනීමට සිතුවාය. එම දසුන මුහුණුපොතේ සැරිසරන්නට වූයේ **"මේ තමයි සංහිඳියාව, විය යුතු දේ වෙමින් පවතී"** යන වදන් පෙළද ඉස්මතු කරමිනි. මුබාගේ ක්‍රියාව ඇයගේ යහළු යෙහෙළියන් වාගේම, මේ මොහොතේ එකමුතුකමින් එක් අරමුණකට රොක්වී සිටින සියල්ලන්ගේම පැසසුමට ලක්වීම විශේෂයකි.

මුබා ඒ ගැන කියන්නේ මෙසේය.

**"ඇත්තටම කැම්පස් එක ඇතුළෙදි මම දකින දෙයක් තමයි, භික්ෂූන් වහන්සේලාටත් උන් වහන්සේලා අඳින සිවුරටත් තිබෙන ගෞරවය. ඒ වෙලාවේ ඒ ගෞරවය ඒ හිමිනමට ලබාදෙන්න ඕන කියලා මට හිතුණා. මං මේ වෙලාවේ මාත් එක්ක කැම්පස් එකේ ඉගෙනගන්න සහෝදර සහෝදරියන්ට ස්තුතිවන්ත වෙනවා ඒක හොඳ ගතිගුණයක් කියලා පෙන්වලා දුන්නට."**

ඇය ඒ මොහොතේ හිතට ආ සිතිවිල්ලක් අනුව කටයුතු කළද ඇයගේ එම ගරුත්වය හදවතින්ම නැගෙන්නකි.
මුබා දුන් පණිවුඩය කොතරම් ලස්සනදැයි ගෝල්ෆේස් හි අරගලබිමෙන්ද ඒ හා සමානවම පෙනුණි. භික්ෂූන් වහන්සේලා, පියතුමන්ලා මෙන්ම මව්ලවිතුමන්ලාද සුහද පිළිසඳරවල යෙදෙනු පෙනුණි. ඒ වාගේම මේ ගෙවෙන්නේ මුස්ලිම් ජනතාවගේ නෝම්බි උපවාස කාලයයි. මෙදා අරගලයට සහාය දෙන්නට පැමිණි ඔවුන්ගෙන් කොටසක් සිටියේ උපවාසබිමේය. ඔවුන් උපවාස අතහරින්නට ආගම කියද්දී, මහ වැසි කඩා වැටෙන්නට වූයෙන් ඔවුනට කුඩ අල්ලාගෙන සිටියේ සිංහල කොල්ලන්ය. මේ ළෙංගතුකම, ආදරය රට පුරා එකම අයුරින් ගලායාම අලුත් සමාජ පරිච්ඡේදයක ආරම්භය යයි බොහෝදෙනා හඳුන්වා තිබුණි.

ඒ වාගේම මලක මෙළෙක පිළිබඳව අමුතුවෙන් කිව යුතු නොවේ. උණ්ඩයකට හිතක් සිදුරුකළ හැකි වුවත් මලකට ආදරයේ, දයාවේ, කරුණාවේ පාලමක් තනන්නට හැකිය.

කලකට ඉහතදී ඇමරිකාව විසින් වියට්නාමයට පහර දෙද්දී, පෙන්ටගනයට රැස්වූ ස්වදේශිකයින් ඊට විරෝධය පෑ බව සඳහන්ය. 1967 ඔක්තෝබර් 21දා ඇමරිකානු ඡායාරූප ශිල්පී බර්නි බොස්ටන් විසින් ගත් අපූර්ව ඡායාරූපයක්





**'වොෂින්ටර් ස්ටාර්'** පුවත්පතේ පළවී තිබුණේ **'ෆ්ලවර්'** ලෙස නම් කරමිනි. එහිදී ජෝර්ජ් හැරිස් නම් විරෝධතාකරුවෙකු විසින් සෙබළෙකු අත තිබූ රයිෆලයේ බැරලයට කානේෂන් මලක් තැබීය. ඒ පෙන්ටගනයේ පඩිපෙළ අසලදී විරෝධතාකරුවන්ව නතර කරන්නට සොල්දාදුවන් උත්සාහ කළ මොහොතේයි. අනතුරුව රැස්ව සිටි සෙසු විරෝධතාකරුවෝද සෙසු සොල්දාදුවන් අතවූ රයිෆල්වලටද කානේෂන් මල බැගින් තැබීය. එය කළේ ගැටුමට වඩා සාමය වටිනා බව කියන්නටය.

ඒ කතාව තරමක් වෙනස් වුවත් මෙවර අරගල භූමියේදීද එවන් දසුනක් දැකගත හැකි විය. මාර්ග බාධක, කඳුළු ගෑස්, ජල ප්‍රහාරක රථ පාර්ලිමේන්තු පිවිසුම් මාර්ගය අසළ පැවති ජන විරෝධයේදීද දැකගන්නට ලැබුණි. පොලිස් නිලධාරීන් මාර්ග බාධක වැටට එහා පසින් සිටියදී, මෙහා පසින් ඇවිද ආවේ රෝස මලක් අතින්ගත් සුන්දර යුවතියකි.

## වෛද්‍ය ශිෂ්‍යාවකගෙන් පොලිස් නිලධාරියෙකුට රෝස මලක්

**"ඔයාලගේ අයියලා, අක්කලා, නංගිලා, මල්ලිලා ගෙවල්වල ඉන්නවනේ. ඒ අයටත් අපිට වගේම මේ ප්‍රශ්නය දැනෙනවා ඇති. මේ රෝස මල එයාලා වෙනුවෙන් අරගන්න."**

කසුන්සලා කියද්දී එහි සිටි පොලිස් නිලධාරියෙක් එම රෝස මල අතට ගත්තේ, වදනක් හෝ නොකියා නමුත් එම ක්‍රියාව තුළ නොකියූ කියාගත නොහැකි වදන් දහසක් තියෙන්නට ඇත. මලක් දීම පුංචි දෙයක් සේ කෙනෙකුට සිතුණත් ඒ තුළින් දුන් පණිවුඩය පුංචි නැත. රාගම වෛද්‍ය පීඨයේ සිසුවියක වන කසුන්සලා, කවිකාරියක බවද සඳහන්ය. අරගලබිමේ කවිකාරිකගේ සුන්දර **'අවිය'** රෝස මලක් වීම ඉතින් අරුමයක් නම් නොවේ.

නීතිය සාමය රකින පොලිසියේ, හමුදාවේ නිල දරුවන්ට මේ මොහොතේ තම හෘදසාක්ෂියේ කතාව සඟවාගෙන හිඳින්නට සිදුව ඇති බව නොරහසකි. ඒ නිසා මෙදා ඔවුන් හා අරගලකරුවන් දෙපිලක්ව බෙදී ඇත. එහෙත් ඒ දෙපිලේද ආදරය උතුරා යන අවස්ථා එමටය. කඳුළු ගෑස් වැදුනු තරුණයෙකුට මුහුණ සෝදන්නට වතුර බෝතලයකින් වතුර දෝතක් දෙන්නේ පොලිස් නිලධාරියෙකි.

**"අපිව මුර කරලා මහත්තයලටත් මහන්සි ඇතිනේ. බොමුද සීතල වතුර බෝතලයක්?"**

වතුර බෝතලයක් පොලිස් නිලධාරියෙකු වෙත පාමින් තරුණයෙකු කියද්දී, ඒ ඇස්වල ඇඳෙන කතාව පැහැදිලිය. පොලිසියේ, හමුදාවේ නිල දරුවන් රාජකාරිය අකුරටම ඉටු කළත්, මේ ලැබෙන ආදරය පසෙක දමන්නේ නැත.

එදා සිඟිති දරුවෙකු වඩාගෙන මිරිහානට පැමිණි අම්මා කී කතාව සංවේදීය. ඇය මහ රෑ ඒ තම ආදරය කරපින්නාගෙන පැමිණයේ රටට කියන්නට දෙයක් තිබූ නිසාය.

එම අරගලය අල්ලාගෙන දිවා රෑ වෙහෙසෙන මිනිසුන් අතරේ **'ධරණී'** මෙම සටහන තබන්නේ, අරගලය මැද හමුවන **'ආදරය'** අනෙක් සියලු ඉල්ලීම් සහ දිනාගැනීම් වලට වඩා උත්තරීතර බව කියන්නටය.






පොලිස් නිලධාරීන්ට අරගලකරුවන්ගෙන් වතුර බෝතල්, කඳුළු ගෑස් වැදුණු තරුණයින්ට පොලිසියෙන් වතුර



දීපා වසන්ති එදිරිසිංහ

# මහත්තයා මරණ නෝනලාට දොළදුක්

දවසක් මගේ ශිෂ්‍යාවකගේ අම්මා කෙනෙක් මගේ ළඟට අඬාගෙන ඇවිත් කිව්වා 'අනේ මහත්තයෝ මගේ දුව මාව දකින දකින තැන ගහලා මරාගෙන කන්න හදනවා' කියලා. පස්සේ මම මේ අම්මත් එක්ක දිගින් දිගටම කතා කරද්දි තමයි දැනගත්තේ මේ අම්මා ගර්භිනී කාලේ දොළදුකට කියලා මහත්තයව කැලේට යවලා සතෙක් මරවලා උන්දෑ ලවාම උයාගෙන කාලා කියලා



විහාරමහාදේවිය පළමු වරට ගැබ්බර වෙද්දි එතුමියට දෙළදුක් තුනක් තිබී ඇත. ඉන් පළමුවැන්න රියන් 60ක් උස විශාල මී වදයක් දෙළොස් දහසක් වූ මහා සංඝයාට පූජා කර ඉතිරිය තමන්ම අනුභව කිරීමයි. දෙවැන්න එළාර රජුගේ ප්‍රධාන යෝධයා වූ නන්දසාරථීගේ ගෙල සිඳ එම කඩුව සේදූ වතුර ඔහුගේම හිස මත වාඩි වී පානය කිරීමයි.

තෙවැන්න අනුරාධපුර නෙළුම් කෙතෙන් නෙලාගත් නෙළුම් මල්වලින් සැදූ අලංකාර මල් දමක් ගෙල පැළඳීමයි.

කාවන්තිස්ස රජු නිමිතිකරුවන් ගෙන්වා දේවියගේ මෙම දෙළදුක්වලට හේතු විමසූ පසු දැනගන්නට ලැබී ඇත්තේ මේවා නිසි ආකාරව සන්සිඳවුවහොත් උපදින පුත්‍රයා රට එක්සේසත් කර, සම්බුද්ධ ශාසනය බබළවන බවයි. මේ අසා ප්‍රීතියට පත්වූ රජු දේවියගේ සියලු දෙළදුක් සංසිඳ වූ පසු පිරුණු මනදෙලින් යුතුව විහාරමහාදේවිය ගාමිණී අභය කුමරුන්ට ජන්මය දී ඇත.

ඉන් ටික කලකට පසු විහාරමහාදේවිය දෙවන වරටද ගැබ්බර විය. ඒ අවස්ථාවේ හොඳින් මල් පිපී ඇති සපු ගසක් යට වැතිරී මල් සුවඳ විඳීමේ දෙළදුකක් ඇයට ඇතිවිය. මුල් වතාවේ මෙන්ම දෙවැනි වතාවේද මේ ගැන නිමිතිකරුවන්ගෙන් විමසූ විට ඔවුන් කීවේ එම දෙළදුකට අනුව උපදින පුත් කුමරා ගොවිතැනින් රට සශ්‍රීක කරවන නිවුන ගති ඇත්තෙකු බවයි. ඉන්පසු කාලයාගේ අවෑමෙන් විහාරමහාදේවිය තිස්ස කුමරුන්ටද ජන්මය දුන්නාය. කෙසේ නමුත් පසුකලෙක නිමිතිකරුවන් කී පරිදිම දුටුගැමුණු නමින් රජවුණු ගාමිණී අභය කුමරුන් එළාර පරාජය කර සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කටයුතු කළේය. එසේම තිස්ස කුමරුන් ගොවිකමට උපන් හපන්කම් ඇත්තෙකු බවටද පත්විය.

එකල අම්මලාගේ දෙළදුක් එහෙම වුණත් මෙකල අම්මලාගේ දෙළදුක් ඊට හාත්පසින්ම වෙනස්ය. ඇතැමුන්ගේ දෙළදුක පිටරට සවාරි යන්නටය. තවත් අයට කොස්, පොළොස්, අඹ, ඇඹරැල්ලා වෙනුවට හැම්, බේකන්, චීස්, පුඩින්වල රහ බැලීමේ දෙළදුකද නැතුවාම නොවේ. එසේ නම් එද නිමිතිකරුවන්ගේ අනාවැකි අදට හරියන්නේ නැතිද? එමෙන්ම ගැබිනි මවකට ඇතිවන දෙළදුක් අනාවාර්යයෙන්ම සංසිඳවිය යුතුද? පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය අත්තනායක එම්.හේරත් මහතාගේ මේ පැහැදිලි කිරීම ඒ ගැනය.

"ඇත්තටම දෙළදුක් කියලා මතුපිටට ඉස්මතුවෙන්නේ ගැබ් ගන්න කලින් කාන්තාවකට තමන්ගේ සැමියා විසින් ඉෂ්ඨ කරලා නොදුන්නු ආසාවල්. දරුවෙක් ලැබෙන්න ඉන්න ගැබිනි මවකගේ ඉල්ලීමක්, ආසාවක් පැහැර නොහරින චාරිත්‍රයක් අපේ රටේ තියෙන නිසා ඔවුන් ගැබිනි කාලයේදී ඒ ආසාවල් ඉෂ්ඨ කරගන්න උත්සාහ දරනවා. 'දෙළ' කියන්නේ ආශාව කියන එකටනේ. අන්න ඒ වගේ දෙළක් ඉෂ්ඨ නොවීම නිසා යටිහිතේ තැන්පත් වෙලා තියෙන දුකකට තමයි දෙළදුක කියන්නේ. එහෙම නැතුව ගොඩක් අය කියන විදියට කුසේ ඉන්න දරුවගේ කර්ම ශක්තීන්වල හැටියට මවකට දෙළදුක් ඇතිවෙන්නේ නෑ.

විහාරමහාදේවියගෙ වගේම බිම්බිසාර රජතුමාගේ අගබිසවගේ වුණත් යටිහිතේ ඇතිවුණු ආසාවල් නිසා එවැනි ගතිගුණ තියෙන කුමාරවරු බිහිවුණා මිසක, කුමාරවරුන්ගේ උප්පත්ති කර්ම නිසා බිසෝවරුන්ට එවැනි දෙළදුක් ඇතිවුණේ නෑ. ගැමුණු කුමාරයා කුසට එන්න කලින් ඉඳලම කොහොමින් හරි එළාරව පලවා හැරලා රට එක්සේසත් කරන්න ඕන කියන ඒකායන අරමුණ විහාරමහාදේවියගේ හිතේ තිබිලා තියෙනවා. හැබැයි කාවන්තිස්ස රජතුමා යුද්ධෙට අකමැති නිසා එතුමියට ඒ අසාව ඉෂ්ඨ කරගන්න විදියක් තිබුණේ නෑ. ඒ



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය අත්තනායක එම්.හේරත්

හින්ද පුතෙක් වදලා හරි ඒ අපේක්ෂාව ඉෂ්ඨ කර ගන්නවා කියන අරමුණෙන් තමයි එතුමිය ජීවත්වෙලා තියෙන්නේ. ගැමුණු කුමාරයා යුද්ධ කළෙත් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මිස හුදු යුද්ධය කිරීමට නොවේ කියන පොරොන්දුව පිට. අනික එළාරගෙන් පස්සේ ගැමුණු කුමාරයා කුරාකුහුඹුවෙකුවත් ඝාතනය කළේ නෑ. හරිනම් දරුවෙක් කුසේ ඉද්දි අම්මා කෙනෙක් කාගෙහරි බෙල්ලක් කපපු කඩුවක් හෝදපු වතුර බිව්වහම ඒ දරුවාට කොයිතරම් දරුණු සිතිවිලි තියෙන්න ඕනද? එහෙමනම් මෙතැනදී හොඳින්ම පැහැදිලි වෙනවනේ ගැමුණු කුමාරයගේ මනසට තදින්ම කාවැදිලා තියෙන්නේ කුසේ ඉද්දි විහාරමහාදේවියගේ හිතේ තිබුණු සිතුම් පැතුම් කියලා. එතකොට මං මුලින් කිව්වා වගේ මේක දේවියගේ දෙළදුකක් මිසක් ගැමුණු කුමාරයාගේ දෙළදුකක් නෙවෙයි.

දෙවැනි කාරණය බිම්බිසාර රජුගේ අගබිසව, රජතුමාගේ උරය පලලා ලේ බීපු නිසා අජාසත්ත එතරම් දරුණු වුණා මිසක්, අජාසත්ත සසරේ පියා මරණ චේතනාවෙන්ම ඉපදුණු නිසා දේවියට එහෙම කරන්න හිතුණා නෙවෙයි. ඒත් දේවියට ඒ වගේ සිතුවිල්ලක් පහල වුණේ ඇයි කියන එක ගැන ඉතිහාසයේ කරුණු සඳහන් වෙලා නෑ.

ජාතක කතා පොතේ තියෙනවා එක්තරා බිරිඳක් ගර්භිනී වෙලා ඉද්දි තමන්ගේ දුප්පත් සැමියට කියනවා තමන්ට රජුගේ වත්තේ තියෙන වනික් මලක පාටින් චීත්ත රෙද්දක් මහලා අඳින්න දොළදුකක් තියෙනවා කියලා. අන්තිමට අනේ කොහොමහරි බිරිඳගේ දොළදුක සංසිඳවන්න ඕන කියලා හිතලා රජාගේ වනික් මල හොරෙන් කඩන්න ගිය මේ පුද්ගලයාව රජා උලේ ඉන්දවලා මරනවා. හොඳම කතාව කියන්නේ මේ පුරුෂයාව උලේ ඉන්දවලා මරණ වෙලාවේ අර ස්ත්‍රිය සොර සැමියත් එක්ක ගෙදර පෙම් සුව විඳිනවා. දුරදිග බලන්නැතුව ගෑනිගෙ රෙද්දට පාට හොයන්න ගිය මේ පුද්ගලයාට නිකරුණේ මැරෙන්න සිද්ධ වුණා.

කතාවේ හැටියට තමන්ගේ ස්වාමියාට ඒ ඉරණම අත් කරනවා කියන අරමුණ ඇයගේ යටිහිතේ තිබිලා තියෙනවා. නමුත් ඒක ඉෂ්ඨ කරගන්න අවස්ථාවක් ලැබුණේ ගර්භනී සමයේ.”

පසුව ඔහු මෙම සියලු කරුණු අද කාලයට අනුව සසඳමින් පැහැදිලි කළේ මෙසේය.

කන්න හරි ආසයි. ඒක ඉතින් පෘතග්ජන මිනිස්සු විදියට බොහොම අහිංසක සිතුවිල්ලක්. නමුත් ඔය කාලෙට හැම්, බේකන්, චීස්, පුඩින්, කොත්තු, ෆ්‍රයිඩ් රයිස් කන්න හිතෙන දොළදුක් හැදෙන්නේ නම් මම අර කලින් කියපු කරුණු නිසා. ගොඩක් මහත්තරු බැන්දට පස්සේ කලින් හිටි විදියට නෝනා කන්න ආසා දේවල් ගෙනත් දීලා, යන්න ආස තැන්වල ගෙනියනවා අඩුයි. එහෙම කළත් කරන්නේ බොහොම සුළු පිරිසක් විතරයි. ඉතින් අර කිව්ව හැම්බේකන්, චීස්, පුඩින් කන්න මහත්තරු නිතරම නෝනලව එළියට එක්ක යන්නෙත් නෑ. ගෙනල්ලා දෙන්නෙත් නෑ. නමුත් තමන්ගේ දරු පැටියා කුසේ තියාගෙන ඉන්න ගැබ්බර බිරිඳ ඉල්ලන කෑමක් සැමියෙක් බෑ නොකියා ගෙනත් දෙනවා. ඒක බිරින්දෑවරුන් හොඳකාරවම දන්නවා. අන්න ඒ වෙලාවට අම්මලා හිතේ තියෙන ආශාව ඉෂ්ඨ කරගන්න කටයුතු කරනවා. ඒකයි අද කාලේ දොළදුකත් මොඩ්වෙලා පොෂ්වෙලා කියලා අපිට පේන්නේ.

# චේතනාවෙනුත් එන්න පුළුවන්

අනික අද කාලේ සල්ලි තියෙන අම්මලාට හැදෙන දොළදුකක් තමයි රට සවාරි යන්න ආසා හිතෙන එක. නමුත් නිකමට හිතන්නකෝ ඒකත් සාමාන්‍ය දොළදුකක් නම් දුප්පත් සැමියෙක් කොහොමද ඒක සංසිඳවන්නේ? ඒක වෙන්නේ මෙහෙමයි. සල්ලිකාර බිරිඳ සැමියට සල්ලි තියෙන බව දන්න නිසා රට දොළදුක හැදෙනවා. දුප්පත් බිරිඳ සැමියට සල්ලි නැති බව දන්න නිසාත්, කිව්වට පලක් නැති බව දන්න නිසාත් ඒ දොළදුක හැදෙන්නේ නෑ.”

“දවසක් මගේ ශිෂ්‍යාවකගේ අම්මා කෙනෙක් මගේ ළඟට අඬාගෙන ඇවිත් කිව්වා ‘අනේ මහත්තයෝ මගේ දුව මාව දකින දකින තැන ගහලා මරාගෙන කන්න හදනවා’ කියලා. පස්සේ මම මේ අම්මත් එක්ක දිගින් දිගටම කතා කරද්දි තමයි දැනගත්තේ මේ අම්මා ගර්භිනී කාලේ දොළදුකට කියලා මහත්තයව කැලේට යවලා සතෙක් මරවලා උන්දෑ ලවාම උයාගෙන කාලා කියලා. මේ අම්මා කියපු විදියට දොළදුකට කියලා ඒ ආශාව සන්සිඳවා ගත්තට සතෙක් මරලා දඩමස් කන්න ඕන කියන ආශාව කලින් ඉඳලම තිබිලා තියෙනවා. නමුත් කොයිතරම් කිව්වත් මහත්තයා ඒකට කැමති වෙලා නෑ. පස්සේ දරුවා ලැබෙන්න ඉද්දි දොළදුක මුවාවෙන් ඇය සැමියා ලවා ඒ අශාව ඉෂ්ඨ කරගෙන තියෙනවා. එතකොට දඩමස් කන එක ඒ දරුවගේ උප්පත්ති කර්මයක් නිසා දරුවගෙ හිතට පහල වුණ දොළදුකක් නම් කුසේ ඉද්දි තමන්ගේ ආශාව ඉෂ්ඨ කරපු අම්මට ඇයි අද ඒ දරුවා ඒ තරම් වෛර කරන්නේ?

හැබැයි ඕකෙ මෙහෙම පැත්තකුත් තියෙනවා. ගැබ්බර වෙලා ඉන්න ඕනම අම්මා කෙනෙක් තමන්ගේ අතින් උයපු නැති අනුන්ගේ බතක්

> **ගැබිනි මවක් රහතන් වහන්සේ නමක් වගේ හැසිරෙන්න ඕන කියලත්, ගැබිනි මවට රහතන් වහන්සේ නමකට වගේ සලකන්න ඕන කියලත්නේ කියන්නේ. ඒ නිසයි දරුවෙක් ලැබෙන්න ඉන්න මවකට මස්, මාළු කෑල්ලක් කපන්නෙ නැතුව, බිත්තරයක් කඩන්නෙ නැතුව නිතරම බණ භාවනාවලට, සෙත්පිරිත්වලට හිත යොමු කරන්න කියන්නේ**

ගැබිනි කාලයේදී මව්වරුන්ගේ සිත් තුළින් ඉස්මතුවන මෙවැනි ආශාවන් සහ ඒවා ඉටු කරගැනීමට යාමේදී එය කුසේ සිටින දරුවාට බලපාන ආකාරය ගැනද අත්තනායක මහතා පැහැදිලි කළේය.

“අපි කලින් පෙන්නලා දුන්න කරුණු කාරණාවලින් මනාව පැහැදිලි වෙනවා අම්මගේ හිතේ තියෙන සිතුවිලි ලැබෙන්න ඉන්න දරුවගේ මනසට තදින්ම කාවදිනවා කියලා. ගොඩක් වෙලාවට ගැබිනි මවක් රහතන් වහන්සේ නමක් වගේ හැසිරෙන්න ඕන කියලත්, ගැබිනි මවට රහතන් වහන්සේ නමකට වගේ සලකන්න ඕන කියලත්නේ කියන්නේ. ඒ නිසයි දරුවෙක් ලැබෙන්න ඉන්න මවකට මස්, මාළු කෑල්ලක් කපන්නෙ නැතුව, බිත්තරයක් කඩන්නෙ නැතුව නිතරම බණ භාවනාවලට, සෙත්පිරිත්වලට හිත යොමු කරන්න කියන්නේ. හැමවෙලාවෙම අම්මගෙ නිදියහන ළඟ පිරිත්, බණ ඇහෙන්න සැලැස්සුවම කුසේ ඉන්න දරුවටත් ඒවා ඇහෙනවා. අම්මගේ හිතේ ඇතිවෙන පින් සිතිවිලි දරුවගේ මනසටත් කා වැදිලා පින්වන්ත දරුවෙක් බිහිවෙනවා.

අවසාන වශයෙන් දරුවෝ බලාපොරොත්තුවෙන් ගැබ්බර වෙලා ඉන්න මව්වරුන්ට මෙන්න මේ කාරණය කියන්නම අවශ්‍යයි. ගැබිනි සමයේදී තමන්ගේ හිත, කය ක්‍රියා කරන විදිය ගැන තමන්ම හොඳ අවධානයකින් ඉන්න. නිකමට හරි තමන්ට අසාමාන්‍ය දොළදුකක් පහල වුණාත් ඒක ඇත්තටම ගැබ්බර විම නිසා පහල වුණ දොළදුකක්ද එහෙමත් නැත්නම් තමන්ගේ හිතේ කාලෙක ඉඳන් තැන්පත් වෙලා තිබුණ ආසාවක්ද කියලා සිහිනුවණින් හිතලා බලන්න. අනික මෙතැනදී පුරුෂ පාර්ශවයත් හොඳ බුද්ධියකින් කටයුතු කරන්න ඕන. ගැබිනි සමයේදී තමන්ගේ බිරිඳ කන්න බොන්න යන්න එන්න ඕන කියන දේවල්වලින් ඇයගේ හිතේ වැඩ කරන සිතුම් පැතුම් මොන වගේද කියලා තේරුම් ගන්න බලන්න ඕන. නිකමටවත් ඒ දේවල් ගැබිනි මවකට නුසුදුසුයි කියලා හැඟුණොත් ඇයට ආදරයෙන් කරුණු පහදලා දීලා ඇගේ හිත වෙනතක යොමු කරන්න තරම් සැමියා සූක්ෂම වෙන්නත් ඕන.”

**ලිහිණි මධුෂිකා**



# දොස්තර මහත්තයට පෙරලා සලකන්න අලියෙක්

## එතුමව ගෙදර එක්කගෙන ගිහිල්ලා

රෝගී අලියෙකුට ප්‍රතිකාර කිරීමේදී පශු වෛද්‍යවරුන් ඇතුළු කණ්ඩායම්වලට දැරීමට සිදුවන අවදානම අතිමහත්ය. ඒ සියල්ල දරාගෙන රෝගියාට ප්‍රතිකාර කිරීම ඔවුන්ගේ අපේක්ෂාවයි. ඊට කැපවූ විට වෙනත් කිසිවක් කෙරෙහි අවධානය යොමු නොවේ. මෙය වෛද්‍ය ඉසුරු හේවාකෝට්ටගේ පුත්තලම කලාපයේ සේවය කරමින් සිටියදී මුහුණ දුන් අත්දැකීමකි. එවිට ඔහු වනජීවී දෙපාර්තමේන්තුවට සම්බන්ධ වී වසරක් එකහමාරක් පමණ ගතවූවා පමණි.

කකුල් ඉදිමුණු අලි රෝගියෙකුට ප්‍රතිකාර ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් විය. ඒ අනුව ඖෂධ ඇතුළු උපකරණ සමඟ සූදනම් වුණු කණ්ඩායම කඩිනමින් අදාළ ස්ථානයට ගියේය. එහෙත් රෝගියා වෙත ළඟාවීමට අසීරුය. සතා සිටියේ කටු පඳුරු සහිත ළඳු කැලෑවක රිංගාගෙනය. ඊට පිවිසීම පහසු නැත.

**“ගොඩක් වෙලාවට රෝගී වුණු අලි ඒ වගේ තැන්වල තමයි ඉන්නෙ. මොකද මිනිසුන්ගෙන් හරි වෙන දෙයකින් හරි වෙන බලපෑම අඩු නිසා. ඒ වගේ තැනක ඔවුන්ට නිදහසේ ඉන්න පුළුවන්. ඒ වුණාට ඒ වගේ තැන්වලට ගිහින් ප්‍රතිකාර කිරීම හරිම අපහසුයි.”**

ඉහත කී රෝගී අලියා වෙනුවෙන්ද ඒ දුෂ්කරතාව අත්විඳීමට වෛද්‍යවරයා ඇතුළු පිරිසට සිදුවිය. නිර්වින්දනය කිරීමට දරණ ප්‍රයත්නයද සාර්ථක නැත. කටු පඳුරු අස්සේ නිසි එල්ලය ගන්නේ කෙසේද? එය ප්‍රයෝජනයට ගත් අලියා කෙමෙන් කෙමෙන් වනය ඇතුළට ගියේය. වනජීවී කණ්ඩායම ඒ පිටුපසිනි. පිරිසට අවදානම අමතක විය. ඔවුන්ගේ එකම අභිප්‍රාය වූයේ සතාට ප්‍රතිකාර කිරීමයි. අලියා මායාකරුවකු මෙන් පිරිසද රැගෙන ගියේය. ටික වේලාවකින් සියල්ලෝ විශාල එළිමහනකට පිවිසියහ. වෛද්‍යවරයා ප්‍රමුඛ පිරිසට ඒ ගැන අවබෝධ වනවිට ප්‍රමාද වැඩිය. දැන් සියල්ලන් සිටින්නේ අලියාගේ රාජධානියේය. ඒ


### අලි කතා

මදිවාට සතා නිර්වින්දනය කිරීමද ඒ වනවිටද සාර්ථකව නොතිබිණ. ටික වේලාවකින් ප්‍රතිකාර කිරීම ත්‍රාසජනක ජවනිකාවක් බවට පරිවර්තනය විය. රෝගියා එකවරම හැරී තමාගේ උදව්වට පැමිණි අය දෙසට දුවන්නට පටන් ගත්තේය. අලියා සහ පිරිස අතර පරතරය මීටර පනහක්වත් නැත.

**“මෙයා එකපාරටම අපේ පැත්තට හැරිලා එනකොට අපට කිසි දෙයක් හිතාගන්න බැරි වුණා. අපි තුවක්කු අරන් ගියාට ලේසියෙන් ඒවා පාවිච්චි කරන්නෙත් නෑ. අපි එක්ක එදා මාධ්‍යවේදියෙකුත් මේ ගමනට සම්බන්ධ වුණා. මේ රාජකාරිය කෙතරම් අවදානම්සහගතද කියන එක එදා තමයි ඔහුටත් අවබෝධ වුණේ. ඊටපස්සෙ ඔහු ඒ වගේ කටයුතුවලදී වැඩිය ළඟට ආවෙත් නෑ. ඉතින් එදා අපි කලබලේට බෙහෙත් පෙට්ටි ටිකත් දාලා එහෙට මෙහෙට දිව්වා. බෙහෙත් පෙට්ටි සුදු පාටින් තිබුණ නිසා අලියාගෙ අවධානය යොමු වුණේ ඒවට. එයා දුවගෙන ඇවිත් ඒවා කුඩු කළා. ඒකෙන් කේන්තිය පිටකර ගත්තට පස්සෙ එයා අපිට කරදර නොකර ආයෙම හැරිලා ගියා. කැලෑවට යනකොට වර්ණවත්, කැපී පෙනෙන ඇඳුම් අඳින්න එපා කියන්නෙත් ඒකයි. මොකද පහසුවෙන් සතෙකුට ඉලක්ක වෙන්න ඒක හේතුවක් වෙන්න පුළුවන්.”**

කෙසේ වෙතත් වෛද්‍ය ඉසුරු ඇතුළු නඩයද මෙහෙයුම අතහැරියේ නැත. ඔවුන් එදින නැවත පැමිණියේ අලියාට ප්‍රතිකාර කිරීමෙන් අනතුරුවය.

හදවතින් රාජකාරිය කරන්නෙකුට එය මග දමා පැමිණිය නොහැකිය. එය රාජකාරියට එහා ගිය එකකි. එදා ජීවිත අවදානම දරමින් අසීරුවෙන් ප්‍රතිකාර කළ අලියා අදටද නිරුපද්‍රිතව වෙසෙන බව පශු වෛද්‍ය ඉසුරු හේවාකෝට්ටගේ සිහිපත් කරන්නේ බොහෝ සතුටිනි.



තොරතුරු - පශු වෛද්‍ය
**ඉසුරු හේවාකෝට්ටගේ**

**රෂ්නිකා ලියනගේ**

# ස්වාමි මළා! දැන් ඉතින් දෙවියන්ට වැඳපල්ලා

දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයට අයත් කොයිම්බටූර් නම් ප්‍රදේශය අතීතයේ සිට කපු රෙදිපිළි නිෂ්පාදනයෙන් ඉමහත් ප්‍රසිද්ධියට පත් ප්‍රදේශයකි. දහනව වන සියවසේ අගභාගය වනවිට කපු රෙදිපිළි නිෂ්පාදනය මුල්කොටගෙන මේ ප්‍රදේශයේ විශාල ආර්ථික පුනර්ජීවනයක් ඇති විය. ඉන් එහි ජීවත් වූ ධනේෂ්වර පැලැන්තිය තව තවත් තරවූහ. එහි ප්‍රතිඵලය වූයේ කපු රෙදිපිළි නිෂ්පාදනය මුල්කොට ස්වාමි-සේවක දෙකොටසක් බෙදී ඔවුන් අතර සමාජ පරතරය තව තවත් පුළුල් වීමයි.

මෙහිදී ශ්‍රමය වගුරවන්නවුන් හට ඉතා සුළු වැටුප් ගෙවා වැඩි කොටස තමන් සතු කරගත් හාම්පුත්තු සේවක කාරකාදීන්ගෙන් එල්ලවන විරෝධය මැඩපැවැත්වීමට කදිම උපායක් යෙදූහ. එනම් එවක එහි විසූ හින්දු පූජකයන් වෙතට ගොස් කම්කරුවන් ගේ දේව භක්තිය වැඩි කරවන මෙන් ඉල්ලා සිටීමයි. යමෙකු තුළ ආගමික භක්තිය අවිචාරවත් ලෙස ඉස්මතු වීම වැඩිවීමට සාපේක්ෂව ඒ තැනැත්තා තුළින් ලෝකය හා සමාජය දෙස යථාර්ථවාදීව බැලීමේ හැකියාව අවප්‍රමාණ වන බව මෙම හාම්පුත්තු දැන සිටියහ. ඒ අනුව තම සේවකයින්ට වැටුප් ගෙවිය යුතු මුදලින් කොටසක් හින්දු පූජකයන්ට දුන් හාම්පුත්තු ඒවායින් හින්දු කෝවිල් සහ දේව ප්‍රතිමා ඉදි කරවීමට දිරි දුන්හ. ඉන්පසු හාම්පුතුන් තමන්ට එල්ල කරන දැඩි පීඩනයට එරෙහිවීමට අදහස් නොකළ කම්කරුවන් කළේ කෝවිල්වලට ගොස් එහි පූජකයන් ලවා ඒ ඒ දෙවිවරුන්ට යාතිකා කරවා ගැනීමය. එහිදී එම පූජකයන් පවසන ස්තෝත්‍ර ආදිය ඇසීමෙන් මනැස් හිරිවට්ටවා ගත් සේවකයෝ තම හාම්පුතුන් සඳහා පෙර සේම සේවය ලබාදුන්හ.

මේ අතරතුර දිළිඳු පැලැන්තියේම පවුලකින් බිහිවූ හරිහරන් නම් තරුණයෙක් හින්දු කෝවිලක සේවයට බැඳී පසුව එහි පූජකවරයෙකු බවට පත්විය. මනා දේහධාරී කඩවසම් තරුණයෙකු වූ හරිහරන්ට තම ඥාති මිත්‍රාදීන් විඳින දුක යථාර්ථවාදී ලෙස දැකගැනීමේ සිහි නුවණක් තිබිණි. එහෙත් පූජකයෙකු වූ නිසා කම්කරු ප්‍රජාව දුක් විඳින සැබෑ හේතුව යථාර්ථවාදී ලෙස ඔවුන්ට වටහාදීමේ හැකියාවක් ඔහුට නොතිබිණි. එබැවින් ඔහු තම ආගමද නොකෙළෙසා ඊට යථාර්ථවාදී අර්ථකථනයක් දෙන්නට කටයුතු කළේය.

**"මට දෙවියන්ගේ හඬ ඇසී තිබෙනවා. දෙවියන් පවසන දේ මට වැටහී තිබෙනවා. දෙවියන් කියන්නේ ඔබේ දෙවියන් කෝවිලක ගල්, ලෝහ හෝ මැටි පිළිරුවකින් නොදැක ඔබ තුළින්ම දැකීමට පුරුදු විය යුතු බවයි. කිසියම් කෙනෙක් ඔබට නපුරක්, අයහපතක්, අසාධාරණයක් කරනවා නම් පළමුව ඔබේ හෘද සාක්ෂිය තුළ වැඩසිටින ඔබේම දෙවියන්ගෙන් අසන්න. එවිට ඔබ කුමක් කළ යුතු දැයි ඔබේ දෙවියන් ඔබට කියාවි. එසේ නොකොට ඔබ කෝවිල් වෙතට ගොස් ඒවායේ ඇති දෙවිවරුන්ගේ ප්‍රතිමා ඉදිරියේ කොතෙක් වැඳ වැටුණත්, බාරහාර වුණත්, කන්නලව් කළත් වැඩක් වෙන්නේ නෑ. ඒ සියලු දෙවිවරුන්ගේ පිහිට ඔබට ලැබෙන්නේ ඔබේ හෘද සාක්ෂියේ දෙවියන් පුබුදුවා ගෙන ඔබේ හෘද සාක්ෂියට අනුව කටයුතු කළොත් පමණයි. නිරතුරුවම ඔබට අසාධාරණකම් කරන්නවුන් උදෙසා දෙවියන් යැදීමට වඩා ඒ අසාධාරණකම්වලින් අත්මිදීමේ ක්‍රම ගැන ඔබේ හෘද සාක්ෂියේ දෙවියන්ගෙන් අසා ඒ අනුව කටයුතු කරන්න."**

**යමෙකු තුළ ආගමික භක්තිය අවිචාරවත් ලෙස ඉස්මතු වෙද්දී, ඒ පුද්ගලයාට ලෝකය දෙස යථාර්ථවාදීව බැලීමට ඇති හැකියාව අඩුවෙනවා**

පසුව හරිහරන් ස්වාමි නමින් ප්‍රකට වූ මේ තරුණ පූජකයාගේ මතවාද එවක තරුණ පිරිස් ඉමහත් ආදරයෙන් වැළඳගත්හ. එමෙන්ම ඔහු පැවසූ ඒ නව දේව නියමය කොයිම්බටූර්හි ජනතාව අතරේ සීඝ්‍රයෙන් ප්‍රචලිත විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ තමන්ට හාම්පුතුන්ගෙන් ලැබෙන වැටුප් හා දීමනා මඳවීම පිළිබඳව වගේ වගක් නොමැතිව සිටි තරුණ පිරිස් වැඩි වැටුප් හා දීමනා ඉල්ලා අරගල කිරීමට පෙළඹීමයි. තම සේවක තරුණයන්ගේ සිතුවිලි මෙලෙස එක්වරම වෙනස්වීමට හේතු විමසා සිටි එම හාම්පුතුන් ඊට හරිහරන් ස්වාමි නම් වන තරුණ පූජකයාගේ ඉගැන්වීම් මුල්වී ඇති බව දැනගන්නට ලැබිණි.

පසුව ඔවුන් ඒ සම්බන්ධයෙන් එහි හින්දු කෝවිල් භාරව සිටි පූජකරුවන්ට දන්වන ලදි. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ඒ තරුණ පූජකවරයා එම සියලු කෝවිල්වලින් නෙරපා හැරීමයි. එහෙත් ඉන් අධෛර්යමත් වනු වෙනුවට තවදුරටත් ධෛර්යමත් වූ ඔහු සංචාරක දේශකයෙකු වශයෙන් ඒ ප්‍රදේශයේ ගමක් ගමක් පාසා සැරිසරමින් දෙසුම් පවත්වන්නට වූයේ සිය දහස් ගණන් තරුණ පිරිස් තම අනුගාමිකයන් බවට පත් කරගනිමිනි.

මෙසේ තම අනුගාමිකයන් සමඟ සංචාරක දේශකයෙකු ලෙස කටයුතු කරන අතරේ මෙම තරුණ පූජකයා හිටිහැටිගේ අභිරහස් ලෙස මිය ගියේය. ඇතැමෙකු කියා සිටියේ සතුරු බලවේග විසින් ඔහුට වස දී මරණයට පත්කළ බවකි. එහෙත් එම පූජකයාගේ මරණයෙන් පසුව එවක එහි ආධිපත්‍යය ගෙන සිටි පූජක පැලැන්තිය එහි වැසියන්ට මෙසේ කීහ.

**"නුඹලාගේ දුක්වේදනා වෙනුවෙන් යාදිති, කන්නලව් ඇසීමටත්, පුද පඬුරු බාරගැනීමටත් හරිහරන් ස්වාමිගේ දේවාත්මය දැන් සූදනමින් සිටියි. එනිසා දැන් නුඹලා කළ යුත්තේ අතීතයේ ලෙසින්ම කෝවිල්වලට පැමිණ කලින් දෙවිවරුන්ට වඳින පුදන කන්නලව් කරන අතරේ හරිහරන් ස්වාමි නම් වන ඔබේ අලුත් දෙවියාටද කන්නලව් කොට බාරහාර වීම පමණි."**

දකුණු ඉන්දියාවේ ග්‍රාමීය දෙවිවරුන් සම්බන්ධ විශිෂ්ඨතම පර්යේෂණයක යෙදුණු ඇන්ග්ලිකන් නිකායික රදගුරුවරයෙකු වන හෙන්රි වයිට් හෙඩ්ගේ (1803-1947) ජනශ්‍රැති එකතුවකින් ගොනු කරගත් ඉහත සඳහන් සත්‍ය වෘතාන්තය එද ඉන්දියාවට සේම වර්තමාන ශ්‍රී ලංකාවටද එකසේ අදාළ වනු ඇතැයි මට සිතෙයි.



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ






# එන්න එපා ඕවට මං ලැජ්ජා බයට හැදිච්ච 'කොල්ලෙක්!'



ගැබිනියක් වූ කොණ්ඩ කිරිල්ලී මඳ අසනීප ගතියකින් සිටි නිසා, කවදාවත් බස් එකේ නොයන කුම්මැහි පිංකිට ඇගේ උදව්වට එදා බස් එකේ යන්න වුණා. බසයේ හිස්ව තිබුණේ ජනේලය ළඟ එක් අසුනක් පමණයි. ඊට යාබදව ඉඳගෙන සිටියේ ටිකක් කෝමල පෙනුම ඇති තරුණයෙක්.

කොණ්ඩි හිස් අසුනේ වාඩි වුණා. පිංකි එතැනම හිටගෙන ගියේ අපහසුවෙන්. යාබද අසුනේ සිටි තරුණයා පිංකි දෙස කිහිප වරක් බලා මනමාල සිහනවක් පෑවා.

මඳ වේලාවකින් කෝමල තරුණයා නැගිට්ටේ පිංකිට අසුන් ගන්නා ලෙස සන් කරමින්.

**"නෑ අනේ! මට හිටගෙන යන්න පුළුවන්. මම හැමදාම යන්නේ හිටගෙන."**

පිංකි උඩඟුවෙන් ඇදබෑවේ පට්ට බොරුවක්!

තරුණයා විමතියෙන් පිංකි දෙස බලා වාඩිවුණා.

තරුණයා නැවතත් නැඟිට්ටේ තවත් දුරක් යද්දී.

**"කෝලං! මං ඔයාට දැන් කී පාරක් කිව්වද? මට හිටගෙන යන්න පුළුවන්. ඔය වෙන පොටකට එන්නේ. මං ඕවට කැමති නෑ."**

පිංකි එවර පැවසුවේ රවමින්, තරුණයාගේ උරහිසින් අල්ලා අසුනට තද කරමින්.

තරුණයා අසරණව නැවතත් ඉඳගත්තා.

මඳ වේලාවකින් ඊළඟ වතාවේත් තරුණයා නැඟිට්ටා.

**"මේක පුදුම කරුමයක්නේ! මට ඉඳගන්න එපා!"**

පිංකි කෝපයෙන් කීවේ නැවතත් තරුණයාගේ උරහිසින් පහතට තද කරමින්.

තරුණයා කෝපයෙන් ඇගේ අත ගසා දැම්මා.

**"මේ මොන කරදරයක්ද අයියෝ? මං කී සැරයක් බහින්න හැදුවද? මේ ගෑනි මට බහින්න දෙන්නෙම නෑනේ! මට බලහත්කාරකම් කරන්න හදනවා ඒයි! එන්න එපා ඕවට, හරිද? මම ලැජ්ජා බයට හැදිච්ච කොල්ලෙක්!"**

තරුණයා ඇදලා පැදලා කෝමල හඬින් පවසමින් බඳ නලවා ලැසි ගමනින් බසයෙන් බැස ගියා.

බසයේ සිටි සැවොම සිනාසුණෝ මහ හඬින්! මුහුණ රතු කරගත් පිංකි හනිකට බසයෙන් බැස නිවසටම දිව්වේ කොණ්ඩි ගැනවත් නොසිතා.




ආණ්ඩුවට එරෙහි ජනතා අරගලය දිනෙන් දින උත්සන්න වෙමින් ඇත. ගෑස් හිඟය, ඉන්ධන හිඟය, විදුලි කප්පාදුව මෙන්ම බඩු මිල අසාමාන්‍ය ලෙස ඉහළ යෑම නිසා ඒවාට විසඳුම් ඉල්ලමින් ජනතාව පාරට බටහ.

විද්වතුන්ගේ මතය නම් පවතින අර්බුදය නිසි ලෙස හඳුනාගෙන, ඊට ඉතා ඉක්මනින් විසඳුම් සෙවිය යුතු බවයි.

සමගි ජන බලවේගයේ ජාතික ලැයිස්තුවෙන් පත්කළ පාර්ලිමේන්තු මන්ත්‍රීනී ඩයනා ගමගේ දැන් සිටින්නේ ආණ්ඩුවට සහය දෙමිනි.

ඇය පසුගිය දිනෙක ආර්ථිකය ගොඩගත හැකි යෝජනා කිහිපයක් පාර්ලිමේන්තුවට ගෙනාවේ, සම්ප්‍රදාය තුළ කොටුවී ආර්ථිකය අවහිර කරගත යුතු නැති බව පෙන්වා දෙමිනි. මේ ලිපිය රටේ වත්මන් අර්බුදය සම්බන්ධයෙන් ඇය හා සිදුකරන ලද කතාබහ ඇසුරින් සකසන ලද්දකි.



**මේ වෙලාවෙ මමත් ඉන්නෙ ජනතාවගෙ පැත්තේ**

# හිරුණිකා ශුදානා අක්කා බලන්න ගියේ ඇයි කියලා මම දන්නෙ නෑ



## පාර්ලිමේන්තු මන්ත්‍රීනී ඩයනා ගමගේ

**මේ වෙනකොටත් ජනතාව ඉන්නේ මහපාරේ. ඔවුන් කියන්නේ පාර්ලිමේන්තුවේ 225ත් ගෙදර යන්න ඕන කියලයි?**

ඔව්. ඒ ඉල්ලීම සාධාරණයි. මොකද පක්ෂ-විපක්ෂ කියලා නෑ. පාර්ලිමේන්තුව නියෝජනය කරන හැමදෙනාටම අඩුවැඩි වශයෙන් රට ගැන වගකීමක් තියෙනවා.

ඒ වගකීම ඉටු කරන්න බැරිවීම තුළයි මේ පුපුරායාම ඇතිවෙන්නේ. ආහාර ප්‍රශ්නය ඇතුළු ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කරන්න බැරි නම් ඒ වගකිව යුත්තෝ ඉන්න ඕන කොතැනද කියනෙක ජනතාව අද තීන්දු කරලා තියෙනවා.

එතැනදී මමත් ඉන්නේ ජනතාවගේ පැත්තේ. මොකද ජනතාවට බලපාන හැම ප්‍රශ්නයක්ම මටත් බලපානවා. කරන්ට් එක කැපුවම මමත් ඉන්නේ කළුවරේ. ගෙදර ජෙනරේටරයක් තිබුණට මගේ අසල්වැසියෝ කළුවරේ ඉඳිද්දි මට විතරක් එයින් එළිය බලන්න බැහැ.

**ඒ එළිය නොබලන්නේ ජනතා විරෝධය ඔබේ ගේ ළඟටත් එයි කියලද? මොකද ඔබත් මුලින් කිව්ව 225න් කෙනෙක්?**

මම ඒ දෙසිය විසිපහෙන් කෙනෙක් වුණාට මගේ දේශපාලන අරමුණ වෙනස්.

මම සල්ලි හම්බ කරන්න දේශපාලනයට ආව කෙනෙක් නෙවෙයි. මම ගොඩ යන්න හිතාගෙන ආව ගමනකුත් නෙවෙයි.

මම පැහැදිලිවම බැලුවේ මේ රටේ ජනතාව වෙනුවෙන් යමක් කරන්න පුළුවන්ද කියලයි. ආර්ථිකය ශක්තිමත් කරන්න මේ රටට ඩොලර් ගේන්න පුළුවන් විදියේ යෝජනා ගෙනාවේත් ඒ නිසයි.

**මුට්ටි ගඟට දාලා රටක් ගොඩදාන්න පුළුවන්ද? තීන්දු තීරණ ගන්න අයට ඒ දැනුම නැතුව රට කරන්න බැහැ**

බොහෝ විශ්ලේෂණාත්මක කරුණු මතයි කංසා වගාව පිළිබඳ යෝජනාව ගෙනාවේ. ඒත් ඒවා යට ගියා.

හරි විදියට සාකච්ඡාවකට ලක්වුණේ නැහැ. මම පෙන්වා දුන්නේ රටට ඩොලර් ගේන්න පුළුවන් එක් මාර්ගයක්. ඒත් එය යටගියා.

ඒ වගේ අලුත් දේවල්වලින් රටේ ආර්ථිකය ගොඩනංවන ක්‍රමවලට යන්න තිබුණා. වසංගතයකට පස්සේ එන්නේ සාගතය කියනෙක අපි ඕන කෙනෙක් දන්නවා.

**වසංගතයට තවත් රටවල් මුහුණ දුන්නා?**

ඇත්ත. වසංගතය බලපාපු හැම රටකටම මෙහෙම වුණේ නැහැ.

ආර්ථිකය කඩාවැටුණේ නැහැ. මෙහෙම සාගතයක් එන්නේ අපි ගත්තු තීන්දු තීරණවල ගැටලුවක් තියෙන නිසයි.

වසංගතය විතරක් නෙවෙයි ඊට කලින් රටේ ආර්ථිකය ගැන ගත් වැරදි තීන්දු තීරණවල ප්‍රතිඵලත් මෙහිම කොටසක්. හිටපු, ඉන්න කිසිම දේශපාලනඥයෙකුට ඒ වගකීමෙන් මිදෙන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. කොරෝනා අපිට බලපෑම් කළා.

වැක්සීන් එක දුන්නා. ඒවා ඔක්කොම හරි. ඒත් ඉන්පස්සේ එළැඹෙන තත්ත්වයට මුහුණ දිය හැකි ලෙස ආර්ථිකය ශක්තිමත් කරනවා වෙනුවට ගඟට මුට්ටි දලා මිථ්‍යාව වැළඳගන්න පරිසරයක් අපි දැක්කා.

ඒ ඇමතිකම් දැරූ උදවිය රටට ඕන කරන ඉදිරි ඖෂධ ටික ගන්නේ කොහොමද කියනෙක හිතුවේ නැහැ.

අද තියෙන්නේ තනිකරම ජනතා අරගලයක්. එහෙම නැතුව දේශපාලන පක්ෂ විසින් ගෙනියන අරගලයක් නෙවෙයි.

**අනුරාධපුර දේවාලයකට ඔබේ පක්ෂය නියෝජනය කරන හිරුණිකා ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීවරිය යෑම පිටුපස දේශපාලනයක් තියෙන බවට චෝදනා තියෙනවා?**

එතැනට ගොස් හිරුණිකා හිටපු මන්ත්‍රීතුමිය ජනතාවට ආමන්ත්‍රණය කරන්න හිතුණද, එහෙම නැත්නම් පෞද්ගලික කරණාවක් වෙනුවෙන් එතැනට ගියාද කියන්න මම දන්නේ නැහැ.

හැබැයි පක්ෂ පාට අතෑරලා සාමාන්‍ය පුද්ගලයෙක් විදියට ගත්තොත්, ඇයටත් විරෝධය පෑමේ අයිතියක් තියෙනවා. ඇය අනුරාධපුරයට විතරක් නෙවෙයි මිරිහානටත් ගියා.

මේ වෙනකොට රටේ තියෙන ප්‍රශ්න හැමදෙනාටම බලපානවා. පාර්ලිමේන්තුවේ 225ටත් මේ ප්‍රශ්න බලපානවා.

මුදල් හදල් යහමින් නැති කෙනාට වගේම මුදල් හදල් තියෙන කෙනාත් පාරේ, පෝලිම්වල රස්තියාදු වෙනවා. දැන් සිංහල අවුරුද්ද සමස්තයක් වශයෙන් ගත්තම මහා පීඩාවක්, බරක් එක්ක ගෙවිලා ගියේ. මිනිස්සු මහපාරේ, තෙල් පෝලිම්වල මියැදෙනවා. එය වේදනාවක්.

**එකිනෙකාට චෝදනා කරගන්නවට වඩා මේ මොහොතේ සිදුවිය යුත්තේ මොකක්ද?**

ඇත්තටම අපට වැරදුණේ කොතැනද කියලා බලන්න ඕන. සුදුස්සෝ සුදුසු තැන තැබිය යුතුයි.

එහෙම නොවුණම රටකට යන කලදසාව මේක තමයි. කැබිනට් එක තීන්දු ගන්න අය ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීම ගැන වගකීම් සහගත වීම අවශ්‍යයි.

ඉතින් 225ම අයින්වෙලා හරි ඒ රට හදන්න පුළුවන් ක්‍රමවේදයට රට ගෙනියන්න සහයෝගය දිය යුතුයි. මොකද මේ ප්‍රශ්නය කියන්නේ මිලියන විසි දෙකකගේ ප්‍රශ්නයක්.

**කංසා වවමු කිව්වේ ආවට ගියාට නෙවෙයි**


කෑම ටික උයාගන්න විදියක් නැතුව අම්මලා විඳින වේදනාව විහිළුවක් නෙමෙයි. දරුවෝ අරන් අරගල භූමියේ ඉන්න අම්මලා මමත් දැක්කා. රටක් හැටියට අපි මේ තත්ත්වයෙන් ඉක්මනට ගොඩ එන්න ඕන.

පවතින ආණ්ඩුව වෙනස් කරනවද, ක්‍රමවේදය වෙනස් කරනවද කියනෙක ගැන වාද විවාද කරමින් ඉන්න එක නෙවෙයි දැන් කළ යුත්තේ. මේ ජන පීඩාව බැලුමක් වගේ පිම්බී පිම්බී එන හැටි අපි දැක්කා. දැන් ඒ බැලුම පුපුරලා ඉවරයි. ඉතින් ඒ විරෝධය තමයි මේ නැගෙන්නේ. ඒ නැගෙන විරෝධය දිහා බල බලා තවත් නිකන් ඉන්න අපිට පුළුවන්ද? මේ මොහොතේ හෘද සාක්ෂියට එකඟව මම ජනතාවගේ පැත්තේ හිටගත්තේ ඒකයි.

**දීපා වසන්ති එදිරිසිංහ**

**පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.**

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**



# යමක් කමක් තේරෙන දරුවෝ ප්‍රශ්න අහද්දි රෝස කැලෙන් එළියට ඇවිත් උත්තර දෙන්න

අපි හතරදෙනා ඉන්න මේ පින්තූරෙ දකිද්දි නතාරි දූගේ පළවෙනි උපන්දිනේට දෙන්න පුළුවන් වටිනම තෑග්ග දුන්නා කියලයි අද මට හිතෙන්නේ. ඒ තමයි එයාට හොඳම යාළුවෙක් වෙන්න පුළුවන් සහෝදරියක්. නතාරි අක්කාගේ පළවෙනි උපන්දිනේ දවස එනකොට ඔවී නංගිට හරියටම දවස් 14යි.

මෙහේ දරුවා ලැබුණාම දවස් පහකින් තමයි ගෙදර එවන්නේ. ඉතින් ඔවීව ලැබෙන්න ගිහින් හොස්පිටල් එකේ ඉන්නකල් මට නතාරිව විතරමයි මතක් වුණේ. දහම් කෝල් කරලා එනවා කියද්දී **"නතාරිත් එනවා නේද? නතාරිත් එක්ක එන්න"** කියලා මං කියනවා. නතාරි දූගේ ඇස් ලොකුයිනේ. ඉතින් ඒ ඇස් තවත් ලොකු කරලයි ඔවී දිහා බලන්නේ. ඊටපස්සේ ඔවීගේ දිහා බලන්ම හිනා වෙනවා.

මේ පින්තූරේ ඉන්න පුංචි කෙල්ල දැන් මගේ උරහිස ගාවටම උසයි. තව අවුරුද්දක් යද්දී මං තරමටම උස වෙයි. බලන් ඉද්දි ලොකුවෙලා වගේ මට දැනෙන්නේ. දැන් එයාට හැමදේම තනියම කරන්න ඕන. තනියම ඉස්කෝලේ යන්න, දහම්ගෙන් කීයක්හරි ඉල්ලගෙන තනියම කඩේ ගිහින් එන්න, තනියම ඇඳුම් තෝරලා ඇඳන් යන්න. මේ දවස්වල තනියම කොණ්ඩෙ පීරන්නත් ඉගෙනගන්නවා. එයා කරන සමහර දේවල් දිහා මං හොරෙන් බලා ඉඳලා දැක්කෙ නැති ගාණට ඉන්න වෙලාවලුත් තියෙනවා. ගෑනු දරුවෙක් ටික ටික දැනුම් තේරුම් වෙද්දී ඒ දේවල් දිහා එයාට නොදැනෙන්න බලන් ඉඳලා සතුටු වෙන එක අම්මලාගේ පුරුද්දක් වෙන්න ඇති. මටත් ඒක ඒ විදියටම තියෙනවා.




දැන් ඉතින් මගෙන් ගොඩක් ප්‍රශ්න අහන එකත් වැඩිවෙලා. මැරුණාම කොහෙටද යන්නේ? දරුවෝ ලැබෙන්නේ කොහොමද? Best friendsලද කසාද බඳින්නේ? මමා පපා Best friendsලද? මැරුණ අය අහසේ තරුවෙලා ඉන්නවද? වගේ ප්‍රශ්න ගොඩයි. කොච්චර ප්‍රශ්න ඇහුවත් මේ හැමදේටම මං උත්තර දෙනවා. හැබැයි ඇත්තම උත්තර. එහෙම නැතුව දරුවො රවටන බොරු උත්තර නෙවෙයි. ළමයි ගෙනාවේ රෝස කැලෙන් කියලා මං කියන්නේ නෑ. අම්මගේ බඩෙන් තමයි ඔයා ආවේ. තව පොඩ්ඩක් ලොකු වුණාම බබාලා හැදෙන්නේ කොහොමද කියලා මං කියලා දෙන්නම් කියලා තමයි ඒ ගැන අහද්දි මම කියන්නේ.

**දරුවන්ට ජීවිතේ අත්දැකීම් ගන්න දෙන්න ඕන රෝසී, එතකොටයි එයාලා සමාජෙට හැඩ ගැහෙන්නේ. ඔය මුරණ්ඩු වේගෙන එන වයස. ආදරෙන් ඒ මුරණ්ඩුකම අපි නැති කරමු. හැමදේකටම එපා කිව්වොත් එයා ඒවා හොරෙන් කරන්න හදයි**

නතාරි උයන වැඩවලටත් ආසයි. මාත් ඉතින් පුළුවන් පුංචි පුංචි වැඩවලට එයාව උදව් කරගන්නවා. ඒකෙන් මට එයා එක්ක වැඩියෙන් කාලේ ගත කරන්න ලැබෙනවා. තමන්ගේ අතින් වැරැද්දක් වුණත් ඒ වැරැද්ද වුණේ මගේ අතින් කියලා අම්මාට තාත්තාට ඇත්ත කියන්න පුළුවන් විදියට පුළුවන් තරම් ආදරෙන් තමයි දරුවො හදන්න ඕනේ. එතකොට කාට බොරු කිව්වත් අම්මාට තාත්තාට බොරු කියන්නෙ නෑ.

ඒ වගේම තමයි දරුවා කරන කියන හැමදේටම තහංචි නොදා, එපා නොකියා එයාලාට අත්දැකීම් ලබාගන්න දෙන්න ඕනේ. වැරදෙන්න දෙන්නත් ඕනේ. එතකොටයි එයාලා ඒවාගෙන් ඉගෙනගන්නේ. නොකළ යුතුම, නොසුදුසුම දේවල් හොඳ නෑ කියලා තරවටු නොකර තේරුම් කරන්න ඕනේ. දරුවාට දේවල් තනියෙන් කරන්න දීලා, බය නැති කරලා සමාජයේ ඕන තරාතිමක කෙනෙක් එක්ක සුහදව ඉන්න පුළුවන් විදියට දරුවා හදන්න ඕනේ. ඒත් මේ කිසි දෙයක් ලේසි නෑ. අමාරුයි. මාත් අත්දැකීම් ගොඩක් තියෙන අම්මා කෙනෙක් නෙවෙයි. මගේ දරුවන්ගෙන් එදිනෙදා ලැබෙන අත්දැකීම් එක්ක පරිණත වෙන අම්මා කෙනෙක්.


ගිය සුමානේ දවසක පුංචි සිද්ධියක් වුණා. දැන් ටික ටික ජපානේ සීත අඩුවෙනවා. දවල් වෙද්දී සෙල්සියස් අංශක 15ට 17 වගේ උශ්ණත්වය වැඩිවෙලා හවස වෙද්දි 6ට වගේ අඩු වෙනවා. ඉතින් නතාරි දූ උදේ ඉස්කෝලේ යන්න ලෑස්ති වෙලා එයාගේ සීතලට අඳින ජැකට් එක ඇඳගෙන යන්න බෑ කිව්වා. මම කීවා **"තාම සීතලයි, දාගෙන යන්න, අසනීප වෙයි"** කියලා. දැන් දූ බෑම කියනවා. පොඩි පොඩි මුරණ්ඩුකම් ඉතින් නැත්තෙම නෑ. පස්සේ මං ආදරෙන් කීවා **"හවස් වෙද්දී සීතයි, ඔයා එන වෙලාවට තවත් සීත වැඩියි, ඒ නිසා ජැකට් දාගෙන යන්න, මමා ඔයාගේ හොඳටනේ කියන්නේ"** කියලා. එහෙම කියද්දි ඔන්න මූණ බෙරි කරගත්තා. දහම් කිව්වා ළඟට ඇවිත් "හරි එහෙනම් ජැකට් එක නැතුව යන්න, එයාට සීතල නැතුව ඇතිනේ" කියලා.ඔන්න එතකොට හිනාවක් ඇවිත් බෑග් එකත් දාගෙන ගෙදරින් ගියා.

පස්සේ දහම් මට කීවා **"රෝසී, දැන් නතාරි ටික ටික ලොකු වෙනවා. එයාට හිතෙන දේවල් කරන්නයි එයා හදන්නේ. ජැකට් එක නැතුව යන එක වරදක් නෙවෙයිනේ. ගිහින් එන්න දෙන්න. ඒ අත්දැකීම එයාට ගන්න දෙන්න. සීතල නම් එයාම හෙට ජැකට් එක දාගෙන යාවි. ඔයා දරුවාගේ හොඳට කිව්වත් එහෙම බල කරද්දි ඒක එයාට වදයක් වෙනවා. හැමදේකටම එපා කියන්න එපා. එයාලට ඔහොම පුංචි පුංචි තීරණ ගන්න දෙන්න. පෙරේදා උදේ එයාගේ colours තියෙන බෑග් එක ඉස්කෝලේ පොත් ගෙනියන බෑග් එක ඇතුළෙන් දාන්න හැදුවා. මං කීවා colour බෑග් එක ලොකුයි දාන්න බෑ, අනික ස්කූල් බෑග් එකේ පොත් තියනවා කියලා. මං එහෙම කිව්වට නතාරිට ඇත්තටම එහෙම දාන්න බැරිද කියලා බලන්න ඕනකම තිබ්බා. මං ඉතින් කීවා 'හරි එහෙනම් පුළුවන්ද බලන්න' කියලා. එයාම දාන්න හදලා බැරි වුණාම colour බෑග් එක වෙනදා වගේ අතේ අරන් ගියා. ඒ වගේ පොඩි පොඩි දේවල් එයාටම කරලා බලලා තේරුම් ගන්න දෙන්න ඕනේ. ඒවා ලොකුවට හිතන්න ඕන දේවල් නෙවෙයි. ගිය සෙනසුරාදා මගෙන් සල්ලි ඉල්ලුවා කඩේට ගිහින් එන්න. මං දාහක් දුන්නා. නතාරි එයාට විතරක් නෙවෙයි නංගිටයි, මල්ලිටයිත් ඒ දෙන්නා ආස දේවල් ගෙනත් තිබ්බා. දරුවන්ට ජීවිතේ අත්දැකීම් ගන්න දෙන්න ඕන රෝසී, එතකොටයි එයාලා සමාජෙට හැඩ ගැහෙන්නේ. ඔය මුරණ්ඩු වේගෙන එන වයස. ආදරෙන් ඒ මුරණ්ඩුකම අපි නැති කරමු. හැමදේකටම එපා කිව්වොත් එයා ඒවා හොරෙන් කරන්න හදයි. එතකොට ඒක වැරදියි. එයාලා එක්ක යාළුවෝ වගේ ඉන්න තරමට එයාලා සතුට, දුක, ප්‍රශ්න හැමදේම අපි එක්ක බෙදාගනියි."** දහම් මට තව අලුත් පාඩමක් එදා කියලා දුන්නා වගේ තමයි මට දැනුණේ.

නතාරි කියන්නේ අපේ පළවෙනි දරුවා. මට එයාව දැනෙන්නේ මගෙයි දහම්ගෙයි ආදරේට පාට එකතු කරන්න ආපු සුරංගනාවියක් වගේ.

අම්මා කියන හැඟීම මට දැනුණේ නතාරි දූ නිසා. එයාගේ හොඳම යාළුවා වෙලා ජීවිතේ තේරුම් ගන්න එයාට උදව් කරන්නයි මට ඕනෙ. ඉස්සර මං ආස නතාරී පොඩියටම ඉන්නවාට. දැන් මං ආස එයා ලොකු වෙනවට. එයා නිසා විඳින අත්දැකීම් වටිනවා කියලා එයා එක්කම ඉඳන් එයාට තේරුම් කරන්න.

හෂිණී මනමේන්ද්‍ර



# ජ්... ජ්... කාටවත් කියන්නෙපා මගේ හස්බන්ඩ් මාර ගොඩයෙක්

දවසක් මගේ උපදේශන සේවයට ආවා කසුන් කියලා විවාහක තරුණයෙක්. ඔහු ටිකක් දුරබැහැරක කෙනෙක්. ඒ වගේම මහන්සිවෙලා උත්සාහයෙන් ජීවිතේ ජයගත්තු ව්‍යාපාරිකයෙක්.

ඉතින් වයස තිස් ගණනකුත් පනිනකල් කසුන් පරස්තාවක් ගැන හිතලා තිබුණෙ නැහැ. එහෙම ඉඳිද්දි ඔහුගේ මිතුරෙක් තමයි ඔහුට නිශාදිව යෝජනා කරලා තියෙන්නේ.

නිශාදි නගරබද පළාතක ජීවත් වුණු කෙනෙක්. ආර්ථික අතින් ඒ තරම් ස්ථාවර පවුලක නොවුණත් ඇය බොහොම රූමත්ලු. ඒ වගේම ඇගේ ගතිගුණත් හොඳයි කියලා හිතුණු නිසා කසුනුත් ඇයට කැමති වෙලා.

විවාහයෙන් පස්සේ මේ දෙපළ මහල් නිවාස සංකීර්ණයක පදිංචියට ගිහින්. ඔන්න එතැන ඉඳලා තමයි කතාව පටන්ගන්නේ.

මාසයක් දෙකක් යනකොට නිශාදි මහල් නිවාස සංකීර්ණයෙන් හිතවතුන් පිරිසක් ඇති කරගෙන. ඒ හැමෝම නවීන පන්නෙට ජීවත්වෙන ඉංග්‍රීසියෙන් කතාබහ කරන උදවියලු. ඉතින් ටික දවසකින් ඇයත් ඒ අය වගේ අඳින්න පළඳින්න, කතාබහ කරන්න විතරක් නෙමෙයි ඔවුන් එක්ක නිතරම එළිපහළියට යන්නත් පටන් අරන්. ඒ වගේම මේ පිරිස කසුන්ගේ නිවසේ නිතරම සාද පවත්වලත් තියෙනවා. ගොඩක් වෙලාවට ඒ දේවල්වලට වියදම් වෙලා තියෙන්නේ කසුන්ගේ මුදල්.

කසුන් ඒ තරම් සමාජශීලී පුද්ගලයෙක් නෙමෙයි. ඒ වගේම ඔහුට වැඩිය ඉංග්‍රීසි කතා කරන්නත් බැහැ. ඒ නිසා ඔහු මේ පිරිසට වැඩිය මුහුණදීලා නැහැ. ඒත් දවසක් මේ අයගේ බල කිරීමට කසුනුත් ඔවුන් එක්ක සුපිරි හෝටලයක රාත්‍රී කෑමට ගිහිල්ලා. හැඳි ගෑරුප්පු භාවිතය හුරු නැති නිසා කසුන් එතැනදී අතින් කෑම කන්න පටන් අරන්.

මේක දැකපු නිශාදි ඒ වෙලාවේ සෑහෙන පරල වෙලා තියෙනවා. අනිත් අයට නොපෙනෙන විදියට ඇය ඔහුව කොනිත්තලා පැත්තකට එක්කරගෙන ගිහිල්ලා, **"අර මිනිස්සු ඉස්සරහා මාව ලැජ්ජා කරන්න එපා ගොඩයෝ"** කියලා කසුන්ට බැනලා.

තමන්ගේ සහකරු අනිත් අය ඉදිරියේ අවමානයට පත් කරන්න කලින් දෙපාරක් හිතන්න වෙනවා

බිරිඳගේ හැසිරීම නිසා හිත රිද්දගත්තු කසුන් ඒ වෙලාවෙම ගෙදර ආවා කියලයි ඔහු කිව්වේ.

ඒ සිදුවීම නිසා කසුන් නැවතත් නිශාදිගේ යාළුවන්ට මුහුණදීලා නැහැ. ඒ වගේම මේ බිරිඳත් පස්සේ යාළුවන්ට ඔහුව හඳුන්වා දෙන්නත් මුණගස්වන්නත් අදිමදි කරලා තියෙනවා.

ඒ වගේම **"ඔයාව මට පොඞ්ඩක්වත් ගැලපෙන්නේ නැහැ. මම මහ මෝඩ වැඩක් කරගත්තේ"** වගේ කතාත් ඇය නිතරම කියනවා කියලා මේ සැමියා මාත් එක්ක කිව්වේ බොහොම කණගාටුවෙන්.

බිරිඳත් එක්ක කතා කරන්න ඉඩහසර හදලා දෙන්න පුළුවන් නම් මට මේ ප්‍රශ්නේ විසඳන්න පුළුවන් කියලා මම කසුන්ට කිව්වා.

ඔහොම මාසයක් දෙකක් ගතවෙනකොට කසුන් ඔහුගේ බිරිඳත් එක්ක නැවත මාව මුණගැහෙන්න ආවා. කිව්වා වගේම නිශාදි බොහොම රූමත් නවීන පන්නයට අඳින පළඳින ප්‍රියමනාප කාන්තාවක්. කසුන්ට ටිකක් එළියෙන් ඉන්න කියලා මම ඇයත් එක්ක කතා කරන්න පටන්ගත්තා.

**"මම හරිම සමාජශීලී කෙනෙක්. ඒ වුණාට මගේ හස්බන්ඩ් මාර ගොන්. මෙයාව අනිත් මිනිස්සුන්ට පෙන්නන්නත් ලැජ්ජයි."** කියලා කටත් උලුක් කර කර අමුතු ස්වරයකින් තමයි ඇය මාත් එක්ක කිව්වේ.

හැම මනුස්සයෙක්ටම හැමදේම බැහැනෙ. හැබැයි ඒ දේවල් ඉගෙනගන්න පුළුවන්. ඉතින් සැමියට ඉංග්‍රීසි කතා කරන හැටි, හැඳි ගෑරුප්පු පාවිච්චි කරන හැටි එහෙම උගන්වන්න උත්සාහ කළාද කියලා මම ඇගෙන් ඇහුවම ඇය කිව්වේ **"අනේ ඕවට මට වෙලාවක් නැහැ"** කියන එකයි.

වෙලාවක් නැතිකමටත් වඩා ඇයට එහෙම උවමනාවක් තිබිලා නැහැ. සැමියව සමාජයට පෙන්නන එක ලැජ්ජාවක්, මදිපුංචිකමක් වුණත් සැමියට බැරි ඒ දේවල් තමන්ට පුළුවන් කියන එක තුළිනුත් ඇය මානසික තෘප්තියක් ලබාගන්න බව තමයි මට තේරුණේ.

ටිකක් වෙලා කතා කරනකොට ඇගේ ස්වරය වෙනස් වෙන බව මට තේරුණා. ඊටපස්සේ ඇය ඇගේ ජීවිතේ බොහොම සංවේදී සිදුවීම් කිහිපයක්ම අඬ අඬා මාත් එක්ක කිව්වා.

මේ බිරිඳ පුංචි කාලේ ඉඳලා දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණදීපු යුවතියක්. ඒත් අධ්‍යාපන කටයුතු හොඳට කරගෙන කවදාකහරි ධනවත් පුද්ගලයෙක් එක්ක විවාහ වෙනවා කියන හීනයත් ඇගේ හිතේ තිබුණාලු. මේ මංගල යෝජනාවට එකපයින් කැමතිවෙලා තියෙන්නෙත් ඒකයි.

ඉතින් ඇය කැමති විදියේ ජීවිතයක් ඇයට ලැබිලා තියෙන නිසා සැමියා එක්ක ආදරණීය විවාහ ජීවිතයක් ගත කරන්න ඕනේ කියන එක මම ඇයට පැහැදිලි කළා. පස්සේ ඇයත් ඒ දේවල් පිළිගත්තා. මගේ ඉදිරියේදීම ඇය සැමියගෙන් සමාව පවා ඉල්ලුවා.

ඉංග්‍රීසි කතා කරන්න බැරි නිසා හෝ හැන්දෙන් ගෑරුප්පුවෙන් කන්න බැරි නිසා හෝ වෙන මොකක්ම හරි අඩුපාඩුවක් නිසා සැමියව/බිරිඳව පහත් කරන සහ සමාජයට පෙන්නන්න පැකිළෙන මේ වගේ අය ඕනතරම් ඉන්නවා.

දෙන්නෙක් විවාහ වෙන්නේ දුර ගමනක් එකට යන්න. එතැනදි සහකරුවගේ මොන අඩුපාඩුව තිබුණත් ඔහුගේ/ඇයගේ අතින් අල්ලගෙන මේ ඉන්නේ මගේ සැමියා/බිරිඳ කියලා කියන්න පුළුවන් තැන තමයි ආදරේ තියෙන්නේ.

තවත් සමහරු ඉන්නවා තමන්ගේ සහකාරයාගේ අඩුපාඩු පිට මිනිස්සු ඉස්සරහත් කියවන. වෘත්තීය මනෝ උපදේශිකාවක් විදියට මම නම් කියන්නේ **"ඔයාගේ ඇඳුම හරි නෑ, කොණ්ඩේ ඇදයි, මේකප් වැඩියි"** වගේ පුංචි දෙයක්වත් පිට අය ඉස්සරහා කියන්න එපා. ඒකෙන් අර සැමියා/බිරිඳ වගේම අනිත් පුද්ගලයත් අපහසුතාවයට පත්වෙන්න ඉඩ තියෙනවා.

මතක තියාගන්න කෙනෙක් තමන්ගේ සහකරුවගේ අඩුපාඩුවලට හිනාවෙනවා නම් ඒ හිනාවෙන්නේ තමන්ටමයි. මොකද සැමියා/බිරිඳ කියන්නේ තමන්ගේම තෝරාගැනීමක්. ඉතින් අර හිනාවෙන්නේ තමන්ගේම තෝරාගැනීමටනේ.

අනිත් දේ තමයි මේ වගේ අය ගැන සමාජයෙත් වැරදි චිත්‍රයක් ඇතිවෙන්න වැඩි වෙලාවක් යන්නේ නැහැ. මොකද තමන්ගේම සහකරුගේ අඩුපාඩු හොයන කෙනාට පිටස්තරයෙක්ගේ අඩුපාඩු හොයන එක මහ කජ්ජක්ද?

සාමාන්‍යයෙන් බිරියන්ටත් වඩා මේ වැඩේ කරන්නේ සැමියන්. **'තමන්ගේ බිරිඳව කිසිම විටක නින්දාවට අවමානයට පත් නොකළ යුතුයි'** කියලා සිඟාලෝවාද සූත්‍රයෙත් සඳහන් වෙනවා.

සාමාන්‍යයෙන් කාන්තාවන්ට තාක්ෂණය සම්බන්ධ කාරණා වටහාගන්න ටිකක් අපහසුයි. ඒ ඔවුන්ගේ මොළයේ ස්වභාවය. ඔය වගේ කාරණාවලදිත් සමහර සැමියන් **"අපෝ ඔයා මොනවද අනේ දන්නේ"** වගේ කතා කියනවා.

'තමන්ගේ බිරිඳව කිසිම විටක නින්දාවට අවමානයට පත් නොකළ යුතුයි' කියලා සිඟාලෝවාද සූත්‍රයෙත් සඳහන් වෙනවා

දුරදිග නොහිතා කියන ඒ වගේ පුංචි දේකින් වුණත් කෙනෙක්ගේ ආත්ම අභිමානයට හානියක් ඇතිවෙන්න පුළුවන්. කාන්තාවොත් ඉන්නවා සැමියට උයන්න, තේ ටිකක් හදාගන්න දන්නේ නැහැ කියලා ඔහුව නිතර ලැජ්ජාවට පත්කරන.

මම කියන්නේ සැමියා/බිරිඳ නොදන්න දේවල් ගැන ඔවුන්ට ආදරෙන් උගන්වන්න. එහෙම නැතුව මම දන්න දේ එයා දන්නේ නැහැ කියලා ඒක කියව කියවා ලොකුකමක් පෙන්නන්න නැත්නම් අපි කතාවට කියනවා වගේ පොර වෙන්න දඟලනවා නම් වෙන්නේ නැති ප්‍රශ්න ඇතිවෙන එක විතරයි කියලත් මතක තියාගන්න.



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
රත්නා පුෂ්ප කුමාරි

සෙව්වන්දි හෙට්ටිආරච්චි


මාසෙටම තේ බොන්න
රු. 255ක් පමණයි !
STEUARTS
රෝස කහට
රස නහර පුබුදයි
200g
STEUARTS
රෝස කහට
රස නහර පුබුදයි
තේ
PURE CEYLON TEA PACKED IN SRI LANKA
ග්‍රෑම් 200න් කෝප්ප 100ක්
ඔබත් අදම මිලදී ගන්න!
තොග අවසන් වනතුරු පමණයි!



# කූඹි තුඩක වරදටත් තඩි බෑවම කොටියා කෑවත් ඇවිල්ලා කියයිද?

"ටීචර්, මම මේ කියන්නමයි හිටියේ. අපේ දුව ගැන පොඩ්ඩක් අවධානයෙන් ඉන්න. පොඩි වයසට නෙවෙයි මෙයා බොරු කියන්නේ"

පංතියේ පාඩුවේ ඉන්න සාරංගාගේ අම්මා එහෙම ඇවිල්ල කියද්දී සංගීතා ටීචර්ට පුදුමත් හිතුණා.

"ඇයි සාරංගාගේ අම්මා එහෙම කියන්නේ?"

සංගීතා ඇහුවා.

"ටීචර්ට කියන්න පහුගිය සිකුරාද මම මේ ළමයව ඉස්කෝලෙට එව්වෙ ඉන්ටර්වල් එකේ සෙල්ලම් කරන්න යන්න එපා කියලා පුළුවන් තරම් කියලා."

සාරංගාගේ අම්මා එහෙම කියද්දි සංගීතා ඇය දිහා බැලුවේ පුදුමයෙන් වගේ.

හය වසරේ ඉන්න පුංචි දරුවෙක්ට සෙල්ලම් කරන්න එපා කියලා එව්වේ ඇයි? සංගීතා ටීචර්ට හිතුණා. ඒත් ඇය සාරංගාගේ අම්මට කතා කරන්නට ඉඩ දීලා බලාගෙන හිටියා.

"සාරංගා ඉස්කෝලේ ඇරිලා ගෙදර එනකොට තමයි මම දැක්කේ සාරංගාගේ ගවුමේ පිටේ තිබ්බ හිල. ගවුමේ පදසයක්ම ලොකුවට ඉරිලා. මොකද වුණේ කියලා අහද්දි මේ ළමයා කිව්වා දන්නෙ නැහැ කියලා.

අනේ ඉතින් මාත් මෝඩයා වගේ ඒක විශ්වාස කළා. මම හිතුවේ මෙයා නොදැනුවත්ව කොහේ හරි පැටලිලා ගවුම ඉරිලා කියලා."

"ඉතිං?"

සංගීතා පුදුමයෙන් වගේ ඇහුවා.

"ඉරිදා දවල් තමයි මම දැනගත්තේ සිද්ධ වෙච්ච දේ. අපේ ගෙදරට එහා පැත්තේ ඉන්නේ මෙයාට වඩා අවුරුදු දෙකක් වැඩිමල් ළමයෙක්. ඒ ළමයා ඉන්නේ මේ ඉස්කෝලෙමයි. ඒ ළමයා අපේ ගෙදර ආවා අලුවා දීසියක් අරගෙන. ඒ ඇවිල්ලා සාරංගාගෙන් ඇහුවා එදා ගවුම ඉරුණා නේද කියලා. මම ඉතින් හාර අවුස්සලා ඇහුවා. කොහොමද ඒ ළමයා අපේ දුවගෙ ගවුම ඉරුණු බව දන්නේ කියලා.

ඒ ළමයා කිව්වා සාරංගා සෙල්ලම් කර කර ඉන්න ගමන් ඒ ළමයගෙ පන්තියේ ජනේලේ ගාවට ඇවිත් හේත්තු වුණාලු. ආපහු ඉස්සරහට යනකොට ජනෙල් කොක්කේ ගවුම පැටලිලා ඉරුණාලු. ඒ ළමයා යනකම් ඉඳලා මම සාරංගාට හොඳටම දෙස් කිව්වා. පාරවල් දෙකකුත් ගැහුවා. මම කියන්නේ ටීචර් පොඩිකමට ඔහොමත් බොරු කියන්න හොඳයිද?"

ඇය සංගීතාගෙන් ඇහුවා.

"පොඩ්ඩක් ඉන්න සාරංගාගේ අම්මේ. ඇයි එදා සාරංගාට සෙල්ලම් කරන්න එපා කිව්වේ?"

"සාරංගාට පොඩි හෙම්බිරිස්සාවක් වගේ තිබුණා. දුවිලි ගොඩේ සෙල්ලම් කරන්න ගිහින් හෙම්බිරිස්සාව වැඩි වෙයි කියලා තමයි එහෙම කිව්වේ..."

සාරංගාගේ අම්මා කිව්වා.

සංගීතාට පොඩ්ඩක් විතර හිනා යන්නත් ආවා. ඒත් ඇය හිනාව නවත්තගෙන සාරංගාගේ අම්මගෙන් මෙහෙම ඇහුවා.

"දුවට වීස් එක තියෙනවද?"

"අපෝ නැහැ."

"එහෙනම් පීනසය තියෙනවද?"

"නැහැ ටීචර්. ඇයි එහෙම අහන්නේ?"

අන්න එතකොට නම් සංගීතා ටීචර් සාරංගාගේ අම්මට පේන්නම හිනා වුණා.

"සාරංගාගේ අම්මෙ, හොඳට ඉන්න දරුවොත් බොරු කියන්න පුරුදු වෙන්නේ දෙමව්පියන්ගෙම වැරදි නිසා. දරුවෝ බොරු කියන්නෙ දඬුවමට බය නිසා. අනිත් එක හෙම්බිරිස්සාව කියන්නේ සාමාන්‍ය ලෙඩක්නේ.

ඒ වගේ දෙයක් නිසා මේ හය වසරේ සෙල්ලම් වයසේ ඉන්න දරුවෙක්ට සෙල්ලම් කරන්න එපා කියලා ඉස්කෝලෙ එවන එක ගැලපෙන්නේ නැහැ නේද? අනිත් එක හැම පුංචි දේටම දඬුවම් කරන්න ගියාම දරුවෝ බයට බොරු කියනවා තමයි.

දෙමව්පියො ඉන්න ඕනේ දරුවොත් එක්ක යාළුවෝ වගේ.

දෙමව්පියෝ කියන්නේ දරුවන්ට බය හිතෙන වචනයක් නම් දරුවෝ තමන්ගේ ඇත්ත දෙමව්පියන්ගේ ඉස්සරහා දිග අරින්න බය වෙනවා. ඉතින් ඒකට දරුවන්ට බැනලා වැඩක් නැහැ."

සංගීතා ටීචර් පැහැදිලි කරද්දී සාරංගාගේ අම්මා නිහඬ වුණා.

**සමාධි ඩයස්**



කණ්ඩායම් නායිකා අමදිනී සත්සරණී

# අහම්බෙන් දැකපු වීඩියෝ එකක් නිසා තාත්තයි දුවයි ගිය දුරක්

දිනක් නිවාඩු පාඩුවේ යූටියුබ් වීඩියෝ නරඹමින් සිටියදී හරි අපූරු වීඩියෝවක් නිමල් කරුණාසේන මහතාගේ නෙත ගැටුණේය. එය කුඩා විදෙස් දැරියක් ඉතා දක්ෂ ලෙස ඩ්‍රම්ස් වාදනය කරන වීඩියෝවකි. ඒ වයසේම දියණියකගේ සෙනෙහෙබර තාත්තා කෙනෙකු වූ ඔහුට තමන්ගේ දුව ගැනද එවැනි හීනයක් නොමැවුණාම නොවේ. ඒ නිසා ඔහු එක්වරක් නොව කිහිපවරක්ම ඒ වීඩියෝව නැරඹුවේය.

"මං ඒ දැරිය ගැන විස්තර හොයලා බලද්දී දැනගන්න ලැබුණා ඇය මැලේසියාවේ දැරියක් කියලා. නම නූර් අමීරා ෂරියා. ඒ දුවව දැකපු ගමන් මට මතක් වුණේ මගේ දුව. මොකද එයත් නූර් අමීරාගේ වයසෙමයි."

එදා, මැලේසියාවේ සිටින මේ පුංචි කෙල්ලව තමන්ගේ දුවට පෙන්නන තෙක් මේ තාත්තාට ඉස්පාසුවක් තිබුණේ නැත. විටින් විට නිවසේ ඉස්තෝප්පුවට පැමිණෙමින් ඔහු මග බැලුවේ දුව පාසල් ගොස් නැවත පැමිණෙන්නේද කියාය.

"මගේ දුව අමදිනී සත්සරණී. එදා එයා ඉස්කෝලෙ ඇරිලා ගෙදර ආපු ගමන්ම මම කළේ අර ඩ්‍රම්ස් ගහන ගෑනු ළමයගේ වීඩියෝ එක දුවට පෙන්නපු එක. පුදුමෙ කියන්නෙ ඒක දැකපු ගමන් එයාටත් ඒකට හිත ගියා. පස්සේ එයාම මට කිව්වා තාත්තේ ඩ්‍රම්ස් සෙට් එකක් තිබුණා නම් මටත් ඔය වගේ වෙන්න තිබුණා කියලා."

අමදිනී කියූ කතාව ගැන නිවී සැනසිල්ලේ සිතූ නිමල් මහතාට සිතුනේම දියණියගේ ආශාව ඉටුකරන්නටය. තාත්තලා කොහොමත් එහෙමය. ඒ නිසා දින කිහිපයක් ඇතුළත අමදිනීට අලුත්ම ඩ්‍රම් සෙට් එකක් ලැබිණි.

"තාත්තා මට නූර් අමීරා ඩ්‍රම්ස් ගහන වීඩියෝ එක පෙන්නද්දි මටත් ඩ්‍රම්ස් ගහන්න ආසාවක් ඇතිවුණා. පස්සේ මං තාත්තට ඒ ගැන කිව්වම තාත්තා ඔන්න එයා වගේ වෙන්න කියලා ඩ්‍රම්ස් සෙට් එකක් ගෙනැත් දුන්නා."

එදා පටන් ඇය අධ්‍යාපන කටයුතු කරන අතරවාරයේම ඩ්‍රම්ස් ගැහිල්ලද පටන් ගත්තාය. ඇගේ වාසනාවටදෝ ඒ වනවිටත් ඇයට අපූරු ගුරුවරයෙකු ලැබී තිබුණි. ඒ චින්තක නාමල්ය. අමදිනීට ඩ්‍රම්ස් වාදනය හුරුකිරීමේ වගකීම ඔහු සතුටින් බාරගත්තේය.

ඔය අතරවාරයේ තවත් අපූරු සිදුවීමක් සිදුවිය. ඒ අමදිනීගේ නිවස අහළ පහළ සිටි ඇගේ වයසේ දැරියන් ඇය ඩ්‍රම්ස් වාදනය කරන ආකාරය බැලීමට ඇගේ නිවසට පැමිණීමයි. තම දුවගේ හපන්කම් බැලීමට ආ එම දරු පැටවුන් දුටු විට නිමල් මහතාට තවත් අලුත් අදහසක් පහළ විය.



අමදිනීගේ පියා නිමල්

"දුව ඩ්‍රම්ස් ගහද්දි දුවගේ වයසේ ඉන්න අහල පහල දුවලා ඇවිත් හරි ආසාවෙන් බලන් ඉන්නවා. ඔය අතරේ මට හිතුණා මේ ළමයි සංගීතයට මෙච්චර ආසයි නම් එයාලගේ ආසාවටත් ඉඩක් හදලා දෙන්න ඕනේ කියලා. ඒත් ඒක කරන්නේ කොහොමද කියලා නම් අදහසක් තිබුණෙ නෑ."

දින කීපයක් ඒ ගැන සිතූ නිමල් මහතාට කදිම අදහසක් පහළ විය. ඒ චින්තක සර්ගේ උදව්වද ඇතිව අමදිනීගේ නායකත්වයෙන් පුංචි සංගීත කණ්ඩායමක් නිර්මාණය කිරීමයි.

"මේ වෙනකොට ලංකාවේ පිරිමි සංගීත කණ්ඩායම් සෑහෙන්න තියෙනවනේ. ඒත් ගෑනු ළමයි විතරක් ඉන්න සංගීත කණ්ඩායම් අඩුයි. ඒක නිසා වෙනසක් කරන්නත් එක්කයි සංගීත කණ්ඩායමට ගෑනු ළමයි විතරක්ම ගන්න හිතුවේ. එහෙම හිතලා අරගත්ත කිසිම ළමයෙකුට සංගීතය ගැන කිසිම දැනුමක් තිබුණේ නෑ. ඒත් චින්තක සර්ට පුළුවන් වුණා ළමයි ටික හදලා ගන්න."

කෙටි කලක් එක දිගට ලැබූ පුහුණුවෙන් පසු ඔවුන්ද කදිමට වැඩේ අල්ලාගත්හ. ඒ නිසා ඊළඟට ඔහු කළේ දියණියගේ සංගීත කණ්ඩායමට නමක් යෝජනා කිරීමයි. සුදුසු නමක් දස අතේ කල්පනා කළද එවන් නමන් හිතට ආවේම නැත. ඒ නිසා නිතර නිතරම හිතට ආ 'ජිප්සි ගර්ල්ස්' යන නම අවසානයේ අමදිනීගේ සංගීත කණ්ඩායමේ නම බවට පත්විය. එහෙත් ඒ නමට අමදිනීලාට ලැබෙන්නට ගත්තේ අමුතුම ප්‍රතිචාරයි.

"මුලින්ම සංගීත කණ්ඩායමට දැම්මේ ජිප්සි ගර්ල්ස් කියලා. සිංහලෙන් ඒ නමේ තේරුම අහිගුණ්ඩික කෙල්ලෝ කියන එක නිසා සමහරු ඒ නම කියලා අපිට විහිළු කළා.

පස්සේ තාත්තා අපි කාගෙත් හොඳට කියලා ඒ නම අයින් කරලා 'බාබි ගර්ල්ස් කියලා දැම්මා. ඒත් ඒ නම වැඩිය හිතට ඇල්లුවේ නෑ. අවසානේ බැබලෙන ගෑනු ළමයි කියන අදහසින් සංගීත කණ්ඩායමට 'ශයිනි ගර්ල්ස්' කියලා නම තිබ්බා.අපි මුල්ම ප්‍රසංගය කළේ කොස්ගම. එදා තමයි මගේ ජීවිතේ සතුටුම දවස. අපි නටන්න ගීත ගායනා කළත් බලන්න ආපු අය නටනවා වෙනුවට කළේ පුදුමයෙන් වගේ අපි දිහා බලන් හිටපු එක. මොකද අපි හැමෝම ගෑනු ළමයි නිසා ඒක එයාලට වෙනස්ම අත්දැකීමක් වුණා."

අලුත් අවුරුදු සමය නිසා මේ දිනවල සංගීත කණ්ඩායම්වලට ඇත්තේ දැවැන්ත ඉල්ලුමකි. ඒ නිසා අමදිනීගේ සංගීත කණ්ඩායමද මේ දිනවල අතිශය කාර්යබහුලය. එසේම සංගීත සංදර්ශන සඳහා යනවිට මේ ගැහැනු දරුවන්ගේ ආරක්ෂාව ගැන හිතන්නටත් දෙමාපියන් අමතක කොට නැත.

"ප්‍රසංගයකට යනකොට අනිවාර්යයෙන්ම ගෑනු ළමයින්ගේ දෙමව්පියෝ කීපදෙනෙක් අපි එක්ක යනවා. ඒ වගේම මෙයාලට ප්‍රසංගයක් අතරතුරේ සිදුවෙන්න පුළුවන් ගැටලු ගැන කියලා උපදෙස් මාලාවක් දීලයි තියෙන්නේ. ඒක නිසාම අද වෙනකල් කිසිම ප්‍රශ්නයක් වෙලා නෑ. ඇත්තටම කිව්වොත් මෙයාලට මිනිස්සු ආදරෙයි. ප්‍රසංගය වෙලාවෙත් සමහරු කෑමබීම එහෙම ගෙනැත් දෙනවා."

ඇහැලියගොඩ 'ශයිනි ගර්ල්ස්' සංගීත කණ්ඩායමට අපේද සුබපැතුම් එක්කරමින් අපි කතාබහ නිම කළේ ඔවුන්ගේ සංගීතවත් සංග්‍රයක්ද සමඟිනි.



ශයිනි සංගීත කණ්ඩායමේ අනෙකුත් සාමාජිකාවන්

**රුවන් එස්.සෙනවිරත්න**



# සැපතිල්ලා යුෂ

### අවශ්‍ය ද්‍රව්‍ය

- ඉදුණු සැපතිල්ලා (ඇට සහ පොත්ත ඉවත් කරගත්) ගෙඩි 8
- වතුර (උතුරවා නිවාගත්) අඩුකොප්ප 4
- සීනි මේස හැඳි 4
- ලුණු රස අනුව

### සාදන ක්‍රමය

- සියල්ල එකට දමා බ්ලෙන්ඩ් කර, පෙරා, ශීතකර පානය කරන්න.



ගල්කිස්ස මහ හෝටලයේ ආහාර හා ප්‍රවර්ධක අධ්‍යක්ෂ
**ආචාර්ය පබ්ලිස් සිල්වා**
ඉදිරිපත් කරයි

සම්බන්ධීකරණය - ගල්කිස්ස මහ හෝටලයේ **නිමාකෝ ද සිල්වා**



# බිලිං ව්‍යංජනය

### අවශ්‍ය ද්‍රව්‍ය

- බිලිං 200g
- රතුලූනු 30g
- අමුමිරිස් කරල් 3
- රම්පේ අඟල් 1/4 කැබැල්ලක්
- කුරුඳු අඟල් 1/4 කැබැල්ලක්
- මිරිස් කුඩු තේ හැඳි 2
- කහකුඩු තේ හැඳි 1/4
- කරි කුඩු මේස හැඳි 1
- උම්බලකඩ කුඩු මේස හැඳි 1
- මිටිකිරි අඩුකෝප්ප 2
- උළුහාල් ඇට 2
- ලුණු රස අනුව
- කරපිංචා

### සාදන ක්‍රමය

- බිලිං හතරට කපා සෝදා මිරිකා පසෙකින් තබන්න.
- අනෙකුත් ද්‍රව්‍ය කලවම් කර විනාඩි 2ක් පමණ තැම්බෙන්නට හරින්න.
- එයට බිලිං එක්කොට ඉස්ම හිඳෙනතුරු මදගින්නේ පිසගන්න.

# එළු මස් සුප්



### අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| කටු සහිත එළු මස් | 500g |
| අර්තාපල් | 100g |
| කැරට් | 100g |
| ලීක්ස් සුදු කොටස | 50g |
| සැල්දිරි දඬු | 100g |
| රතුලූනු | 100g |
| සුදුලූනු | 20g |
| බාර්ලි | 20g |
| ගම්මිරිස් ස්වල්පයක් | |
| ලුණු රස අනුව | |
| වතුර | 6L |

### සාදන ක්‍රමය

- එළු මස් කටු සමඟ පොඩියට කපාගන්න.
- වතුර ලිප තබා උතුරන විට කපාගත් එළු මස් දමා විනාඩියක් පමණ තම්බා, පෙරා, සෝදාගන්න.
- පසුව භාජනයක් ලිප තබා මාගරින් දමා රත් වූ පසු කපාගත් එළවළු එක්කොට තරමක් බැදෙන්නට හරින්න.
- එළු මස් එයට දමා, බාර්ලිද දමා මද ගින්නේ පැයක් පමණ තම්බාගන්න.
- ලුණු සහ ගම්මිරිස් එක්කර ලිපෙන් බාගන්න.

# ගොටුකොළ සුප්



### අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| ගොටුකොළ | 250g |
| සුදුලූනු | 40g |
| අර්තාපල් | 40g |
| සුදුහාල් | 40g |
| මාගරින් | 30g |
| රතුලූනු | 20g |
| සැල්දිරි | 20g |
| ලීක්ස් | 20g |
| කිරි | 50ml |
| වතුර | 3L |
| ගම්මිරිස් රස අනුව | |
| ලුණු රස අනුව | |

### සාදන ක්‍රමය

- ගොටුකොළ වංගෙඩියේ දමා කොටා වතුර ස්වල්පයක් මිශ්‍රකර යුෂ මිරිකාගන්න.
- දැන් භාජනයක් ගෙන මාගරින් සමඟ ලූනු, සුදුලූනු, සැල්දිරි, ලීක්ස් දමා තරමක් බැදෙන්න හරින්න.
- ඉන්පසු පොඩියට කපාගත් අල සහ සුදුහාල්වලට වතුර ලීටර් 3ක් එක්කොට ගොටුකොළ රොඩු සමඟ පැයක් පමණ මදගින්නේ තම්බාගන්න.
- ඉන්පසුව මෙය බ්ලෙන්ඩරයකට දමා කොටගෙන හෝ නෑඹිලියේ හොඳින් පොඩිකර තරමක් හිල් ලොකු පෙනේරයකින් පෙරාගන්න.
- නැවත ලිපේ තබා උතුරන විට උඩට එන පෙණ අස්කර කිරි සහ ගොටුකොළ ඉස්ම දමා රත්කර ලුණු සහ ගම්මිරිස් දමාගන්න.

✦ නිවිති, පොල්පලා, මොණරකුඩුම්බිය, හාතාවාරිය, මුකුණුවැන්න, සැල්දිරි, හීන්බෝවිටියා, වැල්පෙනෙල, ඇඹුල් ඇඹිලිය, සාරණ, ඉරමුසු සුප් මේ ආකාරයට සාදගත හැක.



# මැකරල් අච්චාරු

### අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| මැකරල් (ළපටි, කොළ පැහැති) | 500g |
| අබ (විනාකිරෙන් අඹරාගත්) මේස හැඳි | 3 |
| රතුලූනු (සිහින්ව ලියාගත්) | 50g |
| අමුමිරිස් (සිහින්ව දිගට ලියාගත්) කරල් | 10 |
| විනාකිරි අඬුකෝප්ප | 1 |
| සීනි මේස හැඳි | 1 |
| කහකුඩු තේ හැඳි | 1/2 |
| ලුණු තේ හැඳි | 1 |
| ගම්මිරිස් කුඩු තේ හැඳි | 1 |

### සාදන ක්‍රමය

- මැකරල් සුද්ද කර අඟල් 1/2 කැබලි කපාගන්න.
- දැන් ඒවා විනාකිරෙන් උණුං ගස්සාගන්න.
- ඉන්පසුව භාජනයකට අබ, සීනි, කහ, විනාකිරි ගම්මිරිස්, ලුණු, අමුමිරිස්, ලූනු දමා මිශ්‍ර කර රස බලා මැකරල් කැබලි දමා දවසක් තිබෙන්න හැර පාවිච්චියට ගන්න.



# නෙළුම් අල කැනපි

### අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| නෙළුම් අල (විනාකිරෙන් පදම් කළ) | පෙති 50 |
| බටර් | 50g |
| පාන් (අඟල් 1/2 ඝනකමට රවුම් කපා ටෝස්ට් කරගත්) | 50g |
| ලොකු ගොටුකොළ | 30g |
| කට්ට සම්බෝල අඬුකෝප්ප | 1 |

### සාදන ක්‍රමය

- පළමුව පාන් රවුම්වල බටර් ගාගන්න.
- ගොටුකොළ 1 බැගින් පාන් පෙති මත තබන්න.
- ඊට උඩින් නෙළුම් අල පෙති 2ක් තබා ඒ මත කට්ට සම්බෝල ස්වල්පය බැගින් තබා පාවිච්චියට ගන්න.



# බටර් සහ පාන් පුඩිම

### අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| පාන්පෙති | 250g |
| බටර් | 100g |
| කිරි | 500ml |
| සීනි | 75g |
| බිත්තර | 4 |
| වැනිලා තේ හැඳි | 1 |
| කජු | 50g |
| සුල්තානා | 50g |

### සාදන ක්‍රමය

- පාන්පෙතිවල බටර් ගා වාටි කපා හරහට දෙකට කපාගන්න.
- බිත්තර, සීනි සහ කිරි එකට කලවම් කර පෙරාගන්න.
- පුඩින් බෝල් එකක් ගෙන පාන් එහි අසුරාගන්න.
- සාදගත් කිරි, සීනි, බිත්තර මිශ්‍රණය අතුරා ඇති පාන්වලට උඩින් වක්කරන්න.
- කජු සහ සුල්තානා ඊට උඩින් දමන්න.
- බටර් ටිකක් ඊට උඩින් දමාගන්න.
- ඉන්පසු තැටියක් ගෙන මිශ්‍රණය එයට දමා එම තැටිය තවත් වතුර දමන ලද තැටියක් මත තබා උදුනක දමා උෂ්ණත්වය 170C-200C විනාඩි 40ක් පමණ බේක් කරගන්න.



# වරකා පුඩිම

### අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| වරකා මදුලු | 25 |
| සීනි | 150g |
| කස්ටඩ් පවුඩර් | 50g |
| මාගරින් | 30g |
| පිටි | 50g |
| වියළි මිදි | 50g |
| කිරි අඩුකෝප්ප | 2 |
| කුරුඳු පොතු කැබැල්ලක් | |
| වතුර ස්වල්පයක් | |

### සාදන ක්‍රමය

- වරකා අඟල් 1/2 පළල තීරු කපාගන්න.
- එයට කිරි, කුරුඳු, කජු, වියළි මිදි සහ සීනි 100gක් එක්කොට තම්බන්න.
- එය උතුරන විට වතුරේ දියකරගත් කස්ටඩ් පවුඩර් කලවම් කර උකුවන තරමට දන්න.
- ඊට පසු එය බඳුනකට දමා පසෙකින් තබා පිටි, මාගරින් සහ ඉතිරි සීනි එක්කොට වැලි මෙන් කැටි ගසාගන්න. දැන් එය සාදගත් වරකා මිශ්‍රණය මත අතුරන්න.
- පෝරණුවේ දමා පාට ගස්වාගන්න.
- උදුනක් නොමැති නම් පළමුව වැලි මෙන් සාදගත් මිශ්‍රණය සාස්පානක දමා පාට ගස්වා වරකා මිශ්‍රණයට උඩින් අතුරන්න.

# උපන්ගෙයි හපන්කම් තිබිලත් කලා ලෝකේ නමක් හදාගන්න බැරි ඇයි?

හැඩට නටන කෙලි පොඩ්ඩියෙක්, රහට ගයන කොලු පොඩ්ඩෙක් පවුලක ඉන්නවා නම් ඒ පවුලේ අය මේ පොඩ්ඩන්ගේ හැකියාවත් එක්ක අනාගතය ගැන හීන දකිනවා. **“ඔන්න බලන්න කෙල්ල කවදහරි නිළියක් වෙලා තමයි නවතින්නේ. දක්ෂකම විතරක් නෙමෙයි ඒකට හරියන හැඩරුවත් තියනවානේ.” “අම්මේ... අමරදේව මාස්ටර් ආයෙ ඉපදිලා වගේ ඇස්වහක්, කටවහක් නැහැ කොල්ල කවද හරි නොම්මර එකේ ගායකයෙක් වෙනවා.”**

පුංචි කාලේ ඥාති හිත මිත්‍රාදීන් මේ වගේ අනාවැකි පළ කළත් ඒ අනාවැකි හරියන්නේ එහෙමත් කෙනෙක්ගෙ විතරයි.

නිළියක්, නර්තන ශිල්පියෙක්, ගායකයෙක් තරමටම දක්ෂතාවය තිබුණත් ඒ ගොඩක් අය කැලේ පිපුණ මල් ගානට කැලේම පරවෙලා යනවා. ඒත් සමහර අය හිතාගන්නවත් බැරි මොහොතක මතු වෙනවා. තමන්ගේ දක්ෂකම පෙන්නනවා විතරක් නෙමෙයි ජනප්‍රියත්වයේ හිනිපෙත්තටම නගිනවා. සමහරවිට එයත් එක්ක එක බත් එක කාපු, එකට නටපු, එකම දක්ෂකම තියෙන අනිත් යාළුවා මග හැලෙනවා. එයාට දක්ෂකම තිබුණට යාළුවට වගේ ජනප්‍රිය වෙන්න වාසනාව නැති වෙනවා. සමාන හැකියාවන් තියෙන අයට දෛවය හැඩි දෙකකින් බෙදන්නේ කොහොමද? ඇයි එහෙම වෙන්නේ? සමහරු ඒකට වාසනාව අවාසනාව පටලවා ගන්නවා. තවත් අය දෛවය පටලවා ගන්නවා. නමුත් නාම ශාස්ත්‍රයට අනුව එහෙම වෙන්නේ නමේ වැරැද්දක් නිසා කියලයි නාම හා ශබ්ද ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක දිනාරංග පවසන්නේ.

**“සමහර නම්වල කලාවට ඉතා හොඳ පිහිටීම් තියෙනවා. නමක ඒ පිහිටීම තුන්වෙනි සූත්‍රයේ නමකට වැටුණොත් යෝගයක් වෙනවා. එහෙම අය නර්තනයට, ගායනයට, රංගනයට, නිවේදනයට මේ වගේ කලා කටයුතුවලට හරිම දක්ෂයි. දක්ෂකම කොයිතරම් තිබුණත් සමහර අය මතුවෙන්නේ නැහැ. උදහරණයක් විදියට නර්තන පංතියක නර්තනයට හුඟාක් දක්ෂ ළමයා වෙනුවට පසුකාලීනව ඒ පංතියේම හිටිය වෙන ළමයෙක් නර්තනයෙන් රංගනයෙන් හුඟාක් ඉදිරියට යන්න පුළුවන්. ලොකු ජනප්‍රියකමක් ලබන්න පුළුවන්.**

**එහෙම වෙන්නේ හුඟාක් දක්ෂ ළමයට නර්තනයේ දක්ෂතා පිහිටලා තිබුණට ජනප්‍රියත්වය ලැබීමට අවශ්‍ය පිහිටීම් නමට යෙදිලා නැති විටයි. දක්ෂකමට අවශ්‍ය පිහිටීම් වගේම ජනප්‍රියත්වයට අවශ්‍ය පිහිටීම් හරි ආකාරව නමකට වැටුණොත් ඒ වගේ නම් ඇති අය ජනප්‍රිය වීම කාටවත් නවත්වන්න බෑ. කලා ලෝකයේ හුඟාක් අයගේ ඔය පිහිටීම් දෙක හරි අපූරුවට පිහිටලා තියන ආකාරය නම පරීක්ෂා කළාම බලන්න පුළුවන්. ඔය පිහිටීම් දෙක අතරට සැපසම්පත් විඳින්න පුළුවන් සහ ආර්ථික හා ව්‍යාපාර පිහිටීම් වැටිලා තියනවා නම් කලාවෙන් ජනප්‍රිය වෙනවාට අමතරව ආර්ථික වශයෙන් බොහොම සමෘද්ධිමත් ජීවිතයක් ගත කරන්න පුළුවන්.”**

වෛද්‍ය නිවංක පවසන ආකාරයට නමේ දෝෂ නිසා කලාවෙන් ඉදිරියට නොගිය දක්ෂයන්ගේ නම්වල දෝෂ ඉවත් කරලා කලා හැකියාව වගේම ජනප්‍රියත්වයට අවශ්‍ය පිහිටීම් සමඟ නමක් දැම්මොත් ඉතා පහසුවෙන් අවශ්‍ය අරමුණ කරා යාමට හැකි වෙනවා. එලෙස නම වෙනස් කරගෙන කලා ලොවේ ලොකු ගමනකට මුල පුරණ නිරූපණ ශිල්පිණියක් අපිට මුණගැසුණා. ඇය මේ වනවිටත් ජනප්‍රිය නිසා ඇගේ සැබෑ නම කියන්න අකමැති වුණා. අපි ඇයට ටෂානි කියමු.

**“මම පුංචි කාලේ ඉඳන් නර්තනයට දක්ෂයි. හැමෝම හිතුවෙ මම කලාව පැත්තෙන් ඉදිරියට යයි කියලා. මම ආසාවෙන් හිටියේ නර්තනයෙන් ඉදිරියට යනවාට වඩා නිරූපණයෙන් ඉදිරියට යන්න. රංගනයටත් මගෙ ලොකු කැමැත්තක් තිබුණා. එහෙම ආසාවෙන් ඉන්න අයට ලොකුම ගැටලුව තමයි ක්ෂේත්‍රයේ දන්න හඳුනන අයගේ සම්බන්ධතා නැතිවීම. ඒත් ඒ අතින් මම වාසනාවන්තයි. මම දන්න හඳුනන අය කිහිපදෙනෙක්ම ඉන්නවා. ඒත් මම අපේක්ෂා කළ තරම් දුරක් යන්න මට බැරි වුණා. ඇත්තටම කිව්වොත් මට වැඩ ලැබුණෙම නැතිතරම්. ඒ ගැන මම හිටියෙ හරිම හිත් වේදනාවෙන්. ඒ අතර තමයි මට වෛද්‍ය නිවංක ගැන දැනගන්න ලැබුණේ. මම ගියේ මගේ නමේ පලාපල බලාගන්න. ඩොක්ටර් කියපු හැමදෙයක්ම හරි. මගේ නමේ කලාවට දක්ෂ පිහිටීමක් තියෙනවා. ඒත් ප්‍රසිද්ධ වෙන්න පිහිටීමක් නෑ. ඒ නිසයි කොයිතරම් දක්ෂකමයි, ආසාවයි, දන්න අඳුනන අයයි හිටියත් මට වැඩ ලැබුණෙ නැත්තේ. මම නම වෙනස් කරන්න තීරණය කළා. වාසනාවට මගේ නම වෙනස් කරන්න පුළුවන් තත්ත්වයක තිබුණා. ගෙදරින් නම් වැඩිය කැමති වුණේ නැහැ. ඒත් මම තනි තීරණයක් ගත්තා. මේ නමත් එක්ක මම අපේක්ෂා කරන ගමන යන්න බැරි නිසා මම ඊට ගැළපෙන නමක් හදගන්න තීරණය කළා. ඩොක්ටර් මට ලස්සන නමක් හදලා දුන්නා. මේ දවස්වල නම නීත්‍යානුකූලව වෙනස් කරන්න අවශ්‍ය කටයුතු කරනවා. ඒ අතරෙ මම ඒ නම භාවිත කරන්න පටන් ගත්තා. මටම පුදුමයි මෙච්චර දවසක් දුන්නෙ නැති වැඩ ටික ටික මට ලැබෙන්න ගත්තා. මම නිරූපණ වැඩ කටයුතු වගේම වෙළඳ දැන්වීම් කිහිපයකටත් පෙනී සිටියා. මට හොඳටම විශ්වාසයි නීත්‍යානුකූල වැඩ කටයුතු ඉවර වෙලා මගේ නම සිද්ධි වුණාට පස්සෙ අනිවාර්යයෙන් මම ක්ෂේත්‍රයේ ජනප්‍රිය වෙනවා. මගේ එකම බලාපොරොත්තුවත් ඒකම තමයි.”**

ඒ ටෂානිගෙ කතාව. කෙනෙක්ට හිතෙන්න පුළුවන් නිළියක් වෙන්න, නළුවෙක් වෙන්න, ගායකයෙක් වෙන්න කැමති අයට නම වෙනස් කරලා ඒ ආශාව ඉටු කරගන්න පුළුවන් කියලා. නාම හා ශබ්ද ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක පවසන ආකාරයට නම වෙනස් කළ පමණින් කලාවට ප්‍රවිෂ්ට වෙන්න බැහැ.

**“හැකියාව කියන එක පුංචි කාලෙ ඉඳන්ම පිහිටන දෙයක්. කෙනෙක්ගේ උපන් කේන්ද්‍රයට අනුවත් මේ කලාත්මක පිහිටීම් තියනවා. ඒකටම ගැළපෙන නමක් වැටුණම ඒ හැකියාව බලවත් වෙනවා. සමහරුන්ගේ උපන් කේන්දරේ එහෙම පිහිටීමක් තිබුණට හරියට තාලයට සිංදුවක්වත් කියන්න බැරි, තාලයට අඩිය තියන්න බැරි අය ඉන්නවා. එහෙම වෙන්නේ නමට ඒ කලාත්මක පිහිටීම ලැබී නැති විට. කලාව කියන දේ පුංචි කාලෙ ඉඳන්ම ප්‍රගුණ කරන්න ඕන දෙයක්. අවුරුදු 25 දී විතර කලාත්මක පිහිටීමක් එක්ක නමක් හැදුවා කියලා ඒක වැඩක් වෙන්නේ නැහැ. හැබැයි හැකියාව තියෙන කෙනෙක්ට නමෙත් ඒ පිහිටීම තියනවා නම් අවශ්‍ය ප්‍රසිද්ධිය, ආර්ථික පසුබිම පසුකාලෙක නම වෙනස් කරලා හදගන්න පුළුවන්. අවුරුදු 40,50 ගිහිල්ලත් ප්‍රසිද්ධ වෙච්ච කලාකරුවො ඉන්නවානේ. හැබැයි ඒ අයගේ අතීතයේ ඒ අය අප්‍රසිද්ධියේ වුණත් කලා කටයුතු කරලා තියෙනවා. අඩුතරමේ ප්‍රාදේශීයව හෝ තමන්ගේ දක්ෂතා පෙන්නලා තියනවා. එහෙම අයට අඩු ප්‍රසිද්ධිය. ඒක නමකින් හදන්න පුළුවන්.”**



**මගේ නමේ කලාවට දක්ෂ පිහිටීමක් තියෙනවා. ඒත් ප්‍රසිද්ධ වෙන්න පිහිටීමක් නෑ. ඒ නිසයි කොයිතරම් දක්ෂකමයි, ආසාවයි, දන්න අඳුනන අයයි හිටියත් මට වැඩ ලැබුණෙ නැත්තේ**

**කලා හැකියාවට අවශ්‍ය පිහිටීම එක්ක ජනප්‍රියත්වයට අවශ්‍ය පිහිටීමත් නමකට යෙදුණොත් එහෙම කෙනෙක්ගේ ජනප්‍රියත්වය මොනම දේකින්වත් නවත්තන්න බෑ**

**සමහර නම්වල කලාවට ඉතා හොඳ පිහිටීම් තියෙනවා. නමක ඒ පිහිටීම තුන්වෙනි සූත්‍රයේ නමකට වැටුණොත් යෝගයක් වෙනවා**



නාම හා ශබ්ද ශාස්ත්‍රඥ
නිවංක දිනාරංග රත්නායක

**හිමේෂා සවන්තී රාජපක්ෂ**

# කළු කෙල්ලො හරි ගණන්



කූඩියාට තිබුණේ ඉතා සුන්දර පෙනුමක් නම් නොවේ. ඇය උපතින්ම අසාමාන්‍ය ලෙස කළු පැහැති තරුණියක්. කොතරම් කළුද කිව්වොත් ඇයගේ මුහුණත්, කොණ්ඩයත් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි තරමට ඇය කළු පැහැතියි. ඒ අසාමාන්‍ය පැහැය නිසාම කූඩියාගේ ළමා කාලයත් එතරම් සුන්දර වුණේ නෑ. බොහෝදෙනෙක් ඇයට සමච්චලයට මෙන් 'කළු කෙල්ල' සහ 'කැත කෙල්ල' කියලයි කතා කළේ. බොහෝවිට පවුලේ වැඩිහිටියන් පවා ඇයට කතා කළේ එහෙමයි. එවැනි අවස්ථාවල ලැජ්ජාවෙන් හඬාගෙන ගොස් මව ළඟ දැවටීමයි ඇය කළේ.

**දැන් කූඩියාව එරට රූපවාහිනී නාළිකාවල නොපෙන්වා සිටින දවසක් නැති තරම්. එසේම ඇය නොමැති නිරූපණ තරඟයක් ඒ රටේ දැන් නැති තරම්. පුවත්පත්, සඟරාවල මුල් පිටු සරසන්නට ඇයට එන ආරාධනාවල වුණත් කිසිඳු අඩුවක් නෑ**

කාලය ගතවෙලා තමා නවයොවුන් වියට පැමිණෙද්දී මේ අසාමාන්‍ය කළු පැහැය අඩුවෙයි කියලයි කූඩියා හිතුවේ. ඒත් ඒක එහෙම වුණේ නෑ. මුහුණ බලන කණ්ණාඩිය ඉදිරියට ගොස් බලන වාරයක් වාරයක් ගානේම ඇයට සිතුණේ තමාගේ කළු පැහැය තවත් වැඩිවී ඇති බව. ඒ වනවිට කූඩියාට වයස අවුරුදු දහඅටයි. ඒ විදියට ගෙවිලා ගියපු දහඅට අවුරුද්ද පුරාවටම සමාජයෙන් ලද ගැරහුම් නිසා ඇයට ජීවිතය තිත්ත වෙලයි තිබුණේ. ජීවිතය නැතිකරගන්න පවා සිතුණු වෙලාවලුත් තිබුණා. පසුව ඇය කාමරයට වෙලා දවස් ගණන් එකදිගට කල්පනා කළා. ඒ තමා මෙලෙස විඳින නින්දා අපහාසවලින් ගැලවෙන ආකාරයක් ගැන.

අවසානයේ තුන්හිතකවත් නොතිබුණු විදියේ තීරණයක් තමයි ඇය ගත්තේ. ඒ තමයි නිරූපිකාවක් වෙන්නට තීරණය කිරීම. ඒත් නිරූපණ ශිල්පිනියක් වෙන්නට වැදගත්ම දේ රූපයයි. කූඩියාගේ රූපය අනුව නිරූපණය වැනි වෘත්තියක් තෝරාගැනීමම හාස්‍යජනකයි. ඒ වගේම ඇය උපන් නැගෙනහිර යුරෝපීය රාජ්‍යයක් වෙන ස්ලෝවැකියාවේ සිටියේම සුදු හමක් සහිත තරුණියන්. ඒ නිසා එවැනි වෘත්තියක් තෝරාගැනීම තුළ තවදුරටත් ඇයව සමාජය ඉදිරියේ හාස්‍යයට ලක්වෙන එකයි වෙන්නේ. ඒ බව කූඩියාත් හොඳින්ම දැන සිටියා. නමුත් ඉදිරියට තැබූ පියවර යළිත් වතාවක් පසුපසට ගන්නට තරම් ඇයට හිත දුන්නේ නෑ.

කූඩියා නිරූපණ ශිල්පිනියක් වෙන්නට ගත් තීරණය ඇසූ ඇයගේ දෙමව්පියෝ පුදුමයටත් විශ්මයටත් පත්වුණා. එයින් නොනැවතී දැඩි වේදනාවටත් පත්වුණා. ඒ ඇගේ රූපය අනුව ඇය තෝරාගත් වෘත්තියේ නොගැළපීම නිසා. එහෙත් ඒ බවක් ඔවුන් කූඩියාට පෙන්වූයේ නෑ. ඒ තවදුරටත් ඇගේ සිත රිද්දන්න බැරි නිසා. හැබැයි මෙතරම් කළු තරුණියක් නිරූපණ වෘත්තියට ගියොත් ඇයට ලැබෙනා නින්දා අපහාස ගැන ඔවුන් බය වුණා. ඒ නිසා කූඩියාගේ තීරණයට දෙමාපියන් විරුද්ධ වුණා. නමුත් ඔවුන් ඒකට හේතුව කෙළින්ම කිව්වේ නෑ.

**"දරුවෝ... ඒ වාගේ රැකියාවක් අපේ සංස්කෘතියට ගැළපෙන්නේ නෑ. ඔයා වෙනත් පැත්තක් තෝරගන්න."**

එසේ පැවසුවේ ඇගේ පියාය. ඒත් තීරණය වෙනස් කිරීමට කූඩියා කිසිවිටෙකත් සූදානම් වුණේ නෑ. ඇය පෙරළා තමාගේ පියාට මෙසේ පැවසුවාය.

**"මට හැමෝම විහිළු කරනවා මං කළුයි මං කැතයි කියලා. ඒ නිසා මං නිරූපණ ශිල්පිනියක් වෙනවාමයි."**

කොතරම් උත්සාහ ගත්තත් කූඩියාගේ තීරණය වෙනස් කරන්නට ඇගේ දෙමව්පියන්ට හැකියාවක් ලැබුණේ නෑ. පළමු ඔඩිෂන් එකට ගියාම වුණේ ඇය හැල්ලුවට ලක්වීම පමණයි. ඇයට කැමරා ශිල්පීන් ඇතුළු එතැන සිටි සියල්ලෝම සිනාසුණා. ඔවුන් එක හඬින් පවසා සිටියේ ඇයගේ රූපය එවැනි වෘත්තියකට නොගැළපෙන බව. ඒත් කූඩියා එතැනට ගොස් තිබුණේ ඒ සියලුදේට මුහුණදෙන්නට බලාගෙන. ඒ නිසා ඇය එම අවස්ථාවට සාර්ථකව මුහුණ දුන්නා. ඊටපස්සෙ ඇය පුවත්පත් සහ සඟරාවල නිරූපණය සඳහා යොමුවුණා. නමුත් එතැනදිත් ඇයට සිදුවුණේ ඒ ක්ෂේත්‍රයේ මිනිසුන්ගේ හාස්‍යයට බඳුන්වෙන්න.

වැදගත්ම දේ තමයි කොතරම් අමාරු කාලයක් ගතවෙමින් තිබුණත් ඇය කිසිඳු අවස්ථාවක හිතින් වැටුණේ නෑ. නිරූපණ ක්ෂේත්‍රයේම රැඳී සිටින්නට ඇය දිගටම උත්සාහ කළා. කූඩියා ඒ වෙනුවෙන් නොකළ දෙයක් නෑ. ප්‍රතික්ෂේපවීම් පරාජයන් හමුවේ ඒ සියල්ලම ඇය තනිවම දරාගත්තා. අවසානයේ ඇය නතරවුණේ ජාත්‍යන්තරය තුළ ඉතා ප්‍රසිද්ධ නිරූපණ ශිල්පිනියක් වෙමින්. දැන් ඇය කොතරම් ජනප්‍රියද කිව්වොත් ඇගේ ට්විටර් ගිණුම තුළ පරිශීලකයින් මිලියන ගණනක් ඉන්නවා.

**මට හැමෝම විහිළු කරනවා මං කළුයි මං කැතයි කියලා. ඒ නිසා මං නිරූපණ ශිල්පිනියක් වෙනවාමයි**



දැන් කූඩියාව එරට රූපවාහිනී නාළිකාවල නොපෙන්වා සිටින දවසක් නැති තරම්. එසේම ඇය නොමැති නිරූපණ තරඟයක් ඒ රටේ දැන් නැති තරම්. පුවත්පත්, සඟරාවල මුල් පිටු සරසන්නට ඇයට එන ආරාධනාවල වුණත් කිසිඳු අඩුවක් නෑ. අදටත් ඇය දකින බොහෝදෙනෙක් කූඩියාගෙන් අසන්නේ ඇයට ඇති අසාමාන්‍ය කළු පැහැයත් සමඟ නිරූපණය වැනි වෘත්තියකට යොමුවූයේ කොහොමද කියන එක. එවිට ඈ සිනාමුසු මුහුණින් හරි අපූරුවට උත්තර දෙනවා.

**"ඔබලා තවමත් එහෙම අහන්නේ ඇයි කියලා මං දන්නේ නෑ. ඇත්තටම මගේ මේ පාට වෙන කිසිම කෙනෙකුට නැති පාටක්. ඉතින් මං හිතුවා මට ලැබුණු මේ අසාමාන්‍ය රූපය ලෝකයාට පෙන්විය යුතුයි කියලා. දැන් මං ගොඩාක් සතුටින් ජීවත්වෙනවා."**

අද වනවිට කූඩියා ගිය පාරේම යමින් නිරූපණ ක්ෂේත්‍රයට පිවිසෙන රූපයෙන් කළු පැහැ තරුණියෝ බොහෝමයි. ඔවුන් දැන් සුදු කෙල්ලන්ට පවා අභියෝගයක්. සුදු කෙල්ලන් අභිබවා යමින් කළු කෙල්ලන් අද ජාත්‍යන්තර රූ රැජිනියන් ලෙස පවා කිරුළු දරන්නේ එහි ප්‍රතිඵලයක් විදියට. ඉතින් කළු කියන්නෙ වෙනම BRAND එකක්. කවුරු ගනන් ගත්තත්, නැතත් ඒක BRAND එකක් වෙන්නේ හරිම තැන හොඳම වෙලාවට. එහෙම බලද්දි අද කූඩියා කියන්නේ කළු කියන BRAND එක නිසාම ලෝකයේ ඉහළම මිල අය කරන නිරූපිකාවන් අතර එක්කෙනෙක්. ඉතින් කොහොමද කියන්නෙ ජීවිතය දිනන්න අවශ්‍ය නම් කෙනෙකුට තවදුරටත් තමන්ගෙ පෙනුම ඒකට ප්‍රශ්නයක් කියලා?

***රුවන් එස්.සෙනවිරත්න***

# ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න



# කිරණ

## මාසික අධ්‍යාපනික පුවත්පත්

## අප්‍රේල් කලාපයන් දැන් වෙළෙඳපොළේ

## 5 කිරණ පත්තරෙන් ශිෂ්‍යත්වයට ඉලක්ක ප්‍රශ්න පත්තර හතරක්...



### අරුණින් උදාවූ කිරණ

පුංචි දරුවන්ගේ දැනුම පරාසය පුළුල් කිරීම සඳහා "කිරණ" පුවත්පත දරුවන් අතට පත් කිරීම සම්බන්ධව සතුටුවෙමි. විෂයනුබද්ධ මෙන්ම විෂයබාහිර දැනුම, නවීන තාක්ෂණය ද මුසු කරමින් කියවීමට මෙන්ම සවන්දීමට ද හැකි පුවත්පතක් දරුවන් අතට පත්වීම දරුවන්ට මෙන්ම දෙමාපියන්ට ද නව අත්දැකීමක් වනු ඇත. පුළුල් අත්දැකීම සහිත ප්‍රවීන ඇදුරු මඩුල්ලක් සමගින් දැයේ දරුවන්ගේ දැනුම් නිම්වළලු පුළුල් කිරීමට "කිරණ" දරන උත්සාහය සාර්ථක වේවායි පතමි.

**උදය වික්‍රමසිංහ**
විදුහල්පති
මාර/වෙහෙරගම්පිට
ඕල්කට් ආදර්ශ විදුහල, මාතර



වසර පහකින් සමන්විත ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අවධි තුනේ ම අවශ්‍යතා මැනැවින් අවබෝධ කර ගනිමින් "කිරණ" 3,4,5 ශ්‍රේණි සඳහා වෙන වෙන ම දරුවන්ට මග කියාදීමට ගත් වෑයම මහත් සේ අගයමි. එසේ ම ගුරු සේවයේ හසල අත්දැකීම් ඇති ලේඛක මඩුල්ලකගේ සහාය ලබා ගනිමින් දැනුම, ආකල්ප, කුසලතා සහ නිර්මාණශීලී චින්තනයට ද රසවින්දනයට ද දරුවා යොමු කිරීම "කිරණ" පුවත්පත් ත්‍රිත්වයේ විශේෂත්වයකි.
අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි දරු පරපුරක් තැනීමට "කිරණ" පුවත්පත යාත්‍රාවක් වනු ඇත.

**පියතිස්ස රන්දෙනිගල,**
විදුහල්පති,
මාබිම විද්‍යාකර ප්‍රාථමික විද්‍යාලය,
මාකෙවිට



"කිරණ" ශිෂ්‍යත්ව පුවත්පත් අතර නව පෙරළිකාර පුවත්පතක් ලෙස සඳහන් කළ හැකි ය. එමෙන් ම ශිෂ්‍යත්ව විභාගයට අවශ්‍ය සියලුම විෂය කරුණු ආවරණය වන සේ කිරණ පුවත්පත නිර්මාණය කර තිබීම කාලෝචිත ක්‍රියාවකි. විශේෂයෙන් ම අත්දැකිම් බහුල සුදුසුකම් ලත් ගුරු මණ්ඩලයක් ලේඛක මණ්ඩලයට යොදා ගෙන තිබීම පැසසුම් සහගත ය.

දරුවන්ගේ දැනුම, සතුට, හැකියාව දියුණු කරන පුවත්පතක් ලෙස "කිරණ" පුවත්පත හැඳින්විය හැකි ය. එම නිසා ලංකාවේ ගුරුවරුන් දෙමාපියන් හා දරුවන් අතරේ කෙටි කාලයක් තුළ "කිරණ" අධ්‍යාපනික සඟරාව ව්‍යාප්ත වී ඇති බව දැකීම සතුටට කාරණයකි.

**සමිතා ද සිල්වා**
විදුහල්පතිනි
බප/මීග/ගොන්සාලෙස් මහා විදුහල, පමුණුගම, ජාඇල



## දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් දැන් මිලදී ගත හැක




අප්‍රේල් 23 වැනිදා සිට
සැම සෙනසුරාදාවකම
පෙරවරු 8.00 සිට 12.00 දක්වා

කිරණ
ශිෂ්‍යත්ව පුවත්පත හා සමගාමීව පැවැත්වෙන

fm දෙරණ ශිෂ්‍යත්වය හරි ලේසියි

පාඩම් මාලාව
සෑම සතියේ දිනකම
පෙරවරු 6.00 සිට 7.00 දක්වා

කවරයේ කතාව



# කැපී පේන්න ලොකු පුටු දක්ෂයින්ට

## මාධ්‍යවේදිනී, නීතීඥ

**ඕනම ක්ෂේත්‍රයක සාර්ථක ගමනක් යන්න හැඳුනුම්කම් එහෙමත් නැත්තම් වත්පොහොසත්කම් වැදගත් කියලා සමහරු කියනවනේ. නටන්න බැරි මිනිහට පොළොව ඇදයි කියන්නා වගේ ඔය වගේ කතා කියන්නෙත් කැපවීමෙන් දෙයක් ලබාගන්න උත්සාහ නොකරන අය කියලා අපිත් එක්ක කිව්වේ මාධ්‍යවේදීනී, නීතීඥ තිළිණී පෙරේරා. ප්‍රවෘත්ති නිවේදිකාවක් විදිහට තිළිණිව නොදන්නා කෙනෙක් නැහැ. උත්සාහවන්තයා ජයගන්නවා කියන එක ක්‍රියාවෙන්ම පෙන්නූ සුවිශේෂී කෙනෙක් තමයි ඇය.**

**හැමදාම අපි 'ධරණී' කවරය සරසන්නේ ඒ වගේ සුවිශේෂී කතාවක් තියෙන සුන්දර ගැහැනියකගේ රුවින්. ඉතින් තිළිණිගේ කතාවේ අපි දැකපු ඒ විශේෂත්වය මෙතැන ඉඳලා ඔබටත් දකින්න පුළුවන්.**

"මම ප්‍රාථමික අධ්‍යාපනය ලබාගත්තේ ගොඩගම සුබාරතී කනිෂ්ඨ විද්‍යාලයෙන්. ඊටපස්සේ ශිෂ්‍යත්ව විභාගය පාස්වෙලා නුගේගොඩ සමුද්‍රදේවී බාලිකාවට ගියා. පුංචි කාලේ ඉඳලම මම නිවේදන කලාවට ගොඩක් ලැදියි. යමක්කමක් තේරෙන කාලේ ඉඳලා මම ටීවී එකේ නිවේදිකාවෝ ප්‍රවෘත්ති කියවන විදිහ බලාගෙන ඉන්නවා. අම්මාගේ සාරි, ඇට මාල පටලවගෙන කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා ඒ විදිහට කතා කරලා බලනවා.

හැබැයි මම පාසලේදී ටිකක් නිශ්ශබ්ද ළමයෙක්. ඉතින් ආසාවෙන් හිටියත් මට පාසලේදී නිවේදනයට අවස්ථාව ලැබුණේ නැහැ. අට වසරේදී මම රත්නා පුෂ්පකුමාරි මිස්ගේ ළමා කුසලතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වුණා. එතැනින් මම නිවේදනය ගැන ගොඩක් දේවල් ඉගෙනගත්තා. ඔහොම ඉන්නකොට දවසක් මම ජයග්‍රහණය කරපු නිවේදන තරඟයක සහතිකයක් රත්නා මිස් පාසලට එවලා තිබුණා. ඒක දැකපු එවකට හිටි විදුහල්පතිනිය එදා ඉඳලා මාව නිවේදන කටයුතුවලට සහභාගී කරගත්තා. ඒ වගේම ළමා කුසලතා වැඩසටහන හරහා මට ජාතික රූපවාහිනියෙත්, TNL නාළිකාවෙත් ළමා පුවත් කියන්න අවස්ථාව ලැබුණා. ඉතින් එතැන තමයි මගේ නිවේදන ගමනේ ආරම්භය."

**එතකොට ස්වර්ණවාහිනියට සම්බන්ධ වුණේ කොහොමද?**

"ස්වර්ණවාහිනියේ පුවත් කියන රටාවට මම හරි කැමතියි. ඉතින් මම ඔය රටාව නිතරම වගේ පුරුදු පුහුණු වුණා. උසස් පෙළින් පස්සේ මම බැංකුවක පුහුණු නිලධාරිනියක් විදිහට වැඩ කළා. ඒ අතරේ මම ඒ නාළිකාවට ඡායාරූපයක් එක්ක අයැදුම්පතකුත් යොමුකළා. එතැනින් පැවැත්වුණු සම්මුඛ පරීක්ෂණ කිහිපයකට පස්සේ මාව ප්‍රවෘත්ති නිවේදිකාවක් විදිහට තෝරගත්තා. ඒ අයැදුම්පත් පන්දහක් අතරින්."

> **දවසක් මම නිව්ස් කියනකොට මගේ කොණ්ඩ කටුව ගැලවිලා බිමට වැටුණා. ඔලුව ටිකක් හරි සෙලවුණා නම් ලයිව් එකේදිම කොණ්ඩය ලෙහෙනවා. ප්‍රවෘත්ති නිවේදිකාවකගේ ප්‍රතිරූපයට හානියක් වෙන්න ඔය වගේ පුංචි දේත් ප්‍රමාණවත්**

අයදුම්පත්‍ර පන්දහසකින් තේරෙන එකම කෙනා වෙන්න තරම් තිළිණිගේ හැකියාව විශේෂයි කියන එක රටම දන්න දෙයක්. ඔය අයැදුම්පතට ඇමිණුවාය කියන ඡායාරූපය සම්බන්ධයෙන් අමතක නොවෙන සිදුවීමක් ගැනත් හිනාවෙන ගමන්ම තිළිණී අපිත් එක්ක කිව්වා.

"ස්වර්ණවාහිනියේ පුවත් නිවේදිකාවන් අඳින පළඳින විශේෂ විදිහක් තියෙනවා. මම ඉතින් ඒ පුංචි දේවල් ගැන පවා සැලකිමත් වෙලා තමයි ඔය ඡායාරූපය ගත්තේ. ඕක දැකපු ගමන් 'මේ බලන්නකෝ මෙයා අපේ චැනල් එකේ ප්‍රවෘත්ති කියන ළමයෙක් වගේමනේ' කියලා ඇතුළේ කට්ටියත් කතා වුණාලු. මාව සම්මුඛ පරීක්ෂණයට කැඳවන්න හේතුවත් ඔය ෆොටෝ එකලු. ඒක නෙමෙයි හොඳම වැඩේ. ප්‍රවෘත්ති අංශයට මාව තෝරගත්තට පස්සේ හරින්ද්‍ර ජයලාල් අයියා මාව එවකට කළමනාකාර අධ්‍යක්ෂ ජීවක එදිරිසිංහ මහත්මයට අඳුන්වලා දෙන්න එක්කරගෙන ගියා. සර් මාත් එක්ක වචනයක් දෙකක් කතා කරලා මට යන්න කිව්වා. හැබැයි හරින්ද්‍ර අයියට ටිකක් එතැන ඉන්න කිව්වා. 'මේ අර ෆොටෝ එකේ හිටිය ළමයා නෙමේනේ. මේ ළමයව ස්ක්‍රීන් එකට දාන්න පුළුවන්ද?' කියලා තමයි ඔහු ඒ වෙලාවේ හරින්ද්‍ර අයිය ගෙන් අහලා තියෙන්නේ. මොකද මම එදා සාරි ඇඳලා මේකප් දාලා එහෙම නෙමෙයි හිටියේ. ඒ නිසා ඔහුට මාව අඳුරගන්න බැරිවෙලා. ඇත්තටම මට වඩා ලස්සන අය ගොඩක් ඒ ඉන්ටර්විව් එකට සහභාගී වෙලා හිටියා. ඉතින් ඒ අය අතරින් මාව තේරුණේ මගේ හැකියාව නිසා වෙන්න ඇති."

ඇත්ත. ගැහැනියකට ලස්සනට වඩා හැකියාව ආභරණයක්. හැබැයි තිළිණී එහෙම කිව්වට ඇගේ හැකියාවේ වගේම සුන්දරත්වයේත් කිසිම අඩුපාඩුවක් නම් අපි දැක්කේ නැහැ.

"පළවෙනි දවසේ ලයිව් එකට ඉඳගන්නකොට මගේ කකුල් දෙකම කිටි කිටි ගාලා වෙව්ලනවා, බයට. හැබැයි ඉතින් පළවෙනි වචන දෙක තුන කියද්දි ඒ බය ඉබේටම වගේ ඇරිලා ගියා. කොච්චර ප්‍රවීණ කෙනෙක් වුණත් ප්‍රවෘත්ති කියන්න කලින් හැමදාම වගේ ඔය තිගැස්ම හිතට දැනෙනවා. ප්‍රවෘත්ති නිවේදිකාවක් කියන්නේ නිකන් කොළයක් බලාගෙන කියවන කෙනෙක් කියලා බැලූ බැල්මට කෙනෙක්ට හිතෙන්න පුළුවන්. හැබැයි ඒක එහෙම නැහැ. භාෂාව ගැන හරි දැනුමකින් වචන වරද්දන්නෙත් නැතුව අදහස වෙනස් නොකර අපි ඒක ප්‍රේක්ෂකයාට දෙන්න ඕනේ. ඒ වගේමයි හැඟීම් පාලනය. අතිශය සංවේදී සිදුවීම් හැඟීම්බර නොවී කියවන එකම මට නම් අභියෝගයක්."

**සජීවී පුවත් විකාශ අතරතුරේදී අමතක නොවන සිදුවීම් එහෙම වෙලා නැද්ද?**

"පොඩි පොඩි දේවල් නම් ඕනතරම් වෙලා තියෙනවා. දවසක් මම නිව්ස් කියනකොට මගේ කොණ්ඩ කටුව ගැලවිලා බිමට වැටුණා. ඔලුව ටිකක් හරි සෙලවුණා නම් ලයිව් එකේදිම කොණ්ඩය ලෙහෙනවා. ප්‍රවෘත්ති නිවේදිකාවකගේ ප්‍රතිරූපයට හානියක් වෙන්න ඔය වගේ පුංචි දේත් ප්‍රමාණවත්. ඉතින් එදා මම ලයිව් එක ඉවර වෙනකල්ම එකම විදිහට නොසෙල්වී නිව්ස් කිව්වා."

ඇගේ මේ කැපවීමත්, දක්ෂතාවයත් නිසාම කිහිපවරක්ම ඇය හොඳම ප්‍රවෘත්ති නිවේදිකාව විදිහට සම්මාන පවා ලබාගත්තා. ඉතින් ඒ ගැනත් අපි ඇයගෙන් අහලා බැලුවා.

"2015 සුමති සම්මාන උළෙලේ හොඳම ප්‍රවෘත්ති නිවේදිකාව වෙන්න මට පුළුවන් වුණා. එතකොට මම ක්ෂේත්‍රයට ඇවිල්ලා අවුරුදු පහක් විතර ඇති. 2019 හොඳම පූරක විදිහටත් නිර්දේශ වුණා.

# දැගලන අය වලට ආවම හලනවා

## තිළිණී පෙරේරා

ඇය මාධ්‍ය ක්ෂෙත්‍රයේ නැති බව කණගාටුවෙන් වුණත් කියන්න ඕන කාරණාවක්. කාලයක් රටම කතාබහ කළ ඒ සිදුවීම ගැන ඇය කතා කළෙත් බොහොම කළකිරීමකින්.

**ඔය ආයතනය ඇතුළේ අලුත් කළමනාකාරීත්වයෙන් තිළිණීට ඔයතරම් ප්‍රශ්න ඇති වෙන්න හේතුවක් තියෙනවද?**

**"ලොකුම හේතුව බය. මෙහෙමනේ. කැපී පෙනෙන්න දැගලන කෙනෙක් තැනකට ආවම එතැන ඉන්න දක්ෂයන් හලාදන එක සාමාන්‍යයි. එහෙම නැති වුණොත් ඒ අය අභියෝගයක් වෙනවා කියන බය ඔවුන්ට ඇති වෙනවා. ඉතින්**

**ඊට අමතරව ජාත්‍යන්තර මාධ්‍ය විශිෂ්ඨ සම්මාන කිහිපයකුත් ලැබිලා තියෙනවා. ඔය කාලය අතරතුර ජීවිතේත් යම් යම් ජයග්‍රහණ ලබාගන්න මට පුළුවන් වුණා."**

**ඒ මොනවද?**

**"නිවේදිකාවක් විදිහට ගොඩක් දෙනා මට ආදරේ කරනවා. ඒකම ලොකු දෙයක්නේ. ඒ වගේම වෘත්තීය ජීවිතේට වසරක් දෙකක් යනකොට මට වාහනයක් ගන්න ලැබුණා. කාර් එකක් ගත්තු එක මහදෙයක්ද කියලා කෙනෙක්ට හිතෙන්න පුළුවන්. හැබැයි ඇත්තටම මට ඒක ලොකු දෙයක් තමයි. මම ආර්ථික අතින් මහ ලොකු පෝසත් පවුලක ළමයෙක් නෙමෙයි. බොහොම සාමාන්‍ය අය. අපිට කවදවත් වාහනයක් තිබිලා නෑ. ඉතින් පොඩි කාලේ ඉඳලා මම ඒ ගැනත් හීන මැව්වා. මට කියල මහා ලොකු වේතනයක් ලැබුණේ නැහැ. හැබැයි මට ලැබෙන හැම රුපියලම මම හරියටම කළමනාකරණය කරනවා. දැන් කාලේ ගොඩක් ගැහැනු උදවිය අනවශ්‍ය දේට මුදල් වැය කරනවා වැඩියි. අවශ්‍ය දේට මුල් තැන දීලා හරි විදිහට මුදල් කළමනාකරණය කරනවා නම් ඕනම කෙනෙක්ට ආර්ථික අතින් සාර්ථක වෙන්න අමාරු නැහැ."**

සම්මාන, කැපකිරීම්, ජයග්‍රහණ ගැන මේ හැටි කතාබහ කළත් අද වෙනකොට

**ඔය කියන පිරිස මුල ඉඳලම අපිට විවිධ ගැටලු ඇති කළා. මට මතකයි දවසක් මම ප්‍රධාන පුවත් කියන්න ලෑස්ති වෙලා නිව්ස් රූම් එකටත් ආවට පස්සේ මට නිව්ස් කියන්න එපා කිව්වා. ඒ වෙලේ දැනුණු අපහසුතාවය වචනවලට පෙරලන්න අමාරුයි. කාන්තාවක් නිසා මේ වගේ දේවල් ඉවසගෙන ඉඳීවී කියලා ඒ අය හිතුවා.**

**මම නම් කියන්නේ තමන්ට අසාධාරණයක් වෙන තැනකදී කවුරුත් නිශ්ශබ්දව ඉන්න ඕනේ නැහැ. තමන්ට තමුනුත් නැත්තම් කවුද ඉන්නේ? ඒ වගේම අපි එකඟ නොවෙන කිසිම දෙයක් අකමැත්තෙන් කරන්න අවශ්‍යත් නැහැ. අපි ඉවත් වුණොත් ඒ ආයතනය සාර්ථක වෙනවා කියලා ඒ අය කියලා තිබුණා. ඒ නිසා අපි ආදරේ කරන තැන අමාරුවෙන් හරි අත්හරින්න අපි තීරණය කළා. ඉතින් දැන් ඒ අය සාර්ථකද අසාර්ථකද කියන එක මම අමුතුවෙන් කියන්න ඕනේ නැහැනේ."**

ප්‍රවෘත්ති නිවේදිකාවක් විදිහට දකින්න නැති වුණත් ඇයව අපිට මේ දවස්වල නීතීඥවරියක ලෙසින් දැකගන්න පුළුවන්. ජීවිතේ ඒ අලුත් පිම්ම ගැන ඇය කතා කළේ මෙහෙම.

**"කළමනාකාරීත්වයේ ගැටලු නිසා මාධ්‍ය ක්ෂෙත්‍රයේ ස්ථාවරත්වයක් හදගන්න අමාරුයි කියන එක මම මුල ඉඳලම අවබෝධ කරගෙනයි හිටියේ. අමතර සුදුසුකමක් හදගන්න හිතුවේ ඒකයි. ඉතින් මගේ දක්ෂතා එක්ක මට ගැලපෙනම වෘත්තිය නීතීඥ වෘත්තිය කියන එකත් මට දැනුණා. ඉතින් මම නාවල විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිය හැදෑරුවා. ඒකත් ලේසි වුණේ නැහැ.**

**මාධ්‍ය ජීවිතේට වෙලාවක් කලාවක් නැහැනේ. උදේම ගෙදරින් ගිහින් ආයේ ගෙදර එන්නේ රෑ ජාමෙට. මට නිවාඩු තිබුණොත් එක දවසයි. ඒ නිසා මට ලෙක්චර්ස් පවා මගඇරුණා. හැබැයි කැම්පස් එකේ යාළුවන්ගෙත් උදව් ඇතිව කොහොම හරි මම ඒ කටයුතු සාර්ථක කරගත්තා. 2020 වසරෙදී මම නීතීඥවරියක් විදිහට දිවුරුම් දුන්නා."**

නීතීඥවරියක් විදිහට දිවුරුම් දීලා කෙටි කාලයක් වුණාට මේ වෙනකොට ඇය නඩු විස්සකට විතර පෙනී ඉඳලා තියෙනවලු.

**"ඉදිරිපත් වුණු පළවෙනි නඩුවම මට බොහොම විශේෂයි. ඒක ළමයෙක්ගේ අයිතිය සම්බන්ධ නඩුවක්. අවිවාහක යුවළකට දාව ඉපදුණු දරුවෙක්ව විවාහක මව්පිය යුවළක් දරුකමට හදගෙන. ඒ අය දරුවට බොහොම ආදරේ බව තේරුණා. පොලිසියෙන් ළමා ජාවාරම් කරනවා කියලා ඔවුන්ට විරුද්ධව නඩුවක් දලා. ඉතින් හරි විදිහට කරුණු දැක්වුව නිසා**

**ඉදිරිපත් වුණු පළවෙනි නඩුවම මට බොහොම විශේෂයි. ඒක ළමයෙක්ගේ අයිතිය සම්බන්ධ නඩුවක්. අවිවාහක යුවළකට දාව ඉපදුණු දරුවෙක්ව විවාහක මව්පිය යුවළක් දරුකමට හදාගෙන. පොලිසියෙන් ළමා ජාවාරම් කරනවා කියලා ඔවුන්ට විරුද්ධව නඩුවක් දාලා**

**අපි ඒ නඩුව ජයගත්තා. ඒ ගැන දනගත්තු ගමන් අර අම්මයි තාත්තයි දරුවව බදගෙන සතුටට අඬන්න පටන් ගත්තා. එතකොට මට දැනුණු සතුට පුදුමසහගතයි. ඉතින් මේ වෘත්තිය තෝරගත්තු එක ගැනත් මම ආඩම්බරයි. නීතිය සම්බන්ධ කරුණු කාරණා ගැන දැනුවත් නැති නිසා ගොඩක් උදවිය අමාරුවේ වැටෙනවා. ඒ ගැන දැනුවත් කරන්න මම යූටියුබ් චැනල් එකකුත් පටන්ගත්තා."**

නීතිය නොදැන සිටීම නිදහසට කාරණාවක් නොවේ කියලා කියමනක් තියෙනවනේ. 'Low point with Thilini Perera' කියන ඇගේ යූටියුබ් චැනලය හරහා ඕනම කෙනෙක්ට නීතිමය කාරණා ගැන දැනුවත් වෙන්න පුළුවන්. මේ වැඩකටයුතුවලට අමතරව මේ වෙනකොට ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධිය හදරන බවත් ඇය කිව්වා.

**"ඉගෙනගන්න දෙයක් කවදවත් අපතේ යන්නේ නැහැ කියන කතාව තදින්ම විශ්වාස කරන කෙනෙක් තමයි මම. පොතපතේ අධ්‍යාපනය විතරක් නෙමේ මේ සමාජයෙනුත් අපිට ඉගෙනගන්න ඕනතරම් දේවල් තියෙනවා. ඒ වගේම තමයි ඒ ඉගෙනගන්න දෙයින් සමාජයට, රටට, ගෙදරට වැඩක් කරන්නත් ඕනේ. ජීවත් වෙන්නම් වාලේ ජීවත් වෙලා දවසක මැරිලා යන එක වැඩක් ඇති වැඩක් නෙවෙයි කියන එකයි මට තව කෙනෙක්ට දෙන්න තියෙන පණිවිඩය."**

එහෙම කියපු තිළිණී ඇගේ ගමනට සහාය වුණු ආදරණීයයන් ගැනත් අවසාන වශයෙන් මේ විදිහට මතක් කළා.

**"මගේ අම්මා, තාත්තා වගේම මගේ අයියා හැමවෙලේම මගේ පිටිපස්සෙන්ම ඉන්නවා. රත්නා පුෂ්පකුමාරි මිස්වත් මතක් කරන්න ඕනේ. මොකද ඇගේ ළමා කුසලතා සංවර්ධන වැඩසටහනට සම්බන්ධ වුණු දවසේ ඉඳලා අද වෙනකල් මම තියපු හැම පියවරක් පිටිපස්සේම ඇයත් ඉන්නවා."**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**
ඡායාරූප - **සමන් අබේසිරිවර්ධන**



එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධව සිට පුනරුත්ථාපනය වූ කතුන්ගේ සුබිත මුදිත ජීවිත කතා පෙළ - 05 වැනි කොටස



සංගීත ගුරුවරියක් මෙන්ම ක්‍රීඩිකාවක ලෙසද දස්කම් දක්වා ඇති කපිතාන් ජයනි හේරත් කලක් අධ්‍යාපන අමාත්‍යංශයේ ක්‍රීඩා සංචිතයේත් රාජකාරි කර ඇත. 1996දී දෙවන ලුතිනන්වරියක ලෙස ජාතික ශිෂ්‍ය භට බළකායට එක්වූ ඇය 2006 වසරේදී සක්‍රිය හමුදා සේවයට එක්වී ඇත. පසුව ඇය යුද සමයේ අවසාන කාලයේදී හමුදා භාරයට පත්වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකාවන්ගේ පුනරුත්ථාපන රාජකාරියටද එක්වූ අතර එලෙස පුනරුත්ථාපනය වූ කොටි සාමාජිකාවන් ගැන කපිතාන් ජයනි හේරත් කියන කතා පෙළයි මේ.



යුද ජයග්‍රහණය සමරණ ජනතාව

LTTE එකට වැඩ කරපු රාජු කියන තරුණයා තමයි කිරිබත් හදන්න මූලිකත්වය අරගෙන කටයුතු කළේ

# ප්‍රභාකරන් මැරුණු දවසෙ කොටි සාමාජිකයිනුත් කිරිබත් හදලා කෑවා

යුද්ධයේ අවසන් දිනය ලෙස සැලකෙන්නේ කොටි නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් මියගිය 2009 මැයි 19 දිනයි. ඒ වනවිටත් වසර ගණනාවක් එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද කොටි සාමාජිකයන් අඹේපුස්ස පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළ රැඳී සිටියහ. එදා දවසේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළ පැවති තත්ත්වය පිළිබඳව කපිතාන් ජයනි අපිට මෙසේ විස්තර කළාය.

"මැයි 19 ද ප්‍රභාකරන් මැරුණ ප්‍රවෘත්තිය දැනගද්දි මම හිටියෙ කෑගල්ල රෝහලේ. එදා දවස ගැන කියන්න කලින් රෝහලට යන්න වුණ හේතුව මම කියන්නම්.

අපේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ වෛද්‍ය මධ්‍යස්ථානයක් තිබුණෙ නැහැ. ඒ නිසා කාටහරි අසනීප වුණාම අපි එක්කරගෙන යන්නේ ළඟම තිබුණ වරකාපොල රෝහලට. එතැන හිටපු වෛද්‍යවරුන් අපි ගියාම රස්තියාදු කරන්නෙ නැතිව ප්‍රතිකාර ලබාදුන්නා. හැබැයි අමාරු වුණාම, ඒ වගේම බරපතළ අසනීප තියෙන අය එක්කරගෙන යන්නෙ කෑගල්ල රෝහලට. 2009 මැයි 19 කියන්නෙ යුද්ධය යන කාලය. එදා දවසෙ කාන්තා/පිරිමි 08 දෙනෙක් රෝහලට එක්කරගෙන යන්න හිටියා. බබෙක් ලැබෙන්න ඉඳපු කොටි තරුණියකුත් හිටියා. එයාගෙ විස්තරය මම පස්සෙ කියන්නම්. මේ අටදෙනා භාර නිලධාරිනිය විදියටයි මම ගියේ. මාත් එක්ක කාන්තා පොලිස් නිලධාරිනියක් සහ පිරිමි පොලිස් නිලධාරියෙක් ගියා. මධ්‍යස්ථානයේ තිබුණ වෑන් එකක තමයි කට්ටිය එක්කරගෙන ගියේ. කොහොමහරි කට්ටියට ප්‍රතිකාර කරද්දි රෝහලේ OPD (බාහිර ප්‍රතිකාර අංශය) එකේ පොඩි කලබලයක් වගේ දැනුණා. මොකද වෙන්නෙ කියලා මම බැලුවා. බාහිර රෝගී අංශයට ප්‍රතිකාර ගන්න එන අයට බලන්න එතැන උඩක රූපවාහිනියක් සවි කරලා තිබුණා. ප්‍රතිකාර ගන්න ආපු අයයි, රෝහල් කාර්ය මණ්ඩලයේ අයයි රූපවාහිනිය බලාගෙන ඉන්නවා. මමත් ඒ පැත්තට ගියා.

'මහ කොටියා ඉවරයි.'

'ප්‍රභාකරන් ඉවරයි.'

'අපිට දැන් නිදහසේ ඉන්න පුළුවන්.'

ඔය වගේ ගොඩක් දේවල් කීවා. මමත් රූපවාහිනිය බලද්දි දැක්කෙ එල්.ටී.ටී.ඊ. නායක ප්‍රභාකරන් මැරිලා, ඔහුගේ මෘත දේහය රූපවාහිනියේ පෙන්නනවා. එතැන ඉඳපු කට්ටිය ගොඩක් උද්දාමයෙන් හිටියේ. මම මධ්‍යස්ථානයේ අණදෙන නිලධාරී කර්නල් ප්‍රනාන්දු සර්ට කෝල් එකක් ගත්තා.

'ඔව් ජයනි ප්‍රභාකරන් මැරිලා. බොඩි එක හම්බවෙලා තියෙනවා. ඔතන තත්ත්වය මොකක්ද?' කියලා ඇහුවා.

'සේරම මිනිස්සු ගොඩක් සතුටෙන් ඉන්නේ' කියලා මම කීවා.

'ඔය සතුට වැඩිවෙලා මොන පැත්තකට පෙරලෙයිද දන්නෙ නැහැ. ඒ නිසා විගහට කට්ටිය අරගෙන කඳවුරට (පුනරුත්ථාපන මධ්‍යස්ථානය) එන්න' කියලා කීවා. එතකොට තමයි මටත් මතක් වුණේ අපි එක්ක ඉන්න අය එල්.ටී.ටී.ඊ. එකේ අය කියලා දන්න නිසා යුද ජයග්‍රහණයෙන් උදම් වෙලා ඉන්න සාමාන්‍ය ජනතාව අපි ගෙනිච්ච ළමයින්ට කරදරයක් කරයිද දන්නෙ නැහැ කියලා. ඒ නිසා ඉක්මනින්ම කට්ටිය වාහනයට නග්ගගෙන ආවා."

"එතකොට කොටි නායක ප්‍රභාකරන් මැරුණා කියලා දැනගත්තම එල්.ටී.ටී.ඊ. අයගේ ප්‍රතිචාරය මොක්කද" මා ඇසීමි.

"වයස වැඩි කීපදෙනෙක් දුකෙන් ඉන්නේ කියලා අපිට තේරුණා. ඒත් ඒ කතාව අපිට කීවේ නැහැ. කොහොමහරි අපි එදා කඳවුරට යද්දි මගදිගට උත්සව. තරුණ අය ජාතික කොඩි අරගෙන පාරේ ප්‍රීති ඝෝෂා නගනවා. තැන් කීපයක කිරිබත් හදලා පාරේ යන අයට දුන්නා. අපේ වාහනයත් නැවැත්තුවා. පාරේ ඉන්න අය දන්නේ නැහැ වාහනය ඇතුළේ කවුද ඉන්නේ කියලා. අපේ නිල ඇඳුම දැකපු ගමන්ම බොහොම උනන්දුවෙන් කිරිබත් බෙදුවා. වාහනයේ ඉඳපු එල්.ටී.ටී.ඊ. තරුණ තරුණියොත් රස කර කර මේ කිරිබත් කෑවා."

සනත් ප්‍රියන්ත

"අඹේපුස්ස වගවිට ප්‍රදේශයේ එල්.ටී.ටී.ඊ. පුනරුත්ථාපන මධ්‍යස්ථානය ආරම්භ කරද්දී මුලින්ම ගම්වාසීන් විරුද්ධ වුණා. පස්සේ ගමේ පන්සලේ නායක ස්වාමීන් වහන්සේ, ප්‍රදේශීය ලේකම්, පොලිස් ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් ගම්වාසීන්ට රැස්වීමක් තිබ්බා. එතැනදී අපි කීවා මේ අයගෙන් තර්ජනයක් නැහැ වැඩි පිරිසක් ඉන්නෙ බලහත්කාරයෙන් ගෙනියපු අය, කොටි සංවිධානය ගැන කළකිරිලා හමුදාවට භාරවුණ අය කියලා. මේ අයට වෛර නොකර අපි උදව් කළොත් සිංහල අය ගැන තියෙන වැරදි වැටහීම් නැතිවෙලා කවදාවත් සිංහල අයට විරුද්ධව ආයුධ අතට ගන්න එකක් නැහැ කියලා. ඊටපස්සෙ තමයි ගම්වාසීන්ගේ කැමැත්ත ලැබුණේ. ගම්වාසීන් පුනරුත්ථාපනය වෙන අයට අනුකම්පා කරලා උදව් කළා. මට මතකයි ඒ කාලේ ප්‍රධාන මාර්ගයේ ඉඳලා පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ත්‍රිරෝද රථ ගාස්තුව රුපියල් 130යි. මධ්‍යස්ථානයේ ඉන්න අයව බලන්න එයාලගේ ඥාතීන් නිතරම එනවා. ත්‍රිරෝද රථ සංගමයේ අය කතා වෙලා ඒ අසරණ දෙමව්පියන්ගෙන්, ඥාතීන්ගෙන් ගත්තේ රුපියල් 100යි.

මුල් කාලයේදී පොඩි සිද්ධියකට කේන්ති ගියත් මේ ළමයි තමන්ගේ අතපය වීදුරු කටුවලින්, බ්ලේඩ්වලින් කපාගෙන තුවාල කරගන්නවා. ඒ වෙලාවෙදි මනෝ වෛද්‍යවරු ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වෙලා ප්‍රතිකාර, උපදෙස් දුනනා.

වරකාපොල රෝහලෙන් ගොඩක් උදව් කළා. පුනරුත්ථාපනය වෙන අය රෝහලට එක්කරගෙන ගියාම අනිත් අය වගේ බෙහෙත් ගන්න පෝලිමේ ඉන්න අවශ්‍ය නැහැ. අපේ නිලධාරීන් මැදිහත් වෙලා බෙහෙත් අරන් දෙනවා. මේ වැඩේට කෑගල්ල රෝහලේ සමහර සුළු සේවකයෝ අකමැතිවෙලා තියෙනවා. යුද හමුදාවේ ඉඳලා ත්‍රස්ථවාදී ප්‍රහාරවලින් මැරුණ අයගේ ළඟම ඥාතීන් තමයි අකමැති වෙලා තියෙන්නේ.

'අහිංසක මිනිස්සු පෝලිමේ ඉද්දි මේ කොටින්ට පෝලිම් නැතිව බෙහෙත් අරන් දෙන්නෙ ඇයි?'



ලුතිනන් කර්නල් ජයම්පති පූලියද්ද
ආරම්භක මධ්‍යස්ථාන භාර නිලධාරී

කියලා අපේ නිලධාරීන්ට කියලා තියෙනවා. හැබැයි කල් යද්දි තත්ත්වය සාමාන්‍ය වුණා."

"ප්‍රභාකරන් මැරුණ දවසේ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ගේ ප්‍රතිචාරය කොහොමද?"

"ළමයි රූපවාහිනිය නරඹමින් ඉද්දි තමයි විශේෂ ප්‍රවෘත්තියක් විදියට දැම්මේ. මේ ප්‍රවෘත්තිය යද්දි ළමයින් ඉබේම අත්පුඩි ගහලා සතුට ප්‍රකාශ කළා. ඊටපස්සේ මම ඇහුවා ඇයි අත්පුඩි ගහලා සතුටු වුණේ කියලා. 'සර් අපි සේරමලා බලෙන් තමයි අරගෙන ගියේ. පැනලා ආපු නිසා අපි බයේ හිටියේ මේකෙන් නිදහස් වෙලා කවදහරි ගමට ගියාම අපිව මරා දමාවි කියලා. ප්‍රභාකරන් මැරුණ නිසා දැන් එහෙම බයක් නැතිව ගමට ගිහින් නිදහසේ ජීවත් වෙන්න, ඉස්කෝලෙ යන්න එහෙම පුළුවන්' කියලා. මේ මධ්‍යස්ථානයේ කාන්තා පිරිමි දෙගොල්ලටම එකට කුස්සියෙන් තමයි කෑම හදලා දුන්නේ. කෑම උයන්න සිවිල් සේවකයින් දෙන්නෙක් බඳවාගෙන හිටියා. එයාලගෙ උදව්වට මධ්‍යස්ථානයේ කීපදෙනෙකුත් පත්කරලා තිබුණා. ඒ වගේ කුස්සියේ උදව්වට හිටියා 'රාජු' කියලා හිටපු එල්.ටී.ටී.ඊ. තරුණයෙක්. ප්‍රභාකරන් මැරුණ සතුටට මේ 'රාජු' මුල් වෙලා පහුවෙනිදා උදේට කිරිබත් හදලා හැමෝටම කන්න දුන්නා."

TV එකේ ප්‍රවෘත්තිය පෙන්වද්දී අපි බෙහෙත් කරන එක පැත්තක තියලා කට්ටියව දාගෙන පුළුවන් තරම් ඉක්මනට පිටත් වුණා

# ඈවෂර්යි

බියංකා නානායක්කාර ලියයි

65 කොටස

**මෙතෙක් කතාව**

විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය සිටි නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. ඒත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරගයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සේපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවලු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරි වුණේය. ඒ අවස්ථාවේ කාටත් රහසින් සෙනෙහෙලතා මැණිකේ ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට නිවසක් මිලදී ගන්නට දුන්නාය. ඔහු නිවසක් මිලට ගත්තද එය අංජනාට සැඟවුයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට සේපාලිකාගේ බලාපොරොත්තුව විය. මේ අතර තේනුකගේ කේන්දරයේ සිකුරුගේ බලය වැඩිවූවා සේ ඔහු නොදැන මංගල යෝජනා දෙකක් පැමිණ තිබුණි. එකක් බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයාගේ සහෝදර ඇමතිවරයෙකුගේ දියණියකි. අනෙක තේනුකගේ මාමාගේ දියණිය චතුමිණිය. ඒ කිසිත් නොදැන තේනුක අංජනාව සමන් දේවාලය වන්දවන්නට කැඳවා ගියේය. විදේශයක සිට ලංකාවට පැමිණ සිටි චතුමිණි දෙමාපියන් සමඟ ඔහු බලන්නට ඒ අතරවාරයේ ඇමති නිල නිවසට පැමිණියාය.

**අද එතැන් සිට**

# අප්පච්චි දැන් අම්මත් එක්ක ගමට යන්න අම්මා ආස ඒ ජීවිතේට....

සෙනෙහෙලතා මැණිකේගේ ප්‍රශ්නය තේනුක බලාපොරොත්තු නොවූවකි. ඒ නිසා ඊට දෙන උත්තරය සැනින් ඔහුට සිතාගන්නට නොහැකි වුණේය. ඔහු සිම්බාගේ හිස මුදුන අතගාමින්ම අම්මා දෙස බලා යන්තමින් සිනාසුණේය.

**"උත්තරයක් දෙනව වෙනුවට හිනාවෙන්නෙ මොකද...?"**

සෙනෙහෙලතා මැණිකේගේ හඬේ වූ සරදම තේනුක ඇඳින්නේය.

**"නෑ, මං මේ කල්පනා කළේ ඒ උත්තරයට ඔච් කියන්නද නෑ කියන්නද කියලා..."**

ඔහු දෙපැත්තටම නැති උත්තරයක් දුන්නේ දිය යුතු උත්තරය ගැන හිතන්නට තව කල් ගන්නටයි.

සෙනෙහෙලතා මැණිකේ ළඟ හුරතල් වූ සිම්බාගේ ඉරියව් එක්වරම වෙනස් වුණේය. වරක් බිරූ සිම්බා සෝෆාවෙන් පැන පිවිසුම් දොර පැත්තට ගියෙන් තේනුකටද ඒ පස බැලුණේය. ඔහුගේ හිතට පහදු දිය නොහැකි සිතිවිල්ලක් දැණුනේ නිවසට ඇතුළුවෙමින් සිටි තෙන්නකෝන් බණ්ඩාර දැක්මෙනි. මේ වහල යටදී ඔහු හමුවුණේ බොහෝ කලකිනි.

**"අප්පච්චි එනවා කිව්වා කෑමට. ඔයාටත් අප්පච්චි එක්කම කෑම කන්න පුළුවන් පොඩි පුතා..."**

**"අනේ අම්මා."**

අම්මා කී කතාවට ඔහුගේ හිත අකමැති වුණේය. ඒ ඔවුන්ගේ සමාගමයේ ගැවසෙන්නට ඇති අකමැත්ත නිසාය.

**"ඇයි ඉතින්. ඔයා අම්මා උයන කෑම කන්න කැමති නැද්ද?"**

**"එහෙම එකක් නෙවේ අම්මා... තේ බීලා දැන් බඩ පිරිලා..."**

තෙන්නකෝන් බණ්ඩාර සෙනෙහෙලතා මැණිකේ ඉඳ සිටි සෝෆා පුටුවේ අනෙක් පසින් ඉඳගත්තේය.

**"මොකද මැණිකෙ ඉලන්දාරියට ගෙදර මතක් වෙලා තියෙන්නෙ හදිස්සියේ?"**

ආයෙත් තේනුක ප්‍රශ්නයක සිරවුණේය.

අම්මාගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නට සිතාගත නොහැකිව සිටි තේනුක අප්පච්චිගේ ප්‍රශ්නෙට දෙන්නට උත්තරයක් සිතුවේය.

**"මං එන්න කියලා ගෙන්න ගත්තෙ. දවස් ගාණකින් දැක්කෙ නෑ. බත් කටක් කන්න දෙන්න බැරි වුණා."**

**"ඒක මිසක්. මෙයා එයි හිතලා අපිව බලන්න. ඒකනේ මං දවසක් කිව්වේ පොඩි පුතා මැණිකෙ කියන ඕන දෙයක් අහනවා කියලා..."**

තෙන්නකෝන් බණ්ඩාරගේ උස් සිනාහඬ අතරේ ඒ කතාව කීවේ කවදද්දැයි සෙනෙහෙලතා මැණිකේට මතක් වුණේය. එදා තෙන්නකෝන් බණ්ඩාරට උවමනා වුයේ බළලුන් ලවා කොස් ඇට බාවගන්නවා වැනි වැඩක් තමන් හරහා කරගන්නට බව ඇයට ආයෙත් සිතුණාය.

"ඒක මිසක්. මෙයා එයි හිතලා අපිව බලන්න. ඒකනේ මං දවසක් කිව්වේ පොඩි පුතා මැණිකෙ කියන ඕන දෙයක් අහනවා කියලා..." තෙන්නකෝන් බණ්ඩාරගේ උස් සිනාහඬ අතරේ ඒ කතාව කීවේ කවදාදැයි සෙනෙහෙලතා මැණිකේට මතක් වුණේය. එදා තෙන්නකෝන් බණ්ඩාරට උවමනා වූයේ බළලුන් ලවා කොස් ඇට බාවගන්නවා වැනි වැඩක් තමන් හරහා කරගන්නට බව ඇයට ආයෙත් සිතුණාය.

**"මං මේ වටපිටාවට කැමති නෑ අප්පච්චි... අපි පොඩි කාලේ හැදුනා වගේ ලස්සන නිදහස් ජීවිතයක් මට ඕන..."**

තේනුක කීවේ ඇත්තම කතාවයි. එදවස අප්පච්චි ව්‍යාපාර කටයුතු කළත් ඒ ජීවිතයේ සුන්දරත්වයක් හා සරල බවක් තිබුණි. අද ඒ දෙකම නැත. ගේ දොර උස් තාප්ප ගේට්ටුවලින් වටකරගෙන හිඳිනවා මදිවට තනිවම ගමනක් බිමනක් යාමේ නිදහසක් ද ඔහුට නැත. ඒ කාලයේ ගෙදර සිට ව්‍යාපාරික ස්ථානයට ඔහු වාහනයෙන් ගියේ තනිවමය. නිවාඩු වෙලාවන් හිදී කොට කලිසමක් හැඳ වතු පිටිවල තනිව කොතෙක් ඇවිද්දද? ඒ පසුපස තමන් කොතෙක් ගියාද කියාත් තේනුකට මතක් වුණේය. ඒ ජීවිතය හැරදැ වැළඳගත් සැනසීමක් නැති මේ ජීවිතයේ එල ඔහුට වටහා ගන්නට මේ දුවන දිවිල්ල නැවතුණ දිනක හැකිවනු ඇත.

**"මැණිකෙ තේ එකක් බොමුද කන්ඩ කලින්...?"**

දෙපතුළෙහි දැවටෙමින් සිටි සිම්බාගේ හිස පිරිමදිමින් ඔහු කීවේ ගැඹුරු හඬිනි.

**"මිනිස්සුන්ට වඩා හොඳ ගතිගුණ මේ සත්තු ගාව තියෙනවා..."**

සිම්බාගේ මුහුණට මුහුණ ළංකරමින් ඔහු කියද්දී තේනුකගේ දෙතොළට සරදම් සිනාවක් ද නැගුණි. ඒ ඔහුට සිම්බා සුරතල් කරන්නට වෙලාවක් ඇති බව ඒ කතාවේ තිබූ නිසාය. සමහර විට ඒ රාත්‍රිය වන්නට ඇත. ඕනකමක් තිබේ නම් ගෙදර රැඳෙන්නට ඕනෑ මිනිසෙකුට වෙලාව හදගන්නට පුළුවන. තෙන්නකෝන් බණ්ඩාරට නැත්තේ ඒ වෙලාවය. පාර්ලිමේන්තුව තිබ්බත් නොතිබ්බත් ඔහු ගෙදර නැත. ඔහු බදාදා දිනයේ ජනතාව හමුවන්නේ ඔහුගේ කාර්යාලයේ සිටය. සෙනෙහෙලතා මැණිකේ ඉඳ සිටි තැනින් ගෙතුළට නැගිට ගියාය. තේනුක ඇමති නිවසේ බිත්තියේ වූ විසල් ඔරලෝසුව දෙස බැලුවේය. එහි වෙලාව දහවල් දෙකයි තිහද පසුව තිබුණි.

**"මොකද වෙලාව බැලුවෙ... යන්නද? මොකද්ද පොඩි පුතා තමුන් ඔය දුක් විඳ විඳ ගෙවන ජීවිතේ?"**

තෙන්නකෝන් බණ්ඩාර ඇසුවේ තේනුකගේ මුහුණ දෙස කෙළින් බලාගෙනය. මේනකගේත් ඔහුගේත් මුහුණුවර එක වූවාට තේනුක ළඟ ඇත්තේ අමුතු ලස්සනක් කියා තෙන්නකෝන් බණ්ඩාරට සිතුණි. සෙනෙහෙලතා මැණිකේ කතාවට කියන්නා සේම මේනක ළඟ මේ ගතිය නැත.

**"ඇයි අප්පච්චි... මං දුක් විඳින්නෙ නෑ. හරිම නිදහසේ සතුටින් ජීවත්වෙනවා..."**

**"අර මගෙ ගම්පහ ගෙදර ඉන්න කට්ටියට මං යන්න කියලා තියෙන්නේ. ලබන මාසෙ ඒ ගේ හිස් වෙනවා. ඔයාට ඒක මං ලියලම දෙන්නම් පොඩි පුතා..."**

**"අපරාදෙ අප්පච්චි... ඒ මිනිස්සුන්ව කලබලෙන් යැව්වේ. මට දැන් ඉන්න තැන හොඳයි. අනික ගම්පහ මට දුරයි ෂොප් එකට... ඒ හින්ද ඒක අප්පච්චි නමටම තියාගන්න."**

පියා කී දෙය තේනුක හිත නොරිදෙන සේ කාරුණිකව ප්‍රතික්ෂේප කළේය. තෙන්නකෝන් බණ්ඩාරට තම බාල පුත්‍රයා ගැන පුදුම සිතුණි. ඊට පෙර අවස්ථාවක තියෙන වාහනය විකුණා හොඳ වාහනයක් ගන්නට කියා මුදල් දෙන්නට සූදානම් වූ මොහොතේ ඔහු ඒ මුදල් ප්‍රතික්ෂේප කළේත් මෙලෙසමය.

**"වැඩි දේවල් නැතුව මෙහෙම ජීවත් වෙද්දී හිතට හරි නිදහස් අප්පච්චි. හොඳට නින්ද යනවත් එක්ක..."**

තමන් දුන් උත්තරයෙන් පියා සිත රිදවාගත්තා දැයි සැක සිතී ඔහු කීවේය.

**"ඒ වුණාට සැපේ ජීවත්වෙන්න ලැබුණොත් හිතෙයි, අනේ මං මෙච්චරකල් ඇයි මේ දුක් වින්දෙ කියලා..."**

ඒ කතාවටම විහිළුවෙන් සේ උත්තර දුන් තෙන්නකෝන් බණ්ඩාර පුරුදු උස් හඬින් සිනාසුණේය.

**"අනේ නෑ අප්පච්චි... මං නම් එහෙම හිතන්නෙ නෑ. අනික මං හොඳ ගෙයක් වාහනයක් කවදහරි ගන්නව නම් මං හම්බ කරපු සල්ලිවලින් තමයි ගන්නේ..."**

**"ඇයි මං හම්බකරපුවා සල්ලි නෙවේද පොඩි පුතා?"**

තේනුක ඊට උත්තර දෙන්නට මදක් හිතුවේය. අප්පච්චි හම්බවූයේ කාලෙකිනි. ඇත්ත කතා කරන්නට ගොස් මේ වගේ මොහොතක ඔහු හා වාද කරන එක හොඳ නැත. අප්පච්චි මේ හම්බ කර ඇත්තේ සාධාරණ මුදල් නොවන බව ඔහු හොඳකාරවම දනියි. ඔහුට ඇමතිකමෙන් ලැබෙන පඩියෙන් ගෙවල් තුන හතර ගන්නත් හිතුමතේ වියදම් කරන්නටත් කිසිසේත් පුළුවන්කමක් නැත.

**"පොඩි පුතා... ඔයා කවදාවත් මං දෙන දෙයක් ගන්නෙ නෑ... මං මේ හම්බ කරන්නේ මට යනකොට ගෙනියන්න නෙවේ. ඔයාටයි, අයියටයි, අක්කටයි..."**

තෙන්නකෝන් බණ්ඩාර උස් හඬ පසෙකලා නිවුණු හඬින් කීවේය.

**"ඒක එහෙම නම් මං අප්පච්චිට යෝජනාවක් කරන්නම්."**

**"මොකද්ද?"**

සෙනෙහෙලතා මැණිකේ වැලිතලප පිඟානක් ගෙනැවිත් ඔවුන් ඉඳසිටි තැන සෝෆාව මතින් තබා ගියාය. ඇත්තටම ඇයට ඕනෑවූයේ කෑම පිඟානක් තබන්නට නොව ඔවුන් කතා වන්නේ මොනවා දැයි අසා දැනගන්නටයි. ඒත් සවනට වැටුණේ අගක් මුලක් නැති වාක්‍ය කීපයකි.

**"දැන් අප්පච්චිගෙ දරුවො ලොකුයි. ඒ ගොල්ලොන්ට තමන්ගෙ ජීවිතේ ගොඩනගා ගන්න පුළුවන්. ඒ හින්ද අප්පච්චි දැන් පැන්ෂන් ගන්ඩ..."**

තේනුකගේ කතාවට තෙන්නකෝන් බණ්ඩාර කේන්ති ගත්තේ නැත.


**"පැන්ෂන් අරන්...?"**

**"අම්මත් එක්ක ගමට යන්න... එහෙ ගෙවපු ලස්සන ජීවිතේට අප්පච්චි ආස නැද්ද? අම්මා පව්... අම්මා ආස ඒ ජීවිතේට..."**

**"මේ රස්සාවට ආවට පස්සෙ එහෙම යන්න බෑ පොඩි පුතා. එකක් යන්න හිත දෙන්නෙ නෑ... අනික යන්න දෙන්නෙ නෑ. ඔය වැඩකට නැති කතාව නවත්තලා මං කියන දේ අහන්න. ඔයාට සල්ලි හම්බ කරන්න ඔච්චර මහන්සිවෙන්න ඕන නෑ මේක හරි ගියොත්..."**

තෙන්නකෝන් බණ්ඩාර මවාගත් සෙනේවන්තකමකින් කීවේය.

ලබන සතියට...



# කිහිල්ල ගැන කිසි ඇහිල්ලක් බැලිල්ලක් නැද්ද?



අද අපි කතා කරන්නේ අත් යට එහෙමත් නැත්තම් කිහිලි ප්‍රදේශය අවපැහැ ගැන්වෙන එක ගැන.

බොහෝම ඉස්සර ඉඳපු ගෑනු උදවිය නම් අත් යට ප්‍රදේශය ගැන උනන්දු වුණා කියලා කියන්න කිසිම සාක්ෂියක් නැහැ. හැබැයි අසූව දශකයේ අගභාගය විතර වෙනකොට යුරෝපීය කාන්තාවන් අතර අත් රහිත ඇඳුම් මෝස්තර ප්‍රසිද්ධ වෙන්න පටන් අරන් තියෙනවා. එතුවක් කාලෙකට වහන් කරන් ඉඳපු අත යට ප්‍රදේශය සමාජෙට විවර වෙන්න ගත්තෙ ඔය කාලෙලු.

ඒ වගේම හොලිවුඩ් කර්මාන්තයේ නැගී ඒමත් එක්ක තරුණ ගෑනු ළමයින්ට චිත්‍රපටි නිළියෝ වීමේ උන්මාදයකුත් ඇතිවෙලා තියෙනවනේ. ඉතින් තිර පරීක්ශණවලදි (Screen Test) ගැහැනු අය කිහිල්ල ප්‍රදර්ශනය වෙන ආකාරයට ඡායාරූපවලට පෙනී සිටින්න ඕනෙලු. එතකොට අත් යට කළු නම් හෝ අනවශ්‍ය රෝම එහෙම තියෙනවා නම් ඒ කෙනා තිර පරීක්ෂණයෙන් අසමත්!

**අත් යට කළු වෙන්න බලපාන ඊළඟ ප්‍රධානම කාරණාව තමයි රේසරය භාවිතා කරලා අනවශ්‍ය රෝම ඉවත් කරන එක**

ලොකේ මුලින්ම බියුටි පැජන්ට් කියන ජාතිය පටන් අරන් තියෙන්නේ ඇමරිකාව. ඒ 'මිස් ඇමරිකා' කියන පැජන්ට් එකෙන්. ඉතින් මිස් ඇමරිකා තෝරනකොටත් තරඟකාරියන්ගේ අත් යට සුදුද, කළුද, ලස්සනද කියලා හොයලා බැලුවලු. ඊටපස්සේ තමයි එහෙ කාන්තාවොත් කිහිල්ල ගැනත් හිතන්න පටන් අරන් තියෙන්නේ.

මූණ කොච්චර ලස්සන වුණත් කිහිල්ල අවපැහැගැන්වුණු කෙනෙක්ට ආසාවටවත් අත් නැති ඇඳුමක් අඳින්න බැහැ. අනික මේක කෙනෙක්ට අපුල දනවන දෙයක් වෙන්නත් ඉඩ තියෙනවා. ඒ නිසා අත් යට කළු වෙන එක කෙනෙක්ගේ පුද්ගලික සබඳතාවලටත් අහිතකර ලෙස බලපාන්න පුළුවන්.

අපේ කිහිල්ල ප්‍රදේශයේ තියෙන දහඩිය ග්‍රන්ථිවලින් වැඩිපුර දහඩිය පිටවෙනවා. ඒ නිසා මේ ප්‍රදේශයේ ආම්ලිකතාවය සාපේක්ෂව ඉහළයි. ඒ නිසා මෙතැන බැක්ටීරියා වර්ධනය වෙනවත් වැඩියි. අනික මේ ප්‍රදේශයට හරි හමන් වාතාශ්‍රයක් ලැබෙන්නෙත් නැහැ. ඉතින් ඒ නිසා හරියට බලාගන්නේ නැත්තම් කිහිල්ල කොහොමත් කළු වෙනවා.

අත් යට කළු වෙන්න බලපාන ඊළඟ ප්‍රධානම කාරණාව තමයි රේසරය භාවිතා කරලා අනවශ්‍ය රෝම ඉවත් කරන එක. කිහිල්ලේ සම හරිම සංවේදියි. මේ ප්‍රදෙශයේ සම ඇස් යට සමට සමානයිලු. ඉතින් මෙතැනත් මලක් වගේ බලාගන්න ඕන තැනක්. රේසරයකින් කිහිල්ලේ අනවශ්‍ය රෝම ඉවත් කරද්දී සමේ ඇහැට නොපෙනෙන සියුම් සීරීම් ඇති වෙනවා. ඉතින් දිගින් දිගටම රේසරය භාවිතා කරද්දි අත් යට නිකම්ම වගේ කළු වෙනවා. අනික ඉතින් රේසර් කරද්දි ඉවත් වෙන්නේ රෝම කූපවල උඩ කොටස විතරනේ. එතකොට රෝම මූලය සමේම ඉතිරි වෙලා කිහිල්ල කොහොමත් කළු පාටට පේනවා. රේසරවල ලෝහ ඇලජික් වෙන අයත් ඉන්නවා. හැබැයි තමන්ට රේසරේ ඇලජික් වෙලා කියලත් සමහරු දන්නෙ නෑ. එහෙම වුණාම තමා රෝම ඉවත් කළාට පස්සේ බිබිලි, රතු ලප එහෙම ඇති වෙන්නේ. කාලයක් තිස්සේ මේවා ඇති වුණාමත් අත් යට කළු වෙනවා.

කිහිල්ලේ තියෙන රෝම ඉවත් කරන්න හොඳම ක්‍රමේ තමා වැක්ස් කරන එක. නැත්තම් ලේසර් කරලා රෝම වදයෙන් සදහටම මිදෙන එක. ඒත් ඉතින් රේසරය භාවිත නොකරම බැහැ කියලා හිතෙනවා නම් ශේව් කරන්න කලින් කිහිල්ල මත ශේවින් ක්‍රීම් ටිකක් හරි කෝමාරිකා යුෂ ටිකක් හරි ගාන්න අමතක කරන්න එපා. ශේව් කරද්දි රේසරය රෝම වැවිලා තියෙන දිශාවට විතරක් ගෙනියන්න මතක තියාගන්න. අනික එකම තැනින් දෙපාරක් රේසරය ගෙනියන්න එපා. ශේව් කරලා ඉවර වුණු හැටියේ අත් යට පිරිසුදු කරලා හොඳට තෙතමාත්තු කරන්න.

මොකද හරි හැටි තෙතමාත්තු නොකිරීමත් අත් යට කළු වෙන්න එක හේතුවක්. එහෙම කරලා මොයිස්චරයිසර් ක්‍රීම් ටිකක් ගාන එකත් වැදගත්. අහ්... තව දෙයක් එකම රේසරය හතර පස් වතාවකට වඩා භාවිත කරන්නත් එපා. මොට්ටා වුණු රේසරවලින් අත් යටට වෙන හානිය වැඩියි.

ඊළඟ කාරණාව මද්‍යසාර අඩංගු ඩියෝඩ්‍රන්ට් සහ සුවඳ විලවුන් භාවිතය. අත් යට සම බොහොම සියුමැලියි කිව්වනේ. ඉතින් මේ වගේ දේ නිතර කිහිල්ලේ තැවරුණාම ඒ රසායනික සංයෝග සමට ආසාත්මික වෙලා අත් යට අවපැහැවෙනවා. ඒ නිසා ඩියෝඩ්‍රන්ට් හරි සුවඳ විලවුන් හරි මිලදී ගන්නකොට මද්‍යසාර රහිත ප්‍රමිතිගත ඒවා ගන්න.

මූණේ මැරුණු සම ඉවත් කළාට ගොඩක් අය මේ ප්‍රදේශවල මැරුණු සම ඉවත් කරන්නේ නෑනේ. ඒකත් කිහිල්ල කළු වෙන්න හේතුවක්. ඊට අමතරව හෝර්මෝන ගැටලු සහ ජානමය තත්ත්වයන් නිසාත් ගොඩක් අයගේ අත් යට කළු වෙනවා. ඒ දේවල්වලට නම් අනිවාර්යයෙන්ම ප්‍රතිකාර ගන්නම වෙනවා.

ඒ වගේ ගැටලු ඇරුණුකොට අපි කලින් කිව්ව හේතු නිසා අත් යට කළු වුණු කෙනෙක් නම් මෙන්න මේ සත්කාර කරලා බලන්න.

අයිස් කැට කිහිපයක් අරගෙන කපු රෙදි කෑල්ලක ඔතලා නින්දට යන්න කලින් විනාඩි දහයක් විතර අත් යට තියාගෙන ඉන්න. මේ සත්කාරය දිනපතා කරන තරමට ප්‍රතිඵල වැඩියි. තව එතකොට කස්තුරි කහ කඩල පිටි සහ ලෙමන් යුෂ ටිකක් එකට මිශ්‍ර කරලා අත් යට ආලේප කරන්න. විනාඩි 15ක් තියලා සෝදලා අරින්න.

දෙහි ලෙලි ටිකක් වියළලා කුඩු කරලා ඒකට මුල්තානි මිට්ටි සහ රෝස වතුර මිශ්‍ර කරලා ආලේප කරන්න.

ලෙමන් යුෂ සහ සියුම් සීනි මිශ්‍ර කරලා අත් යට සියුම්වට ස්ක්‍රබ් කරන්න. අර්තාපල් පෙත්තක් කපලා විනාඩි කිහිපයක් අත් යට තියාගෙන ඉන්න එකත් කිහිල්ලට හොඳ සත්කාරයක්.

**කිහිල්ලේ තියෙන රෝම ඉවත් කරන්න හොඳම ක්‍රමේ තමා වැක්ස් කරන එක. නැත්තම් ලේසර් කරලා රෝම වදයෙන් සදහටම මිදෙන එක**

කිහිල්ල ප්‍රදේශයේ ආසාදන, රතුවීම්, කැසීම්, බිබිලි වගේ දේවල් තියෙනවා නම් ඉක්මනටම ප්‍රතිකාර කරන්න.

හැබැයි මේ මොන සත්කාරය කළත් අත් යට සම එකපාර යථා තත්ත්වයට පත් කරන්න බැහැ. ඒකට කාලයක් ගත වෙනවා. ඉතින් අත් යට කළු වෙන්න නොදී ආදරෙන් බලාගන්න එක තමයි හොඳම වැඩේ.

*සෙව්වන්දි හෙට්ටිආරච්චි*

පාඩම් අංක 16

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදිම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් අද කියන්නේ ස්වයං රැකියාවක් විදියට කර දහයියා හදන හැටි.**

ස්වයං රැකියා

# ජීවන බර තුනී වෙන්න කර දහයියා අපිට පිහිට වෙන්න

ගෙදරට ඕන කරන එළවළු, පළා ටික හරි ගෙවල්වලම හදාගන්න ඕන කියලා කට්ටියට මතක් වෙන්නේ මෙන්න මේ වගේ බඩු මිල අහස උසට ඉහළ ගියාම. කමකුත් නෑ ඉතින් නහය ගාවට හිරවෙනකන් ඉඳලා හරි තමන්ගේ වත්ත පිටියේ වගා කරගන්න හිතෙනවා කියන්නෙ අගය කරන්න ඕන වැඩක්. හැබැයි පුංචි හෝ ගෙවත්තක් නැති අයට පෝච්චිවල ගස් හිටවන්න ගියාම හරිහමන් වගා මාධ්‍යක් හොයාගන්න එක ප්‍රශ්නයක් වෙලා. අනික මේ තියෙන පොහොර ගැටලුවත් දැන් ගෙවතු වගාවට පරහක් වෙලානේ. ඉතින් වගා සම්බන්ධයෙන් තියෙන එකී මෙකී නොකී ගැටලු කිහිපයකටම විසඳුම් දෙන බොහොම වැදගත් නිෂ්පාදනක් ගැන තමයි අද ස්වයං රැකියා පාඩමෙන් කියලා දෙන්නේ.

ආ... තව දෙයක්. ස්වයං රැකියාවකට ආයෝජනය කරන්න අතේ මුදලක් නෑ කියලා සංතාපයෙන් ඉන්න අයත් ඉන්නවනේ. ඔන්න ඒ වගේ අයටත් ටක්කෙටම ගැළපෙන වැඩක් මේක. මොකද මේ වැඩේට අපෙන් සත පහක්වත් වියදම් වෙන්නේ නැහැ. හැබැයි ටිකක් මහන්සි වෙන්න නම් ඕන.

අපි අද හදන්නේ කර දහයියා. සමහරු මේවට කුන්තාන් කියලත් කියනවා. පෝච්චිවල වගා කරන කෙනෙක්ට පස්වලට මිශ්‍ර කරන අනෙකුත් මාධ්‍ය වෙනුවට විකල්පයක් විදියටත් මේ කර දහයියා භාවිතා කරන්න පුළුවන්.

ඊට අමතරව ශාක මාධ්‍යයේ වැඩි කාලයක් ජලය රඳවාගැනීමේ හැකියාවකුත් කර දහයියාවලට තියෙනවා. ඉතින් වර්ෂාපතනය අඩු කාලෙකදී කර දහයියා සහිත මාධ්‍යකට සතියකට වතාවත් වතුර යෙදුවත් ඇති.

ශාකවලට දිලීර රෝග ඇතිවෙන්න එක හේතුවක් තමයි පස ජීවානුහරණය නොකිරීම. හැබැයි ගස්වලට කර දහයියා දානවා නම් දිලීර රෝග ඇතිවීමත් අවම වෙනවා.

කර දහයියාවල සිලිකා සහ පොටෑසියම් බහුලයි. ඒ නිසා මේවා කාබනික පොහොරක් විදියටත් භාවිතා කරන්න පුළුවන්.

ඕනම ගහක වටේට කර දහයියා ටිකක් ඉස්සොත් ඒ ගහට ගොලුබෙල්ලෝ එන්නෙත් නැහැලු. අනික ගස්වල මුල් කුණු වෙනවටත් මේක සුපිරි බෙහෙත.

මේ වගේ වාසි ගොඩක් තියෙන නිසා මහා පරිමාණ වගා කරන ගොවීන් පවා එයාලගේ පස් මිශ්‍රණයට කර දහයියා මිශ්‍ර කරනවා. ඉතින් ඒ නිසා කර දහයියා නිෂ්පාදන අලෙවි කරගන්න එක ඒ හැටි වැඩක් නෙමෙයි.

කර දහයියා නිෂ්පාදනයට අපිට දහයියා 50Kgක් විතර අවශ්‍යයි. ගම් පළාතේ තියෙන හාල් මෝලකින් අපතේ හරින දහයියා ටිකක් මේ වැඩේට යොදාගන්න පුළුවන්.

දහයියාවලට අමතරව අපිට පොල්කටුවකුත් අවශ්‍ය වෙනවා.

ඔන්න මුලින්ම තැනිතලා පොළොවක දහයියා ටික කන්දක් විදියට ගොඩගහගන්න.













**1 පියවර**

**පොල් කට්ටට දහයියා ටිකක් පුරවගෙන ඒකට භූමිතෙල් ටිකක් එහෙම දලා ඒක දහයියා කන්ද උඩින් තියලා පුළුස්සන්න.**

**2 පියවර**

**දැන් මේක හෙමි හෙමිහිට පිච්චෙන්න දෙන්න. පොල් කටුව මුදුනෙන් තියෙන නිසා මේ දහයියා කන්ද ඇතුළෙන් බෙනයක් වගේ පිච්චෙනවා.**

**3 පියවර**

**මේ විදියට පැය 12ක් විතර දහයියා කන්ද පුච්චගන්න ඕනේ. හැබැයි ඒ ගැන හොඳ අවධානයකින් ඉන්න එකත් වැදගත්. මොකද දහයියා ටික අඟුරුවෙලා ගියොත් වැය කරපු මහන්සියත් නිකන්ම වතුරේ යනවා.**

**3 පියවර**

**පැය 12කට පස්සේ සවලක් අරන් සිමෙන්ති අනන තාලෙට දහයියා ටික අනාගන්න. ඊටපස්සේ දහයියා ගොඩ තුනී කරලා හොස් පයිප්පයකින් වතුර දන ගමන් සම්පූර්ණයෙන්ම ගින්දර නිවාගන්න.**

**ඊටපස්සේ තියෙන්නේ ඉතින් පැකට් කරන එක.**

මේ කර දහයියා 1Kgක් රුපියල් 100-150ක් වගේ මිලකට අලෙවි කරන්න පුළුවන්. වැඩිදුර විස්තර දැගන්න අවශ්‍ය නම් 0714766819 කියන අංකයට කතා කරන්න.



**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# විවිධ හැඩයේ සාරි බ්ලවුස් මෝස්තර


පාඩම් අංක 30

## කරපටි මෝස්තරය













## පිටුපස කෝඩ් සහිත මෝස්තර







## පිටුපසින් බකල්ස් සහිත මෝස්තරය







## පිටුපස Cross over මෝස්තරය






## පිටුපස ගැටගසන මෝස්තර








ප්‍රවීණ ඇඳුම් මෝස්තර
නිර්මාණ පුහුණු දේශක
සහ බතික් කලාව පිළිබඳව
පුහුණු දේශක
**චමින්ද කුමාර**
*You tube -*
*Smart Fashion Lanka*

## ධරණීට දිගු ගමනක්

සඳුද දිනය එනතුරු මඟ බලාගෙන
ඉන්නා අයට රස ඔවදන් සදගෙන
ධරණී නමින් අපෙ දුක සැප බෙදගෙන
වැජඹේවා ධරණී මිහි පිට සදතන

ධරණී අපේ හදවත් තුළ වැජඹේවා
සැම අකුරක්ම කියවා හද සැනසේවා
ලොකු පොඩි අපි සැමට පිලි සරණක් වූවා
ධරණී ඔබට දිගු ගමනක් සැරදේවා!

● **එච්.සීලවතී**
**නක්කාවිට**

## නිහඬ හෝරාව

මහා උස් ගස් සම්බාරයක් එකට ගැටෙමින්
නගන මහ හඬ කාට ඇසුණිද
හඬා නොහඬා හඬන මා හද ගයන ගීතය
ගොසින් හිමිහිට පවසන්න හැකිවේද

ගෙවන අඩහෝරා නොවන මුත් කෙලවරක්
වේගයෙන් ගෙවාගොස් ඉසිඹුලන්නට හැකි නම්
තව දහස් වසරකුදු ඔබ නැතිව ඔබ එක්ක
ගෙවන්නට හැකි වේ නම් ජීවිතය
සොම්නසින් දරා ගම් නැගෙන මා හද ශෝක

සිනා සෙන්නට වරම් ලබනට පින් මදියි නම් මේ බවේ
හඬා පලයක් ඇතොත් නැතිවෙයි නිහඬ ඉරණම කොහෙ ගියේ
ගන සමුදුර නගන රළ හඬ නැගෙයි මා සිත වෙනේ
නොදැන ඔබ රුව ගෙවන සමයක්
මටත් දැන් සිහිනයක් වගේ

● **A.P. ජයරත්න**

## අහිමි සඳ නුඹ

අසෙනි වැසි ඇදවැටුණ
දිනෙක හමුවුණා ඔබ
මාවතේ බෝ දුරක්
ගොස් ඇතත් නුපුරුදුව
පෙම් කළේ ඔබට නොව
මගෙ හිතට හැමදම

ළබැඳි හුන් අපි අපිට
වෙන් කරන මග ලකුණු
කියාපන් ඒ සිතට
තවම මම ඔහු සිතඟ

නිමේශයෙන් අමතකව
ගියා ආදරේ අසරණව
මට දැනේ තවම ඔබ
හිඳිනවා මා අසල

දුරාතීතේ ගිරි කඳුරු
මාවතේ පිපුණ ඒ
විස පෙවූ කදුරු මල
සිඹින්නට නොව මතකයන්
පමණක්ව නිසාවෙන්
කෙසේනම් නවතිම්ද
බැස ගියේ සඳ මගේ

● **එම්.පී.එන්.වාසනා**
**දෙණියාය**

## ඔබ බැව්න

රුදු රැයට පෙම් බඳිමි
සඳ එළියි
ඔබ බැව්න

වාලුකා කතර මැද සැරිසරමි
මිරිඟු දිය සිහිනයක
ඔබ හිඳිත

තුෂර කඳුළෙහි රැඳුණු
ජීවිතය තව විඳිමි

වියැළෙනා තුරාවෙහි
තෙත සිහිල

ඔබ බැව්න

● **චමින්ද රොෂාන්**

# කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත
ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න
සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක

## අතිඋතුම් සුපින්වත් වස්සාන කාලයයි

නිකිණි සඳ මෝදු වී නුබ ගැබෙහි හිනැහුණා
සඳ එළිය තරු එළිය බෝ මළුවෙ පැතිරුණා
බොදු දනගෙ සුදුවතින් වෙහෙර බිම සැරසුණා
වස් වසන්නට සමය පින්බරව එළැඹුණා

කෙළෙස් පව් මැඩලන්න දිරිගන්න කාලයයි
සිත නිවා අම නිවන ලැබගන්න කාලයයි
බණදහම් අසන්නට මේ හොඳම කාලයයි
අතිඋතුම් සුපින්වත් වස්සාන කාලයයි

● **ඊ.ඒ.ඒ.එදිරිසූරිය**
**හිඳගොල්ල**

## අත්තම්මගේ කවිය

හෙමි හෙමින් පා පොඩි නගාලා කිරි සිනා මුව පුරවලා
මගෙ මැණික එයි මා සොයාලා දනිමි ඒ බව සඟවලා
කිමද මේ හැටි ආදරේ අද ඇසූ විට පොඩි අත් සලා
හනික මා අත රැගෙන යන්නේ මවගෙ තහනම ඉවතලා

නගින්නට පඩි තනිව නොහැකියි ඉතින් මම පසුපස එමී
නටන්නට හැර පුටුව මත්තේ බියෙන් ළඟටම වී ඉමී
පුතේ හනිකට ලොකු වෙයන් මම එවිට රහසක් පවසමී
කියා දෙන්නම් බිඳින හැටි නුඹ වටා ඇති දහසක් බැමී

බලා ගන්නට කවුරු හිටියත් මගේ පුතු මා වෙතම ළං කර
තබා ගන්නට තියේ නම් ඒ තමයි මාගේ හීනෙ සුන්දර
පන්සලටවත් යන්ට හිත නෑ දමාලා මෙහි නුඹව තනිකර
දන්නවද මගෙ පුංචි කුමරෝ කළා නුඹ මගෙ නිවන බෝ දුර

● **මියුරින් සොයිසා**
**රක්වාන**

## ඇත්තට ඔබ කවුද?

හවයෙහි කිමිද මෙලොවෙහි ඉපද
යුග යුග පැමිණ දුක් විඳ සොව්න
නන් දෙස බලන ඇසිපිය සැලෙන
ඇත්තටම ඔබ කවුද?

සොඳුරිය කියන සැම දේ සොයන
සිත ඇස සවන නොම ලත් නිවන
ඔබ වට නිතින දිව රෑ සරන
ඇත්තටම ඔබ කවුද?

මව්පිය ඇසුර සොයනා අයුර
විගසින් අතැර දෙවඟන සිරුර
දරනා ළඳුන වෙත ඇස සොවන
ඇත්තටම ඔබ කවුද?

අතකින් බිරිඳ අතකින් සුතන
දරමින් සඳ යන්නේ කොතැන
ආපසු ඇවිද නොනැවත දුවන
ඇත්තටම ඔබ කවුද?

බණ පද සොයන වඩනා බවුන
තපසුන් වෙසෙන අරණා කොතැන
සොයනා පමණ ඉතිරිය එතැන
කම්පල නොදැන ආ මේ ගමන
නිමවා හරින තැන ඇත එතැන
ඇත්තටම ඔබ කවුද?

● **රත්න කොඩිකාර**
**නාවින්න**



## ආදර තිළිණය

වත්ත පුරා දුව පනිමින්
අහුමුළුවල හැංගි හැංගි
ළපටි වියේ කළ සෙල්ලම්
අමතක නෑ අපි දෙන්නට

ළපටි හැඟුම් මල්වර වී
සිතේ කොනක මුළුගැන්වී
නැකතට එළියට ආද
සතුට සිත තුළ පිනුම් ගැහුවා

විසිපස් වසරකට කලින්
ලද ඒ ආදර තිළිණය
කුණු දූවිලි කිසිත් නැතුව
අදටත් අපි දෙන්නා ළඟ

● **ධර්මදාම කහල්ල**
**ගම්පොළ**

## සඳ සාවී

සා පැටවුන්ට ජීවිතයම
දන්දුන් සාවී
රෝහලට උදෙන්ම
එනවා පේවී

අසරණයින්ගෙ දුක-සැප
විමසා දේවී
නිවසට යන්නෙ
රෑ වී දේවතාවී

පැටවුන් සමඟ
නිදියනවිට තුරුල් වී
මගෙ ඇස්දෙකම
කඳුළින් ඔබ තෙමාවී

● **සමන් සුරවීර ආරච්චි**
**රඹුක්කන**

## අතැර ගිය සරසවි ප්‍රේමය

මහවැලිය පිස හමන සුළගේ
නුඹේ සුවඳයි වින්දේ මං
හන්තාන කඳු මුදුන අතරින්
එබුණු හිරුයැයි නුඹට මං

කීව නුඹ අද මාව හැරද
ගියද තාමත් නුඹට මං
සරසවිය පාමුලේ පිදුවේ
ඔබට පමණිය සෙනෙහෙ මං

පුංචි රොබරෝසියා මලක්ය
අතීතෙදි නුඹට මං
වැටුණු මල්මත දෙපා තබමින්
සෙමින් පියවර තබමි මං

ගසන් නෑ අද වලත් පාළුයි
රඟමඬල මැද තනිව මං
හන්තාන ළඟ මහවැලිය මැද
සිතින් අසරණ වුණා මං

දිගු කලක් ගත වුණා නොදැනිම
සිහින ජයගන්නටම මං
තුන්මහල් සරසවිය පාමුල
මතක හිත යට තබා මං

කඳුළු අරණක මතක සයුරක
ජීවිතයෙ කව ලියූ මං
ඉකි බිඳින සිත හන්තාන ළඟ
මතක මිහිදන් කළා මං

● **ඉන්දිකා චන්ද්‍රමාලි**
**ගලහිටියාව**

HOME

සබඳකම් අලුත් වෙන

SLTMOBITEL

එක්මහේ වාසි

SLT-MOBITEL Home පාරිභෝගිකයන්ට

සුවිශේෂී අවුරුදු දීමනා

FIBRE සුවිශේෂී දීමනා

අලුත් Fibre සබඳතා ලබාගැනීමේ දී

රු. 10,000/- online මඟින්.

රු. 12,500/- ප්‍රාදේශීය කාර්යාලයෙන්.

සෑම අලුත් සබඳතාවකටම

100 GB (Bonus GB)*
10 GB Messenger*
25 GB YouTube*
25 GB gaming*

*Unlimited package සඳහා අදාළ නොවේ.

4G LTE සුවිශේෂී දීමනා

සෑම අලුත් සබඳතාවකටම

50 GB (Bonus GB)*
10 GB Messenger*
10 GB YouTube*

*Unlimited package සඳහා අදාළ නොවේ.

PEOTV සුවිශේෂී දීමනා

Megaline හෝ Fibre සබඳතා භාවිත කරන ඔබට අලුත් PEOTV සබඳතා ලබාගැනීමේදී සුවිශේෂී මිල අඩුකිරීම්

ආරම්භක සබඳතා ~~ගාස්තුව~~ ~~Rs. 4,990/-~~

Double Play BB to PEOTV Rs. 2,495/-

Single Play to PEOTV Rs. 3,495/-

TRC/SLT/SEA/22/05. රජයේ බදු සහිතයි.

දීමනා කාලය 2022 අප්‍රේල් 01 - 30 දක්වා පමණයි.

ඔබේ සබඳතාව අලුත් කරගන්න,
පිවිසෙන්න www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.